වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2018

வருடாந்த செயலாற்றுகை அறிக்கை 2018

ANNUAL PERFORMANCE REPORT 2018



ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම් අමාත්‍යාංශය

தொகைமதிப்பு மற்றும் புள்ளிவிபரத் திணைக்களம்
பொருளாதார மறுசீரமைப்பு மற்றும் பொது வழங்கல் அமைச்சு

Department of Census and Statistics
Ministry of Economic Reforms and Public Distribution



2018 වර්ෂය සඳහා
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ
කාර්ය සාධන වාර්තාව

අයි.ආර්. බණ්ඩාර
අධ්‍යක්ෂ ජනරාල්

தொகைமதிப்பு புள்ளிவிபரத் திணைக்களத்தின்
2018 ஆம் ஆண்டுக்கான
செயலாற்றுகை அறிக்கை

ஐ. ஆர். பண்டார
பணிப்பாளர் நாயகம்

PERFORMANCE REPORT
OF THE
DEPARTMENT OF CENSUS AND STATISTICS
FOR THE YEAR 2018

I.R. BANDARA

DIRECTOR GENERAL

අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය



ශ්‍රී ලංකාවේ ජාතික සංඛ්‍යාන ආයතනය වන ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීම වන්නේ රජයට සහ වෙනත් දත්ත භාවිතා කරන්නන් හට අවශ්‍ය වන්නා වූ සංඛ්‍යාලේඛන රැස් කිරීම හා ප්‍රචලිත කිරීමයි. මෙරට ප්‍රජා විද්‍යාත්මක, සමාජ ආර්ථික තත්වයන්ගේ විවිධ අංශයන්හි දත්ත රැස් කිරීම සහ සම්පාදනය කිරීමේ වගකීම ඇතුළුව සංඛ්‍යාන සේවයේ අවශ්‍ය වන්නා වූ රාජ්‍ය ආයතන සඳහා ව්‍යක්තීය මට්ටමේ නිලධාරීන් පුහුණු කිරීමේ හා අනුයුක්ත කිරීමේ කටයුතු ද එයට පැවරී ඇත. එයට අමතරව සංඛ්‍යාන කටයුතු සඳහා සහාය අවශ්‍ය ආයතනයන් සඳහා සංඛ්‍යාන උපදේශන සේවාවන් ද එමඟින් ලබා දෙයි.

ගත වූ වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් භාරගත් බොහෝ කාර්යයන් ඉතාමත් සාර්ථක අයුරින් නිම කිරීමට හැකි වීම සතුටට කරුණකි.

ඉකුත් වර්ෂයෙහි ආරම්භ කළ කාර්යයන් තව දුරටත් අඛණ්ඩව ඉදිරියට ගෙන යෑමට බලාපොරොත්තු වන අතරම 2018 වර්ෂයේ ඉලක්කයන් සපුරා ගැනීම සඳහා වගකීමෙන් හා කැපවීමෙන් යුතුව වෙහෙස නොබලා කටයුතු කල දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය වෙත මාගේ අවංක ස්තුතිය පිරිනමමි. එසේම දෙපාර්තමේන්තුවේ ඉලක්කයන් සපුරා ගැනීම සඳහා සහයෝගය දුන් රාජ්‍ය, පෞද්ගලික හා වෙනත් ආයතන වෙත මෙන්ම මහජනතාව වෙතද මාගේ ස්තුතිය පිරිනමමි.

අයි.ආර්.බණ්ඩාර
අධ්‍යක්ෂ ජනරාල්

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
“සංඛ්‍යාන මන්දිරය”
අංක 306/71, පොල්දූව පාර
බත්තරමුල්ල.
2019 මාර්තු

දුරකථන අංකය : +94 11 2147001
ෆැක්ස් : +94 11 2147011
විද්‍යුත් ලිපිනය : dgcensus@statistics.gov.lk
වෙබ් අඩවිය : www.statistics.gov.lk

පටුන

පිටුව

1. හැඳින්වීම..... 01

2. දෙපාර්තමේන්තුව මගින් ඉටුකරනු ලබන කාර්යයන්..... 01

3. දෙපාර්තමේන්තුවේ එක් එක් අංශයන්හි කාර්ය සාධනය..... 02

3.1 ජන සංගණන හා ප්‍රජා විද්‍යා අංශය..... 02
3.2 කර්මාන්ත, ඉදිකිරීම්,වෙළඳ හා සේවා අංශය..... 03
3.3 කෘෂිකර්ම හා පාරිසරික අංශය..... 09
3.4 ජාතික ගිණුම් අංශය..... 13
3.5 ප්‍රකාශන අංශය..... 14
3.6 පුස්තකාල හා ප්‍රලේඛන අංශය..... 16
3.7 නියැදි සමීක්ෂණ අංශය..... 18
3.8 ක්ෂේත්‍ර කළමණාකරණ අංශය..... 22
3.9 පුහුණු අංශය..... 25
3.10 පර්යේෂණ හා විශේෂ අධ්‍යයන අංශය..... 28
3.11 මිල හා වේතන අංශය..... 31
3.12 සිතියම් විද්‍යා අංශය..... 35
3.13 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය..... 36
3.14 දත්ත නිකුත් කිරීමේ ඒකකය..... 38
3.15 මුද්‍රණ අංශය..... 39
3.16 ආයතනික හා ගිණුම් අංශය..... 41
3.16.1 පරිපාලනය..... 41
I. අංශ හා ඒකක..... 41
II. අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල පිහිටි ශාඛා කාර්යාල..... 41
III. දිස්ත්‍රික් කාර්යාල..... 41
IV. පළාත් සභාවල සංඛ්‍යාලේඛන කාර්ය මණ්ඩලය..... 42
v. කාර්ය මණ්ඩලය..... 42
VI. විදේශ සම්මේලන, සම්මන්ත්‍රණ හා වැඩමුළුවලට සහභාගීවීම - 2018..... 44
VII. උසස්වීම්, පත්වීම්, මුදාහැරීම්, ඉල්ලා අස්වීම්, සේවය අතහැරයෑම් හා විශ්‍රාමයෑම් 51
3.16.2 ගිණුම් අංශය..... 53
I. මූල්‍ය වාර්තාව - 2018..... 53
II. ප්‍රසම්පාදන අංශය..... 56
3.17 අභ්‍යන්තර විගණන අංශය..... 57

4.0 අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ස්ථාපිත කර ඇති සංඛ්‍යාලේඛන අංශයන්හි කාර්ය සාධනය 60
4.1 කම්කරු දෙපාර්තමේන්තුව- සංඛ්‍යාලේඛන අංශය..... 60
4.2 අධ්‍යාපන අමාත්‍යාංශය - සංඛ්‍යාලේඛන අංශය..... 61
4.3 ශ්‍රී ලංකා රේගුව - සංඛ්‍යාලේඛන අංශය..... 62
4.4 සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය - සංඛ්‍යාලේඛන අංශය..... 62
4.5 රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව - ජීව සංඛ්‍යාලේඛන අංශය..... 64
4.6 කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය - සංඛ්‍යාලේඛන අංශය..... 65

වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2018

1. හැඳින්වීම

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව රටේ සංවර්ධනය සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා සැලසුම් සකස් කිරීමට අවශ්‍ය දත්ත සැපයීම සඳහා වූ වගකීම් දරණ මධ්‍යම රජයේ ආයතනයක් වේ. තවද, ශිෂ්‍යයන්ගේ සිට ජාත්‍යන්තරය දක්වා දත්ත භාවිතා කරන්නන් ගේ ඉල්ලුම සඳහා වූ පුළුල් පරාසයක දත්ත අවශ්‍යතාව දෙපාර්තමේන්තුව සපුරාලනු ලැබේ. දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සංගණන හා සමීක්ෂණ පදනම්ව ආර්ථිකයේ කෘෂිකර්මය, කර්මාන්ත, වෙළඳාම, ජනගහනය, ජාතික ආදායම හා අනෙකුත් ප්‍රජා විද්‍යාත්මක තොරතුරු කාලීනව රැස් කිරීම තුලින් ඉහත අවශ්‍යතා ඉටු කර දීමට දෙපාර්තමේන්තුව නිරන්තරයෙන් කටයුතු කරයි.

දැක්ම

දේශීය සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා කාලීන තොරතුරු ලබා දීම තුලින් කලාපයේ පෙර ගමන්කරු බවට පත්වීම.

මෙහෙවර

ගෝලීයකරණ පසුබිමක් තුළ සමෘද්ධිමත් ජාතියක් බවට පත්වීම සඳහා නව තාක්ෂණය, සේවක කැපවීම සහ උපායශීලී නායකත්වය තුළින් කාලීන වූත් නිවැරදි වූත් දත්ත ලබා දීම මඟින් වඩාත් ඵලදායී ලෙස දේශයෙහි සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම

2. දෙපාර්තමේන්තුව මගින් ඉටුකරනු ලබන කාර්යයන්

දෙපාර්තමේන්තුව මගින් ඉටුකරනු ලබන කාර්යයන් පුළුල් වශයෙන් පහත දැක්වේ.

2.1 දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සංගණන සහ සමීක්ෂණ

2.2 මෙරට සමාජ ආර්ථික දත්ත එක්රැස් කිරීම සහ සකස් කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව මගින් ඉටු කල අනෙකුත් සංඛ්‍යානමය කටයුතු

2.3 ඇතැම් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ස්ථාපිත කර ඇති සංඛ්‍යාලේඛන ශාඛා කාර්යාල මගින් පවත්වනු ලබන සංගණන, සමීක්ෂණ සහ අනෙකුත් සංඛ්‍යානමය කටයුතු

3. දෙපාර්තමේන්තුවේ එක් එක් අංශයන්හි දායකත්වය හා 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්කවලට අනුකූලව කාර්ය සාධනය පහත පරිදි වේ.

3.1 ජන සංගණන හා ප්‍රජා විද්‍යා අංශය

I. ජන හා නිවාස සංගණනය 2021



ජන හා නිවාස සංගණනය - 2021හි සැලසුම් කටයුතු 2017 වර්ෂයේ දී ආරම්භ කරන ලදි. ඒ අනුව පත් කරන ලද් සංගණන මෙහෙයුම් කමිටුව සහ අනෙකුත් උප කමිටු මගින් පහත සඳහන් කාර්යයන් ඉටු කර ඇත.

* ලැයිස්තුගත කිරීමේ ලේඛනය සහ තොරතුරු රැස් කිරීමේ ප්‍රශ්නාවලිය කෙටුම්පත කර දිස්ත්‍රික්ක කිහිපයක පූර්ව පරීක්ෂාවන් සිදු කිරීම.
* සංගණනය පිළිබඳව දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
* දත්ත භාවිතා කරන්නන් සඳහා වන වැඩමුළුව පැවැත්වීමට අදාල මූලික කටයුතු සිදු කිරීම.
* සංගණන ප්‍රචාරක සැලැස්ම සකස් කිරීම සහ 2019 වර්ෂයට අයත් සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කිරීම.
* සංගණන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම, සංගණන ප්‍රසම්පාදන ඒකකය පිහිටුවීම සහ ප්‍රසම්පාදන අනු කමිටු පත් කිරීම.
* සංගණන කාණ්ඩ පිළිබඳ රෙජිස්ටරයෙහි සැලැස්ම හා ව්‍යුහය සකස් කිරීම.
* සංගණනය සඳහා වන වැය ඇස්තමේන්තුවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම.
* දිස්ත්‍රික්ක 5ක් සඳහා ගම් ලැයිස්තුවල කෙටුම්පත් සැකසීම.

II. සංඛ්‍යාන සාක්ෂරතාවය ඉහළ නැංවීමේ වැඩසටහන් පැවැත්වීම



සංඛ්‍යාන සාක්ෂරතාවය ඉහළ නැංවීමේ වැඩසටහන් 8ක් යටතේ නුවරඑළිය, කළුතර, රත්නපුර සහ හම්බන්තොට දිස්ත්‍රික්ක වල රාජ්‍ය නිලධාරීන් සහ ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය, ආගමන විගමන දෙපාර්තමේන්තුවේ හා සබරගමුව පළාත් සභාවෙහි නිලධාරීන් 1,280 ක් පමණ දැනුවත් කිරීමට හැකි විය.

III. තිරසර සංවර්ධන අභිමතාර්ථ දර්ශකයන් පිළිබඳ වාර්තාව සකස් කිරීම

තිරසර සංවර්ධන අභිමතාර්ථ පිළිබඳ දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම් කර ඇත. එය වෙබ් අඩවියේ පල කර ඇත.


මූල්‍ය කාර්ය සාධනය - 2018

අනු අංකය	ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යයන්	2018 වර්ෂය සඳහා ඇස්තමේන්තු මුදල (රු. මිලි.)	2018/12/31 දක්වා වැයකරන ලද මුදල (රු. මිලි.)
1	සංඛ්‍යාන සාක්ෂරතාවය ඉහළ නැංවීමේ වැඩසටහන	0.8	0.788395

3.2 කර්මාන්ත, ඉදිකිරීම්,වෙළඳ හා සේවා අංශය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ කර්මාන්ත, ඉදිකිරීම්, වෙළඳ හා සේවා අංශය මගින් ආයතන සමීක්ෂණ සිදු කරනු ලබයි.මෙම සමීක්ෂණ වාර්ෂිකව හා කාර්තුමය වශයෙන් පවත්වනු ලබයි. කර්මාන්ත සමීක්ෂණය , ඉදිකිරීම් සමීක්ෂණය, වෙළඳ හා සේවා සමීක්ෂණය වාර්ෂිකව සිදු කරනු ලබයි.දළ දේශීය නිෂ්පාදනය ගණනය කිරීමට අවශ්‍ය ඇස්තමේන්තු ලබාදීම සඳහා කර්මාන්ත ,වෙළඳ හා සේවා සමීක්ෂණ ත්‍රෛමාසිකව සිදු කරනු ලබයි.

මෙම සමීක්ෂණ ක්‍රියාවට නැංවීමේ පියවර පහත පරිදි වේ.



I. වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය

වසර 37 ක ඉතිහාසයකට උරුමකම් කියන මෙම සමීක්ෂණය 1979 වර්ෂයේදී ප්‍රථම වරට වාර්ෂික නිෂ්පාදන කර්මාන්ත සමීක්ෂණය ලෙසින් ආරම්භ කරන ලදී. මෙතෙක් නිෂ්පාදන කර්මාන්ත වලට පමණක් සීමා වූ මෙම සමීක්ෂණය 1983 වර්ෂයේදී වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය ලෙස නව මුහුණුවරකින් ඉදිරිපත් කරන ලදී. එක්සත් ජාතීන්ගේ අන්තර්ජාතික කාර්මික වර්ගීකරණයේ හතර වන සංශෝධනයට අනුව මෙම සමීක්ෂණය මගින් පතල් හා කැනීම්, නිෂ්පාදන, විදුලිය, ගෑස්, වාෂ්ප, සහ වායු සමීකරණ සැපයුම, ජලය එක්රැස් කිරීම, අපද්‍රව්‍ය බැහැර කිරීම, ප්‍රතිකාරක යෙදීම හා සැපයීම යන අංශ ආවරණය කරනු ලබයි.

2016 වාර්ෂික වාර්තාවට අනුව කර්මාන්ත අංශයේ හැසිරීම පහත පරිදි හඳුනා ගත හැකිය

Principal indicators of industrial activity classified by industry sector -2015 (Establishments with 5 or more persons engaged)					
Industry Sector	**No. of establishments**	**Output (Rs.)**	**Intermediate consumptions (Rs.)**	**Value added (Rs.)**	**Gross additions to fixed assets (Rs.)**
B Mining and Quarrying	3,237	26,961,067,640	11,423,150,721	15,537,916,919	2,711,386,591
C Manufacturing	16,939	3,775,490,474,931	2,383,953,004,174	1,391,537,470,758	127,019,838,182
D Electricity, gas, steam and air conditioning supply	156	459,111,147,957	243,691,334,425	215,419,813,532	42,199,842,579
E Water supply, sewerage, waste management and remediation activities	238	45,179,124,435	17,441,515,151	27,737,609,283	5,850,006,952
Total	**20,571**	**4,306,741,814,963**	**2,656,509,004,471**	**1,650,232,810,492**	**177,781,074,305**

වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය 2017/18

දත්ත රැස්කිරීම, ක්ෂේත්‍ර රාජකාරී කටයුතු සිදුකිරීම සිදුකරනු ලැබූ අතර දත්ත සංස්කරණය ,කේත කිරීම, පරිගණක ගතකිරීම, දත්තවල නිවැරදිතාවය පරීක්ෂා කිරීමේ කටයුතුද අවසන් කරනලදී. තවද දෝෂ වාර්තා සකස් කිරීම, බර තැබීම් ගණනය කිරීම, දත්ත වගු ලබා ගැනීම, නිවැරදිතාවය පරීක්ෂා කිරීම වැනි කටයුතුද අවසන් කර අවසන් වාර්තාව සකස් කිරීම සිදුකරමින් පවතී.

වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය 2018/19

මෙම වර්ෂය තුළදී 2018 වාර්ෂික කර්මාන්ත සමීක්ෂණයට අදාලව සමීක්ෂණ කටයුතු සැලසුම් සකස් කිරීම, නියැදි රාමුව යාවත්කාලීන කිරීම, ප්‍රශ්නාවලි සකස් කිරීම, උපදෙස් පත්‍රිකා සකස් කිරීම සිදුකරනු ලැබූ අතර නියැදිය තේරීම, ආයතන සඳහා ප්‍රශ්නාවලි සහ උපදෙස් පත්‍රිකා මුද්‍රණය කිරීම, තැපැල් කිරීම සිදු කරන ලදී. එමෙන්ම 2018 වර්ෂය තුළදී දත්ත රැස්කිරීමේ කටයුතු ආරම්භ කරනු ලැබූ අතර ක්ෂේත්‍ර රාජකාරී කටයුතු වල පළමු කොටස අවසන් කරන ලදී. එමෙන්ම දත්ත සංස්කරණ කටයුතු සහ කේත කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

II. වාර්ෂික වෙළඳ හා සේවා සමීක්ෂණය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මඟින් 2016 වර්ෂයේදී පළමු වාර්ෂික වෙළඳ හා සේවා සමීක්ෂණය සිදු කරන ලදී. දළ ජාතික නිෂ්පාදිතයට විශාල දායකත්වයක් ලබාදෙන වෙළඳ හා සේවා අංශයේ හැසිරීම පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම මෙහි මූලික අරමුණයි. ඒ අනුව එම අංශයට අදාලව ආදායම, වියදම, සේවා නියුක්තිය, වැටුප් හා වෙතන සහ ස්ථාවර වත්කම් පිළිබඳ දත්ත රැස් කරනු ලබයි.

2016 වාර්ෂික වෙළඳ හා සේවා සමීක්ෂණයට අනුව ආර්ථිකය තුළ වෙළඳ හා සේවා අංශවල හැසිරීම පහත පරිදි හඳුනා ගත හැකිය.

No	Indicator	Unit	Total	Trade	Services
01	Number of establishments	Number	50,108	21,248	28,860
02	Number of person engaged	Number	879,900	251,537	628,363
03	Salaries and Wages	Rs.Mn	363,561	100,478	263,083
04	Output	Rs.Mn	2,104,625	849,718	1,254,907
05	Intermediate consumption	Rs.Mn	726,881	194,726	532,155
06	Value added	Rs.Mn	1,377,744	654,992	722,752
07	Annual salary per person engaged	Rs.	413,185	399,459	418,680
08	Annual output per person engaged	Rs.	2,391,892	3,378,105	1,997,105
09	Annual value added per person engaged	Rs.	1,565,796	2,603,959	1,150,214

වාර්ෂික වෙළඳ හා සේවා සමීක්ෂණය 2017/18

දත්ත රැස්කිරීම, ක්ෂේත්‍ර රාජකාරී කටයුතු සිදුකිරීම සිදුකරනු ලැබූ අතර දත්ත සංස්කරණය ,කේත කිරීම, පරිගණක ගතකිරීම, දත්තවල නිවැරදිතාවය පරීක්ෂා කිරීමේ කටයුතුද අවසන් කරනලදී. එමෙන්ම ප්‍රතිචාර නොදැක්වූ ආයතන වෙත සිහි කැඳවීම් ලිපි තැපැල් කිරීමද සිදු කරන ලදී. තවද දෝෂ වාර්තා සකස් කිරීම, බර තැබීම් ගණනය කිරීම, දත්ත වගු ලබා ගැනීම, නිවැරදිතාවය පරීක්ෂා කිරීම වැනි කටයුතුද අවසන් කර අවසන් වාර්තාව සකස් කිරීම සිදුකරමින් පවතී.


වාර්ෂික වෙළඳ හා සේවා සමීක්ෂණය 2018/19

2018 වර්ෂය තුළදී දත්ත රැස්කිරීමේ කටයුතු ආරම්භ කරනු ලැබූ අතර ක්ෂේත්‍ර රාජකාරී කටයුතු වල පළමු කොටස අවසන් කරන ලදී. එමෙන්ම දත්ත සංස්කරණ කටයුතු සහ කේත කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

III. වාර්ෂික ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය

ඉදිකිරීම් කර්මාන්ත පුහුණු සංවර්ධන ආයතනයේ ඉල්ලීමකට අනුව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පළමු ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය 1993 දී පවත්වන ලදී. ඉදිකිරීම් කර්මාන්ත ක්ෂේත්‍රයේ උපනතීන් හඳුනා ගැනීම හා යෙදවුම් හා නිමවුම පිළිබඳ දත්ත ලබා ගැනීම මෙහි අරමුණු වේ.

2016 වාර්ෂික ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණයට අනුව පහත උපනතීන් හඳුනා ගත හැකිය



වාර්ෂික ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය 2017/18

දත්ත රැස්කිරීම, ක්ෂේත්‍ර රාජකාරී කටයුතු සිදුකිරීම සිදුකරනු ලැබූ අතර දත්ත සංස්කරණය ,කේත කිරීම, පරිගණක ගතකිරීම, දත්තවල නිවැරදිතාවය පරික්ෂා කිරීමේ කටයුතුද අවසන් කරනලදී. එමෙන්ම ප්‍රතිචාර නොදැක්වූ ආයතන වෙත සිහි කැඳවීම් ලිපි තැපැල් කිරීමද සිදු කරන ලදී. තවද දෝෂ වාර්තා සකස් කිරීම, බර තැබීම් ගණනය කිරීම, දත්ත වගු ලබා ගැනීම, නිවැරදිතාවය පරික්ෂා කිරීම වැනි කටයුතුද අවසන් කර අවසන් වාර්තාව සකස් කිරීම සිදුකරමින් පවතී.

වාර්ෂික ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය 2018/19

මෙම වර්ෂය තුළදී ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය 2018 ට අදාලව සමීක්ෂණ කටයුතු සැලසුම් සකස් කිරීම**,** නියැදි රාමුව යාවත්කාලීන කිරීම**,** ප්‍රශ්නාවලි සකස් කිරීම, උපදෙස් පත්‍රිකා සකස් කිරීම සිදුකරනු ලැබූ අතර නියැදිය තේරීම, ආයතන සඳහා ප්‍රශ්නාවලි සහ උපදෙස් පත්‍රිකා මුද්‍රණය කිරීම, තැපැල් කිරීම සිදු කරන ලදී. එමෙන්ම දත්ත සංස්කරණ කටයුතු සහ කේත කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

IV. කාර්මික නිෂ්පාදන පිළිබඳ ත්‍රෛමාසික සමීක්ෂණය



රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා අවශ්‍ය තත්කාලීන සංඛ්‍යාතීන් ලබා ගැනීම, කාර්මික නිෂ්පාදන පිළිබඳ උපනතින් හඳුනා ගැනීම සහ කර්මාන්ත අංශයේ දළ දේශීය නිෂ්පාදනය ගණනය කිරීම යන අරමුණු පෙරදැරි කරගෙන ත්‍රෛමාසික කර්මාන්ත නිෂ්පාදන පිළිබඳ සමීක්ෂණය පවත්වනු ලබයි.

මෙම වර්ෂයේදී මෙම සමීක්ෂණය යටතේ 2017 වර්ෂයේ අවසන් කාර්තුවට සහ 2018 වර්ෂයේ පළමු, දෙවන සහ තුන්වන කාර්තු වලට අදාලව ප්‍රශ්නාවලි සකස් කිරීම, දිස්ත්‍රික් කාර්යාල වෙත යැවීම දත්ත රැස් කිරීම, කේත කිරීම, පරිගණක ගත කිරීම, දත්ත වගුගත කර ඇස්තමේන්තු අගයන් ගණනය කිරීම වැනි කටයුතු සාර්තකව නියමිත දිනයන්හිදී සිදුකර ඇත.

V. ත්‍රෛමාසික වෙළඳ හා සේවා සමීක්ෂණය

ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 60% කට වැඩි ප්‍රතිශතයක් වෙළඳ හා සේවා අංශය මඟින් නියෝජනය වේ. මෙම නිසා රටෙහි අවශ්‍යතාවය අනුව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මඟින් ප්‍රථම වරට 2018 වර්ෂයේදී වෙළඳ හා සේවා අංශය නියෝජනය වන පරිදි ත්‍රෛමාසික වෙළඳ හා සේවා සමීක්ෂණය ආරම්භ කරන ලදී.

දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේදී මෙතෙක් යොදාගනු ලැබූ 2010 පදනම් වර්ෂය වෙනුවට නව පදනම් වර්ෂය ලෙස 2015 වර්ෂය යොදා ගැනීම මෙහි ප්‍රධාන අරමුණ වේ. මීට අමතරව දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේදී වෙළඳ හා සේවා අංශයේ දායකත්වය හඳුනාගැනීම, රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා අවශ්‍ය තත්කාලීන සංඛ්‍යාතීන් ලබා ගැනීම සහ වෙළඳ හා සේවා අංශයේ උපනතීන් හඳුනා ගැනීමද මෙහිලා වැදගත්වේ.

ත්‍රෛමාසික වෙළඳ හා සේවා සමීක්ෂණය තුළින් පහත අංශ ආවරණය කරනු ලැබේ.


- තොග සහ සිල්ලර වෙළඳාම
- ප්‍රවාහනය සහ ගබඩා කිරීම්
- නවාතැන් පහසුකම් සැපයීම
- ආහාර සහ බීම සැපයීම්
- දේපල වෙළඳාම්
- වෘත්තීය සේවා
- පෞද්ගලික අධ්‍යාපනය
- පෞද්ගලික මහජන සෞඛ්‍යය සේවා
- නේවාසික සුරැකුම් සේවා සහ සමාජ කටයුතු
- අනෙකුත් පෞද්ගලික සේවා



2018 වර්ෂය තුලදී 2017 වර්ෂයේ අවසන් කාර්තුවට අදාලව සහ 2018 වර්ෂයේ පළමු, දෙවන සහ තුන්වන කාර්තු වලට අදාලව ප්‍රශ්නාවලි සකස් කිරීම, මුද්‍රණය කිරීම, තැපැල් කිරීම, දත්ත රැස් කිරීම, ක්ෙත කිරීම, පරිගණක ගත කිරීම වැනි කටයුතු සිදුකර ඇත.

VI. කාර්මික නිෂ්පාදන දර්ශකය

කර්මාන්ත අංශයේ කෙටිකාලින වෙනස්කම් හඳුනා ගැනීමට සහ ආර්ථිකයේ කර්මාන්ත අංශයේ ස්වරූපය හඳුනාගැනීමේ අරමුණින් කාර්මික නිෂ්පාදන දර්ශකය ගණනය කරනු ලබයි. 2015 වර්ෂය පදනම් වර්ෂය ලෙස යොදාගනිමින් ආරම්භ කරන ලද මෙම කාර්මික නිෂ්පාදන දර්ශකය 2016 වර්ෂයේදී කාර්තු වශයෙන් ගණනය කරන ලදී. අප දෙපාරතමේන්තුව ලත් ජයග්‍රහනයක් ලෙස 2017 වර්ෂයේ සිට මෙම දර්ෂකය මාසිකව ගණනය කිරීම ආරම්භ කරන ලදී. ඒ අනුව මාසය අවසන් වී දින 42ක් ඇතුලත මෙම දර්ශකය ප්‍රකාශයට පත් කිරීම සිදුවේ. මීට අමතරව මෙමඟින් සෑම කාර්තුවකට වරක් දත්ත විවරණ පත්‍රිකාවක් නිකුත් කරනු ලැබේ.



මෙම වර්ෂය තුලදී 2017 වර්ෂයේ නොවැම්බර් මාසයේ සිට 2018 වර්ෂයේ ඔක්තොම්බර් මාසය දක්වා දර්ශක නිකුත් කර ඇති අතර එය මෙම ප්‍රස්ථාරය මඟින් නිරූපනය කරනු ලැබේ.

ප්‍රාථමික දත්ත සහ ද්විතීක දත්ත යොදාගෙන මෙම දර්ශකය ගණනය කරනු ලබයි. මෙම අංශයේ නිලධාරීන් විසින් දරන ලද උත්සාහයේ ප්‍රතිපලයක් වශයෙන් 2018 වර්ෂයේදී 80% කට වඩා ඉහල ප්‍රතිචාර මට්ටමක් සෑම මාසයකම ලබා ගැනීමට සමත් වී ඇත. මෙම සමීක්ෂණයේ දත්ත රැස්කිරීම, පරිගණක ගත කිරීම, දර්ෂකය ගණනය කිරීම වැනි කටයුතු මෙම වර්ෂය තුළදී නියමිත කාලවකවානු වලදී සිදුකර ඇත.

VII. සංඛ්‍යානමය ව්‍යාපාර නාමාවලිය



රටක ආර්ථික සංඛ්‍යාති සකස් කිරීමේදී සංඛ්‍යානමය ව්‍යාපාර නාමාවලිය මඟින් ඉමහත් මෙහෙයක් ඉටුකරනු ලබයි. යම් රටක ආර්ථික බලප්‍රදේශය තුල පිහිටා ඇති පුළුල් පරාසයක් පුරා විහිදී ඇති විවිධ ආර්ථික කටයුතුවල නියුක්ත ආයතන පිළිබඳව තොරතුරු එහි ඇතුලත්වේ. ශ්‍රී ලංකාව සඳහා සංඛ්‍යානමය ව්‍යාපාර නාමාවලිය ආර්ථික සංගණනයේ ලැයිස්තුගත කිරීමේ අදියරේදී ලබා ගත් දත්ත අනුව ජනලේඛන සංඛයාලේඛන දෙපාර්තමේන්තුව මඟින් සකස් කරන ලදී.

නමුත් රටක තත්කාලීනව වඩාත් නිවැරදිව ආර්ථික සංඛ්‍යාති ලබා ගැනීම පිණිස මෙම නාමාවලිය නිරතුරුවම යාවත්කාලීන කලයුතු වේ. අප රටෙහි ව්‍යාපාර ආයතන සම්බන්ධ යාවත්කාලීන තොරතුරු ලබාගත හැකි ප්‍රමුඛ ආයතනයන් වන සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව සහ දේශිය ආදායම් දෙපාර්තමේන්තුව හරහා එම තොරතුරු ලබා ගැනීමට අප දෙපාර්තමේන්තුව උත්සාහ කලද එම ආයතන වල බලපවත්වන පනත් අනුව අවශ්‍ය තොරතුරු ලබාගත නොහැකි විය.එයට විකල්පයක් වශයෙන් පළාත් පාලන ආයතන වෙතින් ගෙන්වාගනු ලබන දත්ත සහ වාර්ෂික හා ත්‍රෛමාසික සමීක්ෂණ මගින් ලැබෙන දත්ත හරහා සංඛ්‍යානමය ව්‍යාපාර නාමාවලිය යාවත්කාලීන කරනු ලැබේ.

ඒ අනුව 2018 වර්ෂය තුළදී සංඛ්‍යානමය ව්‍යාපාර නාමාවලි තොරතුරු පද්ධතිය (SBR) සඳහා දත්ත ලබාගැනීමේ ක්‍රමවේදය පිළිබඳව වයඹ පළාතේ පළාත් පාලන ආයතනවල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ව්‍යාපාර නාමාවලිය සම්බන්ධ කටයුතු කරන නිලධාරීන් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත කර ඇති දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් 2018/03/19 වන දින වාරියපොල වයඹ සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත් විණි.

එමෙන්ම දකුණු පළාතට අදාල ව්‍යාපාර නාමාවලිය සම්බන්ධ කටයුතු කරන නිලධාරීන් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත කර ඇති දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් 2018/03/21 වන දින ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පැවැත් විණි.

සංඛ්‍යානමය ව්‍යාපාර නාමාවලි තොරතුරු පද්ධතිය (SBR) භාවිතයෙන් දත්ත සංස්කරණය හා අවශ්‍ය වාර්තා ලබා ගැනීම සම්බන්ධ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේදී පැවැත්විය. මේවන විට ශ්‍රී ලංකා සම්මත කර්මාන්ත වර්ගීකරණය අනුව පළාත් පාලන ආයතන වලින් ලබාගත් තොරතුරු කේත කිරීම සිදු කර සංඛ්‍යානමය ව්‍යාපාර නාමාවලිය යාවත් කාලීන කිරීම සිදු කරමින් පවතී

මූල්‍ය කාර්ය සාධනය - 2018

අනු අංකය	ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යයන්	2018 වර්ෂය සඳහා ඇස්තමේන්තු මුදල (රු. මිලි.)	2018/12/31 දක්වා වැයකරන ලද මුදල (රු. මිලි.)
1	වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය - **2017**	0.320	0.320
2	වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය - **2018**	1.000	1.000
3	වාර්ෂික වෙළඳ සමීක්ෂණය - **2017**	0.500	0.188
4	වාර්ෂික සේවා සමීක්ෂණය - **2017**		0.313
5	වාර්ෂික වෙළඳ සමීක්ෂණය - **2018**	0.710	0.188
6	වාර්ෂික සේවා සමීක්ෂණය - **2018**		0.313
7	ත්‍රෛමාසික වෙළඳ සහ සේවා සමීක්ෂණය - **2018**		0.307
8	වාර්ෂික ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය - **2017**	0.080	0.080
9	වාර්ෂික ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය - **2018**	0.400	0.303
10	ත්‍රෛමාසික කාර්මික නිෂ්පාදන පිළිබඳ සමීක්ෂණය 2017	0.025	0.025
11	ත්‍රෛමාසික කාර්මික නිෂ්පාදන පිළිබඳ සමීක්ෂණය 2018	0.075	0.075
12	මාසික කර්මාන්ත නිෂ්පාදන දර්ශකය	0.090	0.090
13	ව්‍යාපාර නාමාවලිය (**SBR**)	0.800	0.070


3.3 කෘෂිකර්ම හා පාරිසරික අංශය

I. වී අස්වැන්න ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණය

2017/2018 මහ කන්නය හා 2018 යල කන්නය සඳහා වී වගා කරන ලද බිම් ප්‍රමාණය, සාමාන්‍ය අස්වැන්න සහ මුළු නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීම මෙ මගින් සිදු කරන ලදී. මෙහිදී ජාතික මට්ටමින් හා දිස්ත්‍රික් මට්ටමින් එක් එක් කන්නය තුළ වගා කරන ලද සහ අස්වැන්න නෙලා ගත් බිම් ප්‍රමාණයන් ගණනය කිරීම සහ සාමාන්‍ය අස්වැන්න සහ මුළු නිෂ්පාදනය ඇස්තමෙන්තු කිරීම සඳහා මෙම සමීක්ෂණ පවත්වන්නට යෙදුනි.

ඉහත සමීක්ෂණයට සමගාමීව වී වගාව පිළිබඳ උපාශ්‍රිත තොරතුරු වන එක් එක් වී වර්ග අනුව වගා කොට ඇති බිම් ප්‍රමාණයන් , බිම් සකස් කරන ලද ආකාරය, පොහොර භාවිතය, වල්නාශක භාවිතය වැනි විචල්‍යයන් පිලිබඳ දත්තයන්ද එක් රැස් කරන ලදී.

වී අස්වැන්න ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණයෙන් ලබා ගත් දත්ත විග්‍රහ කොට 2017/2018 මහ සහ 2018 යල කන්න සඳහා දිස්ත්‍රික් මට්ටමින් ඇස්තමේන්තු ප්‍රකාශයට පත් කරන ලදී. එමෙන්ම, මහවැලි බල ප්‍රදේශ වල කුඩා කළමනාකරණ කොට්ඨාශ මට්ටමින්ද ඉහත දක්වන ලද සංඛ්‍යාතීන් පිළියෙල කර වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී. මෙම සමීක්ෂණය භාවිතයෙන් ඇස්තමේන්තු කළ ශ්‍රී ලංකාවේ වී නිශ්පාදනයෙහි විචලනය පහත රූපයෙන් දක්වා ඇත.



ගොඩ ගොවිතැන් සංඛ්‍යාලේඛන රැස් කිරීම (මහ/යල)-2018

කන්න මට්ටමින් මූලික දත්ත වාර්තාකරුවන්ගේ සහාය ඇතිව එක්රැස් කරනු ලබන උස්බිම්වල වගාකරන භෝගවල බිම් ප්‍රමාණය, නිෂ්පාදනයට අදාලව වාර්ෂිකව රැස් කරනු ලබන සංඛ්‍යාතීන් ද සංරාංශගත කර රජයේ ප්‍රතිපත්ති සම්පාදකයින් හා අනෙකුත් ආයතනවලට දත්ත ලබාදීමට කටයුතු කළ අතර එම දත්ත වෙබ් අඩවියටද ඇතුලත් කරන ලදී.


මෙහිදී. ස්ථිර භෝග සහ කාලීන භෝග යටතේ සුළු අපනයන බෝග, පළතුරු, .එලවළු, ධාන්‍ය වර්ග හා රනිල භෝග ඇතුළුව භෝග වර්ග 60 ක් පමණ ආවරණය වන පරිදි වගා කරන ලද බිම් ප්‍රමාණය සහ නිෂ්පාදනය 2017/2018 මහ සහ 2018 යල කන්න සඳහා ඇස්තමේන්තු කර වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරනු ලැබිය.

II. පශුධන සම්පත් පිළිබඳ සංඛ්‍යාලේඛන රැස් කිරීම- 2018

2018 වර්ෂයේ දී සත්ත්ව සංඛ්‍යාති වල ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම සඳහා සතුන් ඇති කරනු ලැබූ සියලුම නිවාස ඒකක , රජයේ හා පෞද්ගලික ගොවිපලවල් ආදියට ගොස් තොරතුරු රැස් කරන ලදී. මෙමගින් ඇති කරනු ලැබූ එළ හරක්, මී හරක්, එළුවන්, බැටළුවන්, ඌරන්, කුකුළන්, තාරාවන්, කළුකුන් හා වටුවන් ආදී සතුන් පිළිබඳ තොරතුරු හා සත්ව සංඛ්‍යාව ද එළ කිරි, මී කිරි හා බිත්තර නිෂ්පාදනය පිළිබඳ තොරතුරු ද ග්‍රා. නි. කොට්ඨාශ මට්ටමින් එක් රැස් කරන ලදී.

එක් රැස් කරනු ලැබූ එම තොරතුරු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් හා දිස්ත්‍රික්ක මට්ටමින් පිළියෙල කොට, 2018 වර්ෂය සඳහා ඉහත සඳහන් එක් එක් සත්ත්ව ගහණය ද කිරි හා බිත්තර නිෂ්පාදනය පිළිබඳ ඇස්තමේන්තු ද පිළියෙල කිරීමට කටයුතු යොදන ලදී. ඒ අනුව මෙම සංඛ්‍යාතීන් වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරනු ලැබීය.

ශ්‍රී ලංකාවේ පශුධන සම්පත් පිළිබඳ සංඛ්‍යාලේඛන 2018



III. තේ, රබර් සහ පොල් නිෂ්පාදන වියදම් සමීක්ෂණය- 2017/2018

2017/2018 වර්ෂ සඳහා තේ, රබර් සහ පොල් යන ප්‍රධාන භෝගයන්ගේ නිෂ්පාදන වියදම් ගණනය කිරීමේ කටයුතු අවසන් කරන ලදී. තේ කිලෝග්‍රෑමයක නිෂ්පාදන වියදම ගණනය කිරීමට අදාල විස්තරාත්මක තොරතුරු ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ, තේ කොමසාරිස් අංශයේ සහාය ඇතිව එම කාර්යාලයේහි ලියාපදිංචි තේ කම්හල් වලින් එක් රැස් කරන ලදී. රබර් නිෂ්පාදන වියදම් ගණනය කිරීමේදී රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව පවත්වනු ලබන සමීක්ෂණය පදනම් කර ගනු ලැබීය. පොල් නිෂ්පාදන වියදම් ගණනය කිරීමේදී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින්පවත්වනු ලබන පොල් නිෂ්පාදන වියදම් සමීක්ෂණය පදනම් කර ගනු ලැබීය මෙම සමීක්ෂණ මගින් ලබා ගන්නා දත්ත මගින් 2017/2018 වගා වර්ෂය සඳහා තේ, රබර් සහ පොල් වල නිෂ්පාදන වියදම් ගණනය කර වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.

IV. අර්තාපල් නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණය -2018

අර්තාපල් වගා කරනු ලබන බිම් ප්‍රමාණය හා අපේක්ෂිත නිෂ්පාදනයන් මාසිකව පුරෝකථනය කිරීම ප්‍රධාන අරමුණ කොටගත් මෙම සමීක්ෂණය 2018 වසර තුලදී නුවරඑළිය හා බදුල්ල දිස්ත්‍රික්ක වල ප්‍රා.ලේ. කොට්ඨාස මට්ටමින් පහත සඳහන් අයුරින් සිදු කරන ලදී.

මෙම සමීක්ෂණය 2018 වර්ෂය තුල නුවරඑළිය දිස්ත්‍රික්කයෙහි අදියර තුනකින් ඉටුකරන ලද අතර, බදුල්ල දිස්ත්‍රික්කයෙහි අදියර දෙකකින් ඉටුකරන ලදී. එහි ක්ෂේත්‍ර කටයුතු ජනවාරි / පෙබරවාරි, අප්‍රේල් / මැයි හා අගෝස්තු / සැප්තැම්බර් කාල වලදී සිදු කරනු ලැබීය.

එම සමීක්ෂණ ප්‍රතිඵල අනුව 2018 වර්ෂය සඳහා අර්තාපල් වගා කරනු ලබන බිම් ප්‍රමාණය හා අපේක්ෂිත නිෂ්පාදනයන් මාසිකව පුරෝකථනය කර වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.

v. ලොකු ඵෑණු නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීමේ විශේෂ සමීක්ෂණය - 2018

ලොකු ඵෑණු වගා කරන ගොවීන් සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය අනුව අපේක්ෂිත නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීමේ අරමුණින් යුතුව 2018 වසරේදී ද මෙම සමීක්ෂණය අනුරාධපුරය, පොළොන්නරුව, මාතලේ යන දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් හා මහවැලි 'එච්' කලාපය තුළ ඒකක කළමනාකරණ කොට්ඨාස මට්ටමින් සිදු කරන ලදී.

ලොකු ඵෑණු නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීමෙහිලා පවත්වන මෙම සමීක්ෂණය යල කන්නය සඳහා සිදුකරන බැවින් එහි ක්ෂේත්‍ර කටයුතු 2018 වර්ෂය තුළ අගෝස්තු / සැප්තැම්බර් කාල වකවානුවේදි සිදු කරන ලදී.

එම සමීක්ෂණ ප්‍රතිඵල අනුව 2018 වර්ෂය සඳහා ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් හා මහවැලි 'එච්' කලාපය තුළ ඒකක කළමනාකරණ කොට්ඨාස මට්ටමින්, ලොකු ඵෑණු වගා කරන බිම් ප්‍රමාණය හා අපේක්ෂිත නිෂ්පාදනය ඇතුලත් අවසන් වාර්තාව සකස් කර වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.

vi. ආහාර ශේෂ පත්‍රය

වාර්ෂිකව පිළියෙල කරනු ලබන ආහාර ශේෂ පත්‍රය මගින් ඒක පුද්ගල ආහාර සැපයුම පෙන්නුම් කරන අතර එමගින් රටේ පවතින පෝෂණ තත්ත්වය ජාතික මට්ටමින් පිළිබිඹු වේ. 2017 වර්ෂයේ කෘෂිකාර්මික නිෂ්පාදන සැලකිල්ලට ගෙන 2017 වර්ෂයේ ඒක පුද්ගල ආහාර සැපයුම පිළිබඳ ඇස්තමේන්තු පිලියෙල කර දෙපාර්තුමේන්තු වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.

vii. ආර්ථික සංගණනය (කෘෂිකර්ම අංශයේ ගණන් ගැනීම)

ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ඇති ව්‍යුහාත්මක වෙනස්කම් හඳුනාගැනීමට ආර්ථික සංගණනය යටතේ කෘෂිකර්ම අංශයේ තොරතුරු රැස් කිරීම සිදුකරන ලදී. ඒ අනුව කෘෂිකර්ම අංශයේ තොරතුරු රැස් කිරීම යටතේ කෘෂිකර්මාන්තයට අදාළ සියලුම ඒකක පිළිබඳ විස්තරාත්මක තොරතුරු රැස් කරන ලදී. ඒ අනුව සියලුම වතු හා කුඩා ගොවි කාණ්ඩ ආවරණය කරමින් ගොවි කාරකයින්, ගොවි කාරකයාගේ ගෘහ කාණ්ඩය, ඉඩම් භාවිතය හා භුක්තිය, ඒ ඒ බෝග යටතේ වගා කොට ඇති බිම් ප්‍රමාණ, මිරිදිය/කිවුල්දිය/කරදිය මත්ස්‍ය වගාව, ආදී විෂයයන්ට අදාල තොරතුරු රැස් කරන ලදී.

මෙම සංගණනයේදී රැස් කළ තොරතුරු භාවිතයෙන් සියලුම දිස්ත්‍රික්ක සඳහා වාර්තා පිළියෙල කර වෙබ්අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී. එමෙන්ම රැස්කර ගන්නා තොරතුරු භාවිතයෙන් අවසන් වාර්තාව ප්‍රකාශයට පත් කරන ලදී. මෙම වාර්තාව මගින් ගොවි කාණ්ඩ සංඛ්‍යාව, ගොවි කාරකයින් සංඛ්‍යාව, එක් එක් බෝග වගාව යටතේ ඇති බිම් ප්‍රමාණය, කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ භාවිතය, සත්ව පාලනය, මිරිදිය/කිවුල්දිය/කරදිය මත්ස්‍ය වගාව ආදි විෂයයන්ට අදාල සංඛ්‍යාති ප්‍රකාශයට පත් කරනු ලැබිය.

viii. කෘෂිකර්ම නිෂ්පාදන සමීක්ෂණය-2017/18

කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ව්‍යුහාත්මක තත්ත්වය පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා මෙම සමීක්ෂණය සිදු කරනු ලැබිය. ඒ අනුව කෘෂිකර්ම අංශයේ ගෘහ ඒකක වල ප්‍රජා විද්‍යාත්මක තොරතුරු, ඉඩම් භාවිතය, වගා ව්‍යුහය, සත්ත්ව පාලනය, බෝග වගාව, වන වගාව, කෘෂිකාර්මික යෙදවුම්, නිෂ්පාදන වියදම හා තොග පවත්වා ගැනීම ආදී තොරතුරු රැස් කිරීමට මෙම සමීක්ෂණය සැලසුම් කරන ලදී. ඒ අනුව සමීක්ෂණයේ දෙවන අදියරෙහි උපලේඛනය පිළියෙල කිරීම, පූර්ව හා නියමු සමීක්ෂණ පැවැත්වීම, ගණන් ගන්නා නිලධාරීන්ගේ පුහුණුව පැවැත්වීම දෙවන අදියරෙහි තොරතුරු රැස් කිරීම, දත්ත වගු පිළියෙල කිරීම ආදිය සිදු කරන ලදී.

මූල්‍ය කාර්ය සාධනය - 2018

අනු අංකය	ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යයන්	2018 වර්ෂය සඳහා ඇස්තමේන්තු මුදල (රු.මිලියන)	2018/12/31 දක්වා වැය කරන ලද මුදල (රු. මිලියන)
1	වී අස්වැන්න ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණය (මහ)-2018	3.55	2.40
2	වී අස්වැන්න ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණය (යල)-2018	2.45	1.70
3	ගොඩගොවිතැන් සංඛ්‍යාලේඛන රැස් කිරීම (මහ/යල)-2018	-	-
4	පශුධන සම්පත් පිළිබඳ සංඛ්‍යාලේඛන රැස් කිරීම	-	-
5	තේ, රබර්, පොල් නිෂ්පාදන වියදම් සමීක්ෂණය 2017/18	-	-
6	අල නිෂ්පාදන සමීක්ෂණය -2018	0.03	0.03
7	ලොකුළූණු නිෂ්පාදන සමීක්ෂණය - 2018	0.10	0.10
8	ආහාර ශේෂ පත්‍රය	-	-
9	කෘෂිකර්ම නිෂ්පාදන සමීක්ෂණය	3.87	2.70

3.4 ජාතික ගිණුම් අංශය

ශ්‍රී ලංකාව සඳහා වාර්ෂික සහ කාර්තුමය වශයෙන් ජාතික ගිණුම් සකස් කිරීම ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීමකි. ඒ අනුව 2017 වර්ෂය සඳහා වාර්ෂික ජාතික ගිණුම් ඇස්තමේන්තු, නිෂ්පාදන වියදම් සහ ආදායම් යන ප්‍රවේශයන් තුනම යටතේද කාර්තුමය ජාතික ගිණුම් ඇස්තමේන්තු 2017 සිව්වැනි, 2018 පළවැනි, දෙවැනි සහ තෙවැනි කාර්තු සඳහා නිෂ්පාදන සහ වියදම් යන ප්‍රවේශයන් දෙක යටතේ ද සකස් කරන ලදී.

ජාතික ගිණුම් සංශෝධන ප්‍රතිපත්තියට යටත්ව 2015 සහ 2016 වර්ෂයන් හි ප්‍රකාශයට පත් කරන ලද ජාතික ගිණුම් ඇස්තමේන්තු සඳහා, පිලිවෙලින් අවසාන සහ පලවන සංශෝධනයන් ද සිදු කරන ලදී. මෙම සියලු ඇස්තමේන්තු වලට අදාළ දත්ත වගු, මාධ්‍ය සටහන් සහ විස්තරාත්මක වාර්තා නියමිත කාලවකවානු තුලදී දෙපාර්තමේන්තු වෙබ් අඩවිය තුල පල කරන ලදී.

එසේම දේශීය සහ විදේශීය දත්ත භාවිතා කරන්නන්ගේ ඉල්ලීම් පරිදි අදාළ ජාතික ගිණුම් දත්ත නිකුත් කරන ලදී.

ජාතික ගිණුම් සකස් කිරීමේ පාද වර්ෂය 2010 සිට 2015 දක්වා ඉදිරියට ගෙන ඒමේ කාර්යාවලිය සඳහා අවශ්‍ය වන ‘සැපයුම් සහ භාවිත වගු - 2015’ සැදීම ආරම්භ කරන ලදී.

ඊට සමගාමීව ජාතික ගිණුම් දත්ත වැඩි දියුණු කිරීම සඳහා කෘෂිකර්මාන්ත සහ කර්මාන්ත අංශ වලට අදාළව සිද්ධි අධ්‍යයන කටයුතු සිදුකල අතර සේවා ආර්ථික කටයුතු සඳහා වඩා නිවැරදි කාර්තුමය තොරතුරු ලබා ගැනීම පිණිස කාර්තුමය සමීක්ෂණ 10ක් සිදු කිරීමට අදාළ ප්‍රශ්නාවලින් කර්මාන්ත අංශය වෙත ලබා දෙන ලදී. මෙම තොරතුරු හා ආර්ථික සංගණන (2013/14)තොරතුරු මෙම කාර්යය නිම කිරීම සඳහා යොදා ගැනීමට නියමිතය.

එසේම මෙම පාද වර්ෂය ඉදිරියට ගෙන ඒමේ කාර්යය සඳහා අන්තර් ජාතික මුල්‍ය අරමුදලේ උපදේශකයන්ගේ විශේෂඥ උපදෙස් සේවාවක්ද ලබා ගන්නා ලදී.

මූල්‍ය කාර්ය සාධනය - 2018

අනු අංකය	ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යයන්	**2018** වර්ෂය සඳහා ඇස්තමේන්තු මුදල (රු.මිලියන)	**2018/12/31** දක්වා වැය කරන ලද මුදල (රු. මිලියන)
01	ජාතික ගිණුම් වැඩි දියුණු කිරීම සඳහා සිද්ධි අධ්‍යයනය කටයුතු	0.3	0.289
02	ජාතික ගිණුම් වාර්ෂික වාර්තාවන්	0.3	-

3.5 ප්‍රකාශන අංශය

දෙපාර්තමේන්තුවේ ඉදිරි වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම, වාර්ෂික කාර්ය සාධන වාර්තාව, සංඛ්‍යාන නිබන්ධනය, සංඛ්‍යාන අත්පොත (ඉංග්‍රීසි, සිංහල / දෙමළ), පලාත් පාලන සංඛ්‍යාති , සංඛ්‍යාන දත්ත පත්‍රිකාව, ශ්‍රී ලංකාවේ ආර්ථික සංඛ්‍යාති, News Letter පිළියෙල කොට ඉදිරිපත් කිරීම හා දෙපාර්තමේන්තුවේ සියළුම ප්‍රකාශන බෙදා හැරීම ප්‍රකාශන අංශයේ මූලික කාර්යයන් වේ.

I. සංඛ්‍යාන නිබන්ධනය - 2018

ශ්‍රී ලංකාවේ වැදගත් ක්ෂෙත්‍ර ගණනාවක දත්තයන් වසර කිහිපයක ශ්‍රේණියක් ලෙස ඇතුලත් කොට සකස් කරනු ලබන සංඛ්‍යාන නිබන්ධන 2018 පිළියෙල කොට නියමිත පරිදි වෙබ් අඩවියට ඇතුලත් කරනු ලැබූ අතර එය මුද්‍රණය කිරීම සඳහා සියළු කටයුතු සුදානම් කොට ඇත.

II. ක්‍රියාකාරී සැලැස්ම - 2019

දෙපාර්තමේන්තුවේ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා 2019 වර්ෂයේ මුල් මාස 04 සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම, අනුමත ඇස්තමේන්තු යටතේ සකස් කොට නියමිත කාලවකවානුව තුළදී විගණකාධිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලදි.

III. කාර්ය සාධන වාර්තාව - 2017

දෙපාර්තමේන්තුවේ සියළුම අංශයන් හා දෙපාර්තමේන්තුවට පරිබාහිරව අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අනුයුක්ත සංඛ්‍යාලේඛන අංශයන් මඟින් ඉටු කරන ලද කාර්යයන් හා 2017 වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තාව ද ඇතුලත් වාර්ෂික කාර්යසාධන වාර්තාව 2017 ප්‍රකාශයට පත් කරන ලද අතර එම වාර්තාවේ සංයුක්ත තැටි 350ක් සමඟ මෙම වාර්තාවේ පිටපත් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත නියමිත දිනට පෙර භාරදීමට කටයුතු කරන ලදි.

IV. කාර්ය සාධන සාරාංශ වාර්තාව - 2018

2016 වර්ෂයේ දෙපාර්තමේන්තුව මගින් ඉටු කරන ලද කාර්යයන් සාරාංශ ගතකොට එම වාර්තාව ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය වෙත නිශ්චිත කාලය තුල විද්‍යුත් තැපෑල(e-mail) මගින් ලබා දෙන ලදී.

V. භෞතික හා මූල්‍ය කාර්ය සාධන කාර්තු වාර්තාව - 2018

එක් එක් කාර්තුව තුල සෑම අංශයක් විසින්ම ඉටු කරන ලද කාර්යයන් පිළිබඳව භෞතික හා මූල්‍ය කාර්ය සාධන කාර්තු වාර්තා සෑම කාර්තුවක් අවසානයේදී ම පිලියෙල කරන ලදී.

VI. සංඛ්‍යාන අත්පොත - 2018

ශ්‍රී ලංකාවේ වැදගත් මූලික සමාජ ආර්ථික දත්ත , වර්ෂ කීපයක ශ්‍රේණියක් ලෙස ඉදිරිපත් කරන මෙම ප්‍රකාශනය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළියෙල කරන සංඛ්‍යාන අත්පොත 2018 හා එම තොරතුරුම ඇතුලත් සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පිළියෙල කරන සංඛ්‍යාන අත්පොත 2018 යන ප්‍රකාශන දෙකම නියමිත කාල වකවානුව තුළ එළි දැක්වීමට හැකි විය.

VII. ආර්ථික දත්ත - 2018

ශ්‍රී ලංකාවේ ආර්ථික තත්ත්වය පෙන්නුම් කරන දත්ත පමණක් ඇතුලත්කොට දෙවන වරට පිළියෙල කරන ලද ශ්‍රී ලංකාවේ ආර්ථික දත්ත 2018 ප්‍රකාශනය පිළියෙල කොට එළි දක්වන ලදි.

VIII. සංඛ්‍යාන පුවත් විවරණිකාව - 2018

දෙපාර්තමේන්තුවේ කාලින තොරතුරු ඇතුලත් සංඛ්‍යාන පුවත් විවරණිකාව 2018 අර්ධ වාර්ෂිකව පිළියෙල කොට එළි දක්වන ලදි.

IX. සංඛ්‍යාන දත්ත පත්‍රිකාව - 2018

මෙම දත්ත පත්‍රිකාව භාෂා ත්‍රිත්වයෙන්ම පිළියෙල කොට මුද්‍රණය කිරීමෙන් පසු බෙදා හරින ලද අතර දෙපාර්තමේන්තු වෙබ් අඩවියටද ඇතුලත් කරන ලදි.

X. දෙපාර්තමේන්තු ප්‍රකාශන බෙදා හැරීම

එක්රැස් කරනු ලබන දත්ත ප්‍රචලිත කිරීමේ මූලික වගකීම දෙපාර්තමේන්තුව සතුවේ. මෙම කාර්යයන් සාක්ෂාත් කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රකාශනයන් හා පුවත් විවරණිකා ප්‍රමාදයකින් තොරව දේශීය හා විදේශීය ආයතනයන් හා පුද්ගලයින් අතර බෙදාහැරීම පසුගිය වර්ෂය පුරා නොකඩවා සිදුකර ඇත.

XI. ගොඩනැඟිලි සංඛ්‍යාලේඛන

ගොඩනැඟිලි සංඛ්‍යාලේඛන දත්ත පරිගණක ගත කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

මීට අමතරව දෙපාර්තමේන්තුවේ සියළුම ප්‍රකාශනයන් හා පුවත් විවරණිකාවන් සඳහා ISBN/ ISSN අංක ලබා ගැනීමත්, ඒ ඒ කාලවකවානු වලදී ඉටු කර ඇත. දෙපාර්තමේන්තුව මඟින් සිදුකරනු ලබන කාර්යයන් පිළිබඳව කාර්ය සාධන සාරාංශ වාර්තා පිළියෙල කොට ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය වෙත නියමිත කාල වකවානු තුල ඉදිරිපත් කිරීමටද හැකි විය.

මූල්‍ය කාර්ය සාධනය - 2018

අනු අංකය	ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යයන්	**2018** වර්ෂය සඳහා ඇස්තමේන්තු මුදල (රු.මිලියන)	**2018/12/31** දක්වා වැය කරන ලද මුදල (රු. මිලියන)
01	ප්‍රකාශන මුද්‍රණ වියදම්	1.2 0.56 (අතිරේක)	1.233

3.6 පුස්තකාල හා ප්‍රලේඛන අංශය



දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සහයෝගය ලබාදීම, දෙපාර්තමේන්තු නිලධාරීන්, රජයේ ආයතන, රජයේ ප්‍රතිපත්ති සම්පාදකයින්, පර්යේෂකයින්, විශ්වවිද්‍යාල සිසුන්, පාසල් සිසුන් හා මහජනතාවට අවශ්‍ය තොරතුරු අත්පත් කර ගෙන එම තොරතුරු සංවිධානය කර ලබාදීම සහ පුස්තකාලය අත්පත් කරගත් තොරතුරු අනාගත පරම්පරාවේ ප්‍රයෝජනය සඳහා එකතුවක් ලෙස ආරක්ෂා කිරීම ඇතුළුව ප්‍රධාන කාර්යභාරයක් පුස්තකාල හා ප්‍රලේඛන අංශය විසින් සිදුකරනු ලබයි.

දෙපාර්තමේන්තු පුස්තකාලය විමර්ශන අංශය හා බැහැරදීමේ අංශය ලෙස ප්‍රධාන කොටස් දෙකකින් සමන්විතය. බැහැරදීමේ සේවා දෙපාර්තමේන්තු නිලධාරීන්ට පමණක් ලබා දෙන අතර බාහිර පාර්ශවයන් සඳහා විමර්ශන සේවා පමණක් ලබා දෙනු ලැබේ.

දෙපාර්තමේන්තු ප්‍රකාශන එකතුව, ශ්‍රී ලංකා එකතුව, ජාත්‍යන්තර ප්‍රකාශන එකතුව , සහ විවිධ විෂයයන්ට අදාල පෙළ පොත් එකතුවකින් බැහැරදීමේ අංශය සමන්විතය. විමර්ශන අංශයේ පැරණි දෙපාර්තමේන්තු ප්‍රකාශන, වාර සඟරා සහ පුවත්පත් තැන්පත් කර ඇත. පුස්තකාලයේ නොමැති ප්‍රකාශන අවශ්‍යතාවක් වුවහොත් අන්තර් පුස්තකාල පිරුළු සේවාව යටතේ වෙනත් පුස්තකාලවලින් හුවමාරු කරගනු ලැබේ.

2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉටුකරන ලද පුස්තකාල සේවා පහත පරිදි දැක්විය හැක.

I. පුස්තකාල පොත් මිලදී ගැනීම



දෙපාර්තමේන්තු පුස්තකාලය පරිහරණය කරන නිලධාරීන්ගේ දැනුම වර්ධනය සඳහා සංඛ්‍යානය, පරිගණක විද්‍යාව, සිතියම්, කළමනාකරණය, කාර්යාල ක්‍රම, ඉංග්‍රීසි භාෂාව, දෙමළ භාෂාව සහ පුස්තකාල විද්‍යාව යන විෂයන්ට අදාල ග්‍රන්ථ 195ක් දේශීය ප්‍රකාශන ආයතන වලින් මිලදී ගන්නා ලදී.

II. දැනුවත් කිරීමේ වැඩසටහන්

දෙපාර්තමේන්තු පුස්තකාලයේ පරිගණක දත්ත පද්ධතිය**(OPAC)** දියත් කිරීමේ උත්සවයට සමගාමීව දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් සහ දිස්ත්‍රික් අංශ ප්‍රධානීන් දැනුවත් කිරීම් සිදු කරන ලදී.

III. පුස්තකාල වෙබ් පිටුව නිර්මාණය කිරීම

දෙපාර්තමේන්තු පුස්තකාලයේ කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශයේ සහාය ඇතිව පුස්තකාලයේ සියලුම කාර්යයන් සහ සේවා පිලිබඳ විස්තර ඇතුළත් වන පරිදි වෙබ් පිටුව නිර්මාණය කර ඇත. මෙමගින් ලෝකයේ ඕනෑම ස්ථානයක සිට මාර්ගගතව පිවිසීමෙන් පුස්තකාලයේ තිබෙන ප්‍රකාශන මොනවාද යන්න පිළිබඳව ඕනෑම අවස්ථාවක ලබා ගැනීමට පහසුකම් සලසා ඇත. මෙයට අමතරව පුස්තකාල සූචිය, දේශීය පුවත්පත් සහ විද්‍යුත් වාර සඟරා වෙත මාර්ගගතව පිවිසීමට ද මේ තුළින් පහසුකම් සැලසීමට කටයුතු කර ඇත.

IV. දෙපාර්තමේන්තු ප්‍රකාශන සහ පුවත්පත් ලිපි පරිලෝකනය කර පුස්තකාල දත්ත පද්ධතියට ඇතුළත් කිරීම

ජාතික විද්‍යා පදනමේ තාක්ෂණික සහාය ඇතිව ලේඛන පරිලෝකනය සහ එම තොරතුරු දත්ත පද්ධතියට ඇතුළත් කිරීම පිළිබඳ නිළධාරීන් පුහුණු කිරීම සිදු කරන ලදී. මේ මගින් පුස්තකාල දත්ත පද්ධතිය හරහා මෙම ලේඛන වෙත උපයෝජකයින්ට මාර්ගගතව පිවිසිය හැකිය.

V. දෙපාර්තමේන්තු ප්‍රකාශනවල මෘදු පිටපත් පුස්තකාල දත්ත පද්ධතියට ඇතුළත් කිරීම

දෙපාර්තමේන්තුව මගින් 2017 වර්ෂයේ දී ප්‍රකාශයට පත් කරන ලද ප්‍රකාශනවල මෘදු පිටපත් ඒ ඒ අංශවලින් ලබාගෙන පුස්තකාල දත්ත පද්ධතියට ඇතුළත් කිරීම මෙමගින් සිදු කරන ලදී.

VI. පුස්තකාල දත්ත පද්ධතිය ස්වයංක්‍රීයාකරණය කිරීම

පුස්තකාල එකතුව සහ පුස්තකාල සාමාජිකයින් පිලිබඳ තොරතුරු ඇතුළත් පුස්තකාල දත්ත පද්ධතිය අන්තර්ජාලයට එකතු කිරීම 2018.06.08 දින සිදුකරන ලදී. මෙහි පුස්තකාල සූචිය (OPAC) සහ සංඛ්‍යාංක පුස්තකාලය (Digital Library) ද ඇතුළත් කර ඇත. මේ මගින් පුස්තකාලයට නොපැමිණ වුව ද පාඨකයින් හට පුස්තකාලය විමර්ශනය කිරීමට හැකියාව ඇත.

VII. පුවත්පත් ලිපි කැපුම් පරිලෝකනය කිරීම

පුස්තකාල අංශයට දිනපතා ලැබෙන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලට අදාල පුවත්පත්වල ඇති දෙපාර්තමේන්තුවට අදාළ ලිපි පරිලෝකනය කර පුස්තකාල දත්ත පද්ධතියට ඇතුළත් කිරීම මෙමගින් සිදු කරනු ලැබේ. උපයෝජකයින් හට පුස්තකාල දත්ත පද්ධතියට පිවිසීමෙන් මෙම පුවත්පත් ලිපි කියවීමට හැකියාව ලැබේ.

VIII. පුස්තකාල පොත් සංගණනය

පුස්තකාල පොත් සංගණනය සිදු කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ වත්කම් කළමනාකරණ අංශය මගින් මේ වන විට සංගණන කමිටු දෙකක් පත් කර ඇත. ඒ සඳහා නිලධාරීන් දොළොස් දෙනෙකු යොදවා ඇති අතර පොත් සංගණනය මේ වන විට කරගෙන යමින් පවතී.

මූල්‍ය කාර්ය සාධනය - 2018

අනු අංකය	ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යයන්	2018 වර්ෂය සඳහා ඇස්තමේන්තු මුදල (රු.මිලි.)	2018/12/31 දක්වා වැය කරන ලද මුදල (රු.මිලි.)
01	පුස්තකාල පොත් මිලදී ගැනීම	0.50	0.50

3.7 නියැදි සමීක්ෂණ අංශය


I. ශ්‍රී ලංකා ශ්‍රමබල සමීක්ෂණය - 2018

ශ්‍රී ලංකාවේ ශ්‍රමබලකාය, සේවා නියුක්තිය සහ සේවා වියුක්ති මට්ටම සහ ඒවායේ උපනතීන් පිළිබඳ මැනබැලීම සඳහා 1990 වර්ෂයේ පළමු කාර්තුවේ සිට නොකඩවා කාර්තු මට්ටමෙන් මෙම සමීක්ෂණය සිදුකරනු ලබයි. 2018 වර්ෂය සඳහා වූ මෙම සමීක්ෂණයේ ක්ෂේත්‍ර කටයුතු ටැබ්ලට් පරිගණක භාවිතයෙන් (CAPI) ජනවාරි සිට දෙසැම්බර් මාසය දක්වා සියලුම දිස්ත්‍රික්කයන්හි සිදු කර ඇත.2018 වර්ෂයේදී 2017 වර්ෂයේ තෙවන, සිව්වන කාර්තුවල සංක්ෂිප්ත වාර්තා සහ කාර්තුමය වාර්තා නිකුත් කර ඇති අතර එහි අවසන් සංක්ෂිප්ත වාර්තාව සහ අවසන් වාර්තාව ද නිකුත් කර ඇත. මීට අමතරව 2018 පළමු සහ දෙවන කාර්තුවේ සංක්ෂිප්ත වාර්තා සහ කාර්තුමය වාර්තා පිළියෙල කර ඇත. 2018 පළමු මාස 6 සඳහා වූ පරිගණක සාක්ෂරතාවය පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවද පිළියෙලකර ඇත.

වගුව 1.1 ශ්‍රී ලංකා ශ්‍රමබල සමීක්ෂණය - 2018 (II වන කාර්තුව)

දර්ශකය	ශ්‍රී ලංකාව	පුරුෂ	ස්ත්‍රී
වයස අවුරුදු 15ට වැඩි ජනගහනය	16,347,924	7,596,167	8,751,757
ශ්‍රම බලකාය (වයස අවු 15 හා ඊට වැඩි)	8,351,988	5,507,863	2,844,125
ශ්‍රම බලසහභාගිත්ව අනුපාතය	51.1	72.5	32.5
සේවා නියුක්ති ජනගහනය	7,970,154	5,336,164	2,633,989
සේවා නියුක්ති අනුපාතිකය (%)	95.4	96.9	92.6
සේවා වියුක්ති ජනගහනය	381,834	171,699	210,136
සේවා වියුක්ති අනුපාතිකය (%)	4.6	3.1	7.4
ආර්ථික වශයෙන් ක්‍රියාශීලී නොවන ජනගහනය	7,995,937	2,088,304	5,907,632
පරිගණක සාක්ෂරතාවය (I සහ II කාර්තු - 2018)			
පරිගණක සාක්ෂරතා අනුපාතිකය(%)	27.5	29.7	25.4

සටහන 1 : විරැකියා අනුපාතය ස්ත්‍රී පුරුෂභාවය සහ වයස් කාණ්ඩ අනුව - 2018 දෙවන කාර්තුව



II. ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය-2019

රට තුල සිදුවී ඇති සමාජ හා ආර්ථික වෙනස්කම් අධ්‍යයනය කිරීම උදෙසා ගෘහ ඒකකවල ආදායම් හා වියදම් පිළිබඳ පරිපූර්ණ තොරතුරු ලබා ගැනීමේ අරමුණින් සෑම වසර 03කට වරක් මෙම සමීක්ෂණය පවත්වනු

ලැබේ. ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය - 2019 මෙම සමීක්ෂණ මාලාවේ 10 වන සමීක්ෂණයයි. මෙවර සමීක්ෂණය මගින් කාණ්ඩ 10ක් යටතේ තොරතුරු රැස්කරයි. ප්‍රජාවිද්‍යාත්මක තොරතුරු, පාසල් අධ්‍යාපනය, සෞඛ්‍යය, ගෘහ ඒකක ආදායම් හා වියදම්, ගෘහ ඒකක සතුව ඇති කල්පවතින භාණ්ඩ, මූලික පහසුකම් ලබා ගත හැකි ස්ථාන, නිවාස පිළිබඳ තොරතුරු, ඉඩම් අයිතිය, සත්ත්ව පාලනය.ආහාර අනාරක්ෂිතතා අත්දැකීම් පිළිබඳ තොරතුරු යන ක්ෂේත්‍ර වලට අදාලව තොරතුරු රැස්කරනු ලැබේ.

එමගින් පවුලක සාමාන්‍ය අදායම, වියදම, ඒක පුද්ගල ආදායම සහ වියදම, ආදායම් හා වියදම් බෙදීයාමේ විෂමතාවය සහ දරිද්‍රතාවයට අදාලව තොරතුරු ප්‍රකාශයට පත්කරයි. මෙම සමීක්ෂණය මගින් එකතු කරනු ලබන තොරතුරු රටේ දිළිඳු බවින් පෙලෙන පුද්ගලයින් හඳුනා ගැනීමටත්, රටේ දිළිඳුකම අඩු කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති හා වැඩ සටහන් සම්පාදනය කිරීමට අවශ්‍ය සංඛ්‍යාතීන් ලබා දීමටත් උපකාරී වේ. සමීක්ෂණය ටැබ්ලට් භාවිතයෙන් සිදු කිරීම වෙනුවෙන් නියමු සමීක්ෂණයක් සිදු කිරීම සඳහා මූලික සැලසුම් සකස් කිරීම, 2019 නව සංස්කරණයන් පිළිබඳව සාකච්ඡා කිරීම හා දත්ත සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවකරුවන් සඳහා සැසියක් පැවැත්වීමද සිදු කර ඇත. අවසන් උපලේඛනය සකස් කිරීම සහ උපදෙස් පොත් සකස් කිරීමේ කටයුතු අවසන්කර ඇති අතර උපලේඛන සම්පූර්ණ කිරීම පිළිබඳ ක්ෂේත්‍ර නිලධාරීන් පුහුණු කිරීමේ කටයුතුද අවසන් කර ඇත.

III. සංචාරක වියදම් සමීක්ෂණය - 2017/2018

සවිස්තරාත්මක ජාතික ගිණුම් සැකසීමේ පරමාර්ථයෙන් ඒ සඳහා අවශ්‍ය දත්ත ලබා ගැනීම සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රථම වරට මෙම සමීක්ෂණය සිදුකර ඇත. විශේෂයෙන්ම සංචාරක ව්‍යාපාරයෙන් ආර්ථික දායකත්වය ගණනය කිරීම සඳහා අවශ්‍ය චන්ද්‍රිකා ගිණුම් සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීම මෙම සමීක්ෂණයේ අරමුණයි. මෙහි ක්ෂේත්‍ර කටයුතු 2017 ඔක්තෝම්බර් මාසයේ සිට 2018 සැප්තැම්බර් මාසය දක්වා මුළු දිවයිනම ආවරණය වන පරිදි සිදුකර අවසන් කර ඇත. මේ වනවිට දත්ත සැකසුම් කටයුතු සිදු වේ.

IV. කාල පරිහරණ සමීක්ෂණය - 2017

කිසියම් පුද්ගලයෙකු දිනක පැය 24ක කාලය ගතකරන්නේ කෙසේද යන්න පිළිබඳව තොරතුරු ලබාගැනීමේ අරමුණින් ශ්‍රී ලංකා ශ්‍රමබල සමීක්ෂණයට සමගාමීව වෙනමම උපලේඛනයක් භාවිතා කරමින් මුළු රටම ආවරණය වන පරිදි නිවාස ඒකක 6,250ක නියැදියක් භාවිතයෙන් 2017 වර්ෂයේ අවසන් කාර්තුවේදී (ඔක්තෝම්බර්,නොවැම්බර් සහ දෙසැම්බර්) මෙම සමීක්ෂණය ප්‍රථම වතාවට පැවැත්වුණි. වයස අවුරුදු 10ට වැඩි ගෘහ කාණ්ඩයේ සියලුම සාමාජිකයින් මෙහිදී සමීක්ෂණයට භාජනය විය.

සමීක්ෂණයේ උපලේඛනය සම්මුඛ පරීක්ෂක විසින් සම්පූර්ණ කල අතර ප්‍රතිචාරකයින් සඳහා වෙනමම දිනපොතක් ලබාදී එය සම්පූර්ණ කිරීම සඳහා සතියක කාලයක් ලබා දෙන ලදී. මෙම කාල පරිහරණ දිනපොත පැය 24ක කාලය විනාඩි 15 බැගින් කාල පරාස වලට බෙදා ඇති අතර එම කාලයන් තුල පුද්ගලයින් සිදුකල ක්‍රියාකාරකම් (ආර්ථික, අධ්‍යාපන, විනෝදාස්වාදය, විවේකය ආදි) පිළිබඳව සටහන් කිරීම සඳහා ඔවුන්ට උපදෙස් ලබා දෙන ලදී. මේ වනවිට කාල පරිහරණ සමීක්ෂණයේ දත්ත පරිගණක ගත කිරීමේ කටයුතු අවසන් අදියරේ පවතී.

V. Pilot study on implementation of 19th ICLS (International Conference of Labour Statisticians) revolution

19th ICLS revolutionහිදී අර්ථ දක්වන ලද නිර්වචනයන් භාවිතයට ගන්නේ කෙසේද යන්න අධ්‍යයනය මෙම නියමු සමීක්ෂණයේ අරමුණයි. අදාල ප්‍රශ්නාවලිය පුද්ගලයන්හට තේරුම් ගත හැක්කේ කෙසේද යන්න සොයා බැලීම සඳහා ඥානාත්මක (Cognitive test) සමීක්ෂණයක් මූලික අදියරේදී සිදු කරන ලදි. අදාල නියමු සමීක්ෂණය කටයුතු අවසන් කර ඇත. එහි වාර්තා ලෝක බැංකුවට සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානයට (ILO) යවා ඇත. සමීක්ෂණයට අදාල “Survey solutions” මෘදුකාංගයට අදාල පුහුණු පන්ති පැවැත්වීම සම්බන්ධ කටයුතු සිදු කරමින් පවතී.

VI. STEP Survey

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව හා සෞඛ්‍ය අමාත්‍යාංශය එක්ව මෙම සමීක්ෂණය සිදු කරනු ලබන අතර මෙමගින් බෝනොවන රෝග පිළිබඳ සහ බෝනොවන රෝගයන්ට ලක්වීමට ඇති අවදානම පිළිබඳව සොයා බලනු ලැබේ. මෙම සමීක්ෂණයේදී පරිගණක ආශ්‍රිත සම්මුඛ පරීක්ෂණ ක්‍රමය (Computer Assisted Personal Interviewing (CAPI)) යොදා ගැනීමට හා නිවාස ඒකක 7,728 ක නියැදියක් භාවිතයෙන් වයස අවුරුදු 18-69 දක්වා පුද්ගලයින්ගෙන් තොරතුරු රැස්කිරීමට සැලසුම්කර ඇත. ප්‍රශ්නාවලිය සකස් කිරීමේ කටයුතු අවසන්කර ඇත.

VII. කාන්තා යහපැවැත්ම පිළිබඳ සමීක්ෂණය (Women's Welbeing Survey)

එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලෙහි (UNFPA) මූල්‍යමය සහ තාක්ෂණික සහාය ඇතිව ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට මෙම සමීක්ෂණය ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පැවැත්වීමට කටයුතු යොදා ඇත. මෙම සමීක්ෂණය මගින් වයස අවුරුදු 15 ට වැඩි කාන්තාවන්ගේ දෛනික ක්‍රියාකාරකම්, ඔවුන්ගේ ජීවන තත්ත්වය සහ ආර්ථික හා සමාජ පසුබිම පිළිබඳව තොරතුරු රැස්කිරීම සිදු කරනු ලබයි. මෙම සමීක්ෂණය සමස්ථ දිවයිනම ආවරණය වන පරිදි තෝරාගත් නිවාස ඒකක 2,520 ක නියැදියක් භාවිතයෙන්, පරිගණක ආශ්‍රිත සම්මුඛ පරීක්ෂණ ක්‍රමවේදයෙන් (CAPI) කාන්තා සම්මුඛ පරීක්ෂක නිලධාරීන් පමණක් යොදා ගැනීමට බලාපොරොත්තු වේ. සමීක්ෂණයේ වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන පවත්වා, දැනට එහි මූලික සැළසුම් සකස් කර, දත්ත සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවකරුවන් සඳහා රැස්වීමක් පවත්වා, ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) සමීක්ෂණ ප්‍රශ්නාවලිය ශ්‍රී ලංකාවට ගැලපෙන ලෙස සකස්කර සිංහලට පරිවර්තනය කිරීමේ කටයුතු අවසන් කර ඇත.උපලේඛනය සම්පූර්ණ කිරීමට අදාල උපදෙස් පොත් සකස් කරමින් පවති.

VIII. වැඩිහිටියන්ගේ දුන්කොල භාවිතය පිළිබඳ සමීක්ෂණය (GATS)

මෙම සමීක්ෂණය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ දුම්කොල හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය තාක්ෂණික සහාය සහ ඇමරිකාවේ CCD (Center for Disease Control and Prevention) ආයතනයේ මූල්‍යමය ආධාර ලැබේ. දුන්කොල සහ දුම්වැටි භාවිතය පිළිබඳ තොරතුරු, අක්‍රීය දුම් පානය, දුම්වැටි භාවිතය වැලැක්වීමට ගතහැකි ක්‍රියාමාර්ග සහ ඊට අදාල ප්‍රතිපත්ති සම්පාදනය මෙම සමීක්ෂණයේ අරමුණුයි.සමීක්ෂණ සැළසුම් කිරීම සහ ඊට අදාල ව්‍යාපෘති වාර්තාවක් සකස් කිරීමේ කටයුතු දැනට සිදුකර ඇත. මීට අමතරව සමීක්ෂණයට අදාල දල වියදම් ඇස්තමේන්තුව සකසා අදාල ආයතනය වෙත යවා ඇත.

IX. ශ්‍රී ලංකාවට අදාලව ගෝලීය සහ ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය සැකසීම

පුද්ගලයන්ගේ අධ්‍යාපනය, සෞඛ්‍ය සහ ජීවන තත්ත්වයන්ට අදාලව ඔවුන් මුහුණ දී ඇති දුෂ්කරතාවයන් පදනම් කරගෙන හඳුනාගත දර්ශකයන් දහයක් යටතේ මෙය ගණනය කරනු ලබයි. ශ්‍රී ලංකාවට අදාලව ගෝලීය (Global Multidimensional Poverty Index -MPI) සහ ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය (National - MPI) සැකසීමේ කටයුතු සිදුකර අවසන්කර ඇත.

X. ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ දත්ත භාවිතා කරන්නන්හට අදාල තොරතුරු ලබාදීම

අංශය මගින් මෙතෙක් ක්‍රියාත්මක කල සමීක්ෂණයන්ට අදාල තොරතුරු දත්ත භාවිතා කරන්නන්ගේ අවශ්‍යතාවයන් අනුව ලබා දීම සිදුකරයි. ඒ අනුව ජාත්‍යන්තර ආයතන, විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පර්යේෂකයින් සහ විශ්ව විද්‍යාල ශිෂයයින් සහ වෙනත් ආයතන වෙනුවෙන් දත්ත නිකුත් කර ඇත.

මූල්‍ය කාර්ය සාධනය - 2018

අනු අංකය	ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යයන්	**2018** වර්ෂය සඳහා ඇස්තමේන්තු මුදල (රු. මිලි.)	**2018/12/31** දක්වා වැයකරන ලද මුදල (රු. මිලි.)
1	ශ්‍රී ලංකා ශ්‍රම බල සමීක්ෂණය	3.3	8.06*
2	සංචාර වියදම් සමීක්ෂණය	6.5	
3	කාල පරිහරණ සමීක්ෂණය	2.3	
4	ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය	0.4	
5	Pilot study on implementation of 19th ICLS revolution	4.7(ILO & WB)	0.5
6	බෝනොවන රෝග පිළිබඳ සමීක්ෂණය(STEP Survey)	1.75(Ministry of Health)	-
7	කාන්තා යහ පැවැත්ම පිළිබඳ සමීක්ෂණය	8.2(UNFPA)	-
8	වැඩිහිටියන්ගේ දුන්කොල භාවිතය පිළිබඳ සමීක්ෂණය (GATS)	CDC funds-USA	-
9	ශ්‍රී ලංකාවට අදාලව ගෝලීය සහ ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය සැකසීම	-	-
10	ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ දත්ත භාවිතා කරන්නන් හට අදාල තොරතුරු ලබාදීම	-	-

* 1,2,3,සහ 4 අදාල සමීක්ෂණ වැය ශීර්ෂ 1409 (1) යටතේ වියදම් දරණු ලද අතර වෙන් වෙන්ව දැක්විය නොහැක.

3.8 ක්ෂේත්‍ර කළමණාකරණ අංශය

I. දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ සහ ප්‍රධාන කාර්යාලය අතර සම්බන්ධීකරණ කටයුතු

දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ සහ ප්‍රධාන කාර්යාලය අතර සම්බන්ධීකරණ කටයුතු මැනවින් සිදු කිරීම සඳහා දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශවලට අවශ්‍ය විවිධ ප්‍රතිපාදන, භෞතික පහසුකම් හා විවිධ ආකෘති පත්‍ර ලබාදීමේ කටයුතු සිදුකර ඇත. ප්‍රතිපාදන යැවීම යටතේ,

කාර්තුමය වශයෙන්

- දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ ප්‍රධානින්ගේ හා ක්ෂේත්‍ර නිලධාරින්ගේ මාසික ගමන් වියදම් සඳහා ප්‍රතිපාදන
- ලිපිද්‍රව්‍ය සඳහා ප්‍රතිපාදන
- තැපැල් සහ සන්නිවේදන කටයුතු සඳහා ප්‍රතිපාදන
- ඉන්ධන සඳහා ප්‍රතිපාදන, රියදුරු සංයුක්ත සහ අතිකාල දීමනා සඳහා ප්‍රතිපාදන

එමෙන්ම දිස්ත්‍රික් කාර්යාලයීය සංඛ්‍යාලේඛන අංශවලට අවශ්‍ය

- විදුලිය, ජලය, සනීපාරක්ෂක කටයුතු,
- යන්ත්‍රෝපකරණ නඩත්තු කටයුතු වැනි අනෙකුත් කාර්යාලයීය අවශ්‍යතා සඳහා ද ප්‍රතිපාදන යවා ඇත.
- දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශවල ආකෘති පත්‍ර අවශ්‍යතා සපුරාලීම.

දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශවල කාර්ය මණ්ඩල පිළිබඳ දත්ත පද්ධතිය පවත්වාගෙන යාම, දිස්ත්‍රික් කාර්ය මණ්ඩල නිලධාරින්ගේ ස්ථාන මාරුවීම්, අනුයුක්ත කිරීම් සහ වැඩ ආවරණය කිරීම් හා සම්බන්ධ නිර්දේශ කිරීම් අනුමැතිය සඳහා යොමු කිරීම් පිළිබඳ රාජකාරි කටයුතු සිදු කර ඇත.

II. අනෙකුත් දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශවල පිහිටුවා ඇති සංඛ්‍යාලේඛන අංශ සම්බන්ධීකරණය හා අගැයීම් කටයුතු

- අමාත්‍යාංශ, දෙපාර්තමේන්තුවල ඇති සංඛ්‍යාලේඛන අංශවල කාර්ය මණ්ඩලය සම්බන්ධ දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම.

III. කාර්යක්ෂම දිස්ත්‍රික් කාර්යාල තේරීම

- අදාල අංශ මගින් අගැයීම් වාර්තා ලබා ගැනීම.
- එම වාර්තා පදනම් කරගෙන තේරීම් කටයුතු සිදු කිරීම සඳහා වාර්තාවක් සකස් කිරීම.

IV. දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ ප්‍රධානින් හා ප්‍රධාන කාර්යාලයීය අංශ ප්‍රධානින්ගේ සහභාගිත්වයෙන් වාර්ෂික වැඩමුළු පැවැත්වීම.

මෙම වැඩමුළු අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් හා ප්‍රධාන කාර්යාලයීය අංශ ප්‍රධානින්ගේ හා දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ ප්‍රධානින්ගේ සහභාගිත්වයෙන් පහත සඳහන් දිනවලදී පවත්වන ලදී.

- **දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ ප්‍රධානින්ගේ වාර්ෂික වැඩමුළුව 1**
  2018 ජූනි මස 06 සහ 07 දින වලදී හෙක්ටර් කොඩ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ ආයතනයේ දී
- **දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ ප්‍රධානින්ගේ වාර්ෂික වැඩමුළුව 2**
  2018 දෙසැම්බර් මස 05, 06 සහ 07 දිනවලදී දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේ දී ද පවත්වා ඇත.

මෙම වැඩමුළුවලදී,

- ප්‍රධාන කාර්යාලයීය අංශ ප්‍රධානීන් විසින් අංශවල විශේෂිත කාර්යභාරයන් පිළිබඳ ඉදිරිපත් කිරීම් සිදු කරන ලදී.
- දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ ප්‍රධානීන් විසින් ඉදිරිපත් කරන ලද අදහස්, යෝජනා, ගැටළු හා විසඳුම් පිළිබඳ සාකච්ඡා කරන ලදී.

V. කාර්යසාධනය සහ ප්‍රගතිය නිරීක්ෂණය, සාකච්ඡා කිරීම සඳහා කමිටු රැස්වීම් පැවැත්වීම. (ප්‍රජාවිද්‍යාත්මක, කර්මාන්ත, කෘෂිකර්ම)

මෙම අංශය මගින් පවත්වනු ලබන වාර්ෂික ප්‍රජාවිද්‍යාත්මක, කෘෂිකර්ම කමිටු රැස්වීම් වල පළමු රැස්වීම් දෙපාර්තමේන්තු පුහුණු අංශයේ දී පහත සඳහන් දින වලදී පවත්වන ලදී.

- කෘෂිකර්ම කමිටු රැස්වීම - 2018.05.17
- කර්මාන්ත කමිටු රැස්වීම - 2018.05.22
- ප්‍රජාවිද්‍යා කමිටු රැස්වීම - 2018.05.24
- එමෙන්ම මෙම කමිටු රැස්වීම්වල දෙවන වටයේ රැස්වීම් කමිටු රැස්වීම් 03 ම සම්බන්ධ කරමින් ප්‍රජාවිද්‍යා, කර්මාන්ත, කෘෂිකර්ම කමිටු රැස්වීම ලෙස 2018.12.12 වන දින දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේ දී පැවැත්වීම.
- මෙම රැස්වීම් දී අදාල සංඛ්‍යාලේඛන අංශවල කාර්යභාරය පිළිබඳ ප්‍රගතිය, මුහුණපා ඇති ගැටළු හා ඉදිරිපත්කරනු ලැබූ යෝජනා පිළිබඳ සාකච්ඡා කිරීම සිදුකරන ලදී. කමිටු රැස්වීම්වලට අදාලව වාර්තා සකස් කිරීම ද සිදු කර ඇත.

VI. දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් දිස්ත්‍රික් සංඛ්‍යාන අත්පොත සැකසීම

- දිස්ත්‍රික් සංඛ්‍යාන අත්පොත සැකසීම සඳහා අවශ්‍ය අදාල දත්ත වගුවල ආදර්ශ සහ ලිඛිත උපදෙස් සහ ISBN අංක දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ වෙත ලබාදී ඇත.
- අධ්‍යාපන, උසස් අධ්‍යාපන, විදේශ රැකියා, විශ්‍රාම වැටුප්, රෙජිස්ට්‍රාර් ජනරාල්, පොලිස් ආදී විවිධ ආයතන වලින් එකතු කරන දත්ත එම ආයතනවලින් ලබා ගෙන දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ වෙත ලබාදී ඇත.
- දිස්ත්‍රික් සංඛ්‍යාන අත්පොත සම්බන්ධ පුහුණු වැඩසටහනක් 2018 මාර්තු 06 සහ 08 දිනයන්හි දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ ප්‍රධානීන් සහ සංඛ්‍යාන අත්පොත සකස් කරනු ලබන නිලධාරීන් සඳහා දෙපාර්තමේන්තු පුහුණු අංශයේ දී ලබාදීම.
- දත්ත නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමේ වැඩසටහන දිස්ත්‍රික් මට්ටමින් සකස්කර ලබාදී ඇත.
- දත්ත වගු ආකෘති භාෂා දෙකකින් හා තුනකින් වන පරිදි දිස්ත්‍රික්ක අනුව සැකසීම.
- නිවැරදි කරන ලද වගු PDF කර WEB අඩවියට යැවිය හැකිසේ සකස් කිරීම, මුද්‍රණය කිරීමට සුදුසු පරිදි අත්පොත් සකස් කිරීම.
- දිස්ත්‍රික්ක 25 ක අත්පොත් දෙපාර්තමේන්තු WEB අඩවියෙහි පලකිරීමට යැවීම හා දිස්ත්‍රික්ක 11 ක පොත් මුද්‍රණය කිරීම

VII. විශේෂ වැඩ සටහන් හා ප්‍රදර්ශන

- මොනරාගල දිස්ත්‍රික්කයෙහි 2018.08.29, 30 හා 31 දිනවල පැවති V 2025 Enterprices Sri Lanka ප්‍රදර්ශනයෙහි දෙපාර්තමේන්තු ප්‍රදර්ශන කුටිය සංවිධානය කිරීම හා පැවැත්වීම.

මූල්‍ය කාර්ය සාධනය - 2018

අනු අංකය	ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යයන්	**2018** වර්ෂය සඳහා ඇස්තමේන්තු මුළු මුදල (රු.මිලි.)	**2018/12/31** දක්වා වැය කරන ලද මුදල (රු.මිලි.)
1	දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ සහ ප්‍රධාන කාර්යාලය අතර සම්බන්ධීකරණය පවත්වා ගැනීම සඳහා තාක්ෂණික හා පරිපාලනමය පහසුකම් සැපයීම.	16.2	15.685
2	අමාත්‍යාංශ, දෙපාර්තමේන්තුවල ඇති සංඛ්‍යාලේඛන අංශ සම්බන්ධීකරණය සහ ඇගයීම.	0.05	-
3	කාර්යක්ෂම දිස්ත්‍රික් කාර්යාල තේරීම	0.15	-
4	දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ ප්‍රධානීන් හා ප්‍රධාන කාර්යාලයීය අංශ ප්‍රධානීන්ගේ සහභාගිත්වයෙන් වාර්ෂික වැඩමුළු පැවැත්වීම.	0.80	0.703
5	කාර්යසාධනය සහ ප්‍රගතිය නිරීක්ෂණය, සාකච්ඡා කිරීම සඳහා කමිටු රැස්වීම් පැවැත්වීම. (ප්‍රජාවිද්‍යාත්මක, කර්මාන්ත, කෘෂිකර්ම)	0.07	0.0575
6	දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් දිස්ත්‍රික් සංඛ්‍යාන අත්පොත සැකසීම.	0.75	0.123
7	විශේෂ වැඩ සටහන් හා ප්‍රදර්ශන	0.2	0.18

සටහන: අංක 2 සිට 7 දක්වා සඳහන් කාර්යයන් සඳහා වැය විෂය 1409 (1) යටතේ වෙන්වී ඇති මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 2.02 කි. 2 සිට 7 දක්වා කාර්යයන් සඳහා ක්‍රියාකාරී සැලැස්මට අනුව සෘජුවම වියදම් කර ඇති ප්‍රමාණය රු.මි. 1.0635 ක් වුව ද වැය විෂය 1409 (1) යටතේ වියදම් කර ඇති මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 1.896 කි. කාර්ය අංක 2, 3 සහ 6 ඉතිරි වූ ප්‍රතිපාදන දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශවල විවිධ ප්‍රතිපාදන අවශ්‍යතා සඳහා ලබාදී මෙන් මෙම මූල්‍ය කාර්ය සාධනය ලබාගෙන ඇත.

3.9 පුහුණු අංශය

රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා සැලසුම් සකස් කිරීම සඳහා නිරවද්‍ය සහ විශ්වසනීය තොරතුරු සැපයීමට හැකි වනු පිණිස සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයෙහි හැකියාවන් වර්ධනය කිරීම මෙන්ම තිරසර සංවර්ධන අරමුණු සාධනය කරනු වස් ජාතික සංවර්ධනයට දායක වීමේ අරමුණු පෙරදැරිව දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ සම්පත්දායකත්වය මත මෙන්ම දෙපාර්තමේන්තු නිලධාරීන් බාහිර ආයතන වෙත යොමු කර ඔවුන්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීමේ පුහුණු අංශයේ ප්‍රධාන අරමුණ වේ. ඒ අනුව දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන සෑම මට්ටමකම නිලධාරීන් ඉලක්ක කරමින් පුහුණු අංශය මගින් 2018 වර්ෂය තුළ පුහුණු වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් 82 ක් පවත්වා දෙපාර්මේන්තු නිලධාරීන් 2,964 ක් පුහුණු කරන ලදි.



ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් නාලක දිසානායක මහතා විසින් නවක රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් සඳහා පැවැත්වූ සේවාරම්භක පුහුණු වැඩසටහනෙහි දේශනයක් පවත්වමින්.

මෙම පුහුණු වැඩසටහන් අතර දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ භාෂා හැකියාවන් සංවර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන්, පශ්චාද් උපාධි පාඨමාලා සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම, සංඛ්‍යානමය දැනුම වර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන්, නවක සංඛ්‍යාලේඛන නිලධාරීන්ගේ හා නවක රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන්, රියදුරන් සහ කාර්යාල කාර්යය සහයකවරුන් සඳහා විශේෂයෙන් සැලසුම් කරන ලද වෘත්තියමය පුහුණු වැඩසටහන් ආදිය ප්‍රමුඛත්වය ගනී. එමෙන්ම දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා කාලීන අවශ්‍යතාවන් සැලකිල්ලට ගෙන විවිධ විෂයය ක්ෂේත්‍රයන් සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන්ද, නිලධාරීන් විසින් විවිධ විදේශ පුහුණු වැඩසටහන්වලට සහභාගි වී ලබාගත් දැනුම හා අත්දැකීම් අනෙකුත් නිලධාරීන් සමග බෙදා ගැනීමේ වැඩසටහන් මෙන්ම, දෙපාර්තමේන්තු නිලධාරීන් බාහිර ආයතන වෙත යොමු කර පුහුණු කිරීම් ආදී විවිධ වැඩසටහන්ද සිදු කර ඇත.

මධ්‍යගතව දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයීය පුහුණු අංශය තුළ පැවැත්වෙන පුහුණු වැඩසටහන්වලට අමතරව දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශවලට අනුයුක්තව සේවය කරනු ලබන කාර්යය මණ්ඩලයේ පරිගණක දැනුම වර්ධනය කිරීමේ අරමුණින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයවලදී විමධ්‍යගතව පරිගණක පුහුණු වැඩසටහන් 4 ක් 2018 වර්ෂය තුළ පවත්වා ඇත. ඒ අනුව බදුල්ල, මොනරාගල, කලුතර හා නුවරඑළිය දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශවලට අනුයුක්තව සේවය කරන කාර්යාලයීය හා ක්ෂේත්‍ර කාර්ය මණ්ඩල සඳහා පුහුණු වැඩමුළු 4ක් පැවැත්වීම මගින් දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ පරිගණක දැනුම වර්ධනය සඳහා පුහුණු අංශය දායක වී ඇත.

2018 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 288 ක්, බාහිර ආයතන මගින් පවත්වන ලද පුහුණු වැඩසටහන් 23 ක් සඳහා යොමු කිරීම මගින් පුහුණුවීම් ලබා දී ඇත. වඩාත් පිරිවැය ඵලදායී ආකාරයෙන් නිලධාරීන් පුහුණු කිරීමේ අරමුණින් මෙසේ බාහිර ආයතනවලට යොමු කිරීම සිදු කෙරන අතර මේ යටතේ පැවැත්වූ පුහුණු වැඩසටහන් යටතේ වඩාත් කැපී පෙනෙන පුහුණුවීම් අතර දෙපාර්තමේන්තු නිලධාරීන් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය වෙත යොමු කර ලබාදුන් Indesign පුහුණුව, රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් මිලෝදා ආයතනය වෙත යොමුකර විගණන පරීක්ෂණ වාර්තා සඳහා පිළිතුරු සැකසීමේ පුහුණුව ලබා දීම, නඩත්තු අංශයේ නිලධාරීන් වෙත ලබාදුන් විදුලි ජනක යන්ත්‍ර භාවිතය හා නඩත්තුව පිළිබඳ පුහුණුව ලබා දීම, වැටුප් පරිවර්තනය සම්බන්ධ පුහුණු වැඩමුළුව, ආයතන සංග්‍රහයේ කාර්ය පරිපාටි පිළිබඳ පුහුණු වැඩසටහන්, වත්කම් කළමනාකරණ හා භාණ්ඩ සමීක්ෂණ පිළිබඳ පුහුණු වැඩසටහන් ආදිය වේ.

එමෙන්ම, දෙපාර්තමේන්තුව තුළ වඩා දක්ෂ පුහුණු සංචිතයක් බිහි කිරීමේ ක්‍රියාවලියේ පළමු පියවර 2018 වර්ෂයේදී ආරම්භ කරන ලදි. ඒ අනුව බාහිර පුහුණු ආයතනයක් වෙත යොමු කර දෙපාර්තමේන්තු තුළ හඳුනාගත් ප්‍රධාන පුහුණුකරවන්නන් 6 දෙනෙකුගේ කණ්ඩායමක් සඳහා ‘‘පුහුණු වැඩසටහන් පැවැත්වීම පිළිබඳ න්‍යායාත්මක් හා ප්‍රායෝගික පුහුණුවක්’’ ලබාදෙන ලදි. ඒ අනුව එම වැඩසටහනට සහභාගිවීමෙන් ඔවුන් ලබා ගත් දැනුම හා අත්දැකීම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ලබාදීමේ අරමුණින් දෙපාර්තමේන්තුවේ සෑම අංශයක්ම නියෝජනය කරමින්

තෝරාගත් නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පවත්වන ලදි. මෙහි මූලික අරමුණ වනුයේ වඩාත් ඵලදායී ලෙස පුහුණු වැඩසටහන් පැවැත්වීම මගින් දෙපාර්තමේන්තුවේ විවිධ කාර්යයන්හි කාර්යක්ෂමතාව, නිරවද්‍යතාව හා ඵලදායිතාව වැඩි දියුණු කිරීමයි. එම වැඩසටහනේ තුන්වන පියවර ලෙස දිස්ත්‍රික් 25 සඳහා වන පුහුණු සංචිතය සඳහා සුදුසු නිලධාරීන් තෝරා ගැනීමත්, ඔවුන් සඳහා දෙපාර්තමේන්තුවේ විවිධ අංශවලින් කෙරෙන ප්‍රධාන තාක්ෂණික කාර්යයන් පිළිබඳ දැනුම එක් දින වැඩසටහන් පවත්වා ලබාදීමට සුදුසු වැඩසටහනක් හා සම්පත් දායකයන් හඳුනාගැනීමද 2018 වර්ෂයේදී සිදු කෙරෙන ලදි.

විදේශීය පුහුණු වැඩසටහන් සඳහා සහභාගිවීමට අවස්ථාව හිමිවන සීමිත නිලධාරීන් විසින් ඔවුන් එම පුහුණු වැඩසටහන්/වැඩමුළු/සම්මන්ත්‍රණ ආදියට සහභාගිවී ලබාගත් දැනුම දෙපාර්තමේන්තුවේ අනෙකුත් නිලධාරීන් සමඟ බෙදා ගැනීම උදෙසා දැනුවත් කිරීමේ පුහුණු වැඩමුළු 06 ක් පවත්ව ඇත. විවිධ තේමාවන් යටතේ පැවැත්වෙන මෙම තේමාත්මක දැනුවත්වීම් මගින් පුහුණුවට සහභාගි නොවූ දෙපාර්තමේන්තුවේ නිලධාරිහට ඒ එක් එක් තේමාවන් යටතේ ජාත්‍යන්තර මට්ටමින් ඇති නව ක්‍රියාකාරකම් පිළිබඳ දැනුවත්වීම සඳහා ඉඩකඩ සැලසේ.

2018 වර්ෂයේ පැවැත්වූ පුහුණු වැඩසටහන් අතුරින් දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ නායකත්ව හා සන්නිවේදන හැකියාවන් වර්ධනය කිරීම සඳහා පවත්වන ලද Speechcraft පුහුණු වැඩසටහන සුවිශේෂී ස්ථානයක් ගනු ලබයි. දකුණු ආසියා කලාපීය පළමු ටෝස්ට්මාස්ටර් සංගමය ලෙස හැඳින්වෙන Colombo Toast Masters Club මගින් මෙම පුහුණු වැඩසටහන පවත්වනු ලබන අතර දෙපාර්තමේන්තුවේ ඉහළ හා මධ්‍යම මට්ටමේ විධායක නිලධාරීන් 25 දෙනෙකු මේ යටතේ පුහුණුවන ලද අතර මෙමගින් ඔවුන්ගේ ඉංග්‍රීසි සන්නිවේදන කුසලතා මෙන්ම ආකල්ප වර්ධනයද, සාමූහිකත්වයෙන් කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමේ හැකියාවද වර්ධනයද අපේක්ෂා කෙරේ.



***Speechcraft** පුහුණු වැඩසටහනේ සමාරම්භක දිනය*

එමෙන්ම දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගයන් සඳහා පුහුණු වැඩමුළු මෙන්ම දෙවන රාජ්‍ය භාෂාව වන දෙමළ භාෂා ලිඛිත හා කථන හැකියාව වර්ධනය කිරීමේ අරමුණින් දෙමළ භාෂා පුහුණු වැඩසටහන් 04 ක් පවත්වා ඇත. මීට අමතරව පුහුණු අංශය විසින් කාර්යක්ෂමතා කඩඉම් පැවැත්විය යුතු විවිධ තනතුරුවල නිලධාරන් සඳහා පැවැත්විය යුතු සියලු කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමද, ඒවායේ ප්‍රතිඵල නිකුත් කිරීමද මෙම වර්ෂය තුළ සිදු කරෙන ලදි.

සංඛ්‍යාන හැකියා වර්ධනය සඳහා පුහුණු වැඩසටහන් පවත්වන ලෙස කරන ලද ඉල්ලීම් අනුව විශ්ව විද්‍යාල සිසුන්ගේ සංඛ්‍යාන සාක්ෂරතාව ඉහළ නැංවීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 2ක් පුහුණු අංශය මඟින් 2018 වර්ෂය තුළදී සංවිධානය කරනු ලැබින.

පුහුණු අංශය මගින් නිරන්තරයෙන් සිදු කෙරෙන ප්‍රධාන කාර්යයන් වනුයේ බාහිර විශේෂඥ සම්පත්දායකයන් යොදා ගනිමින් විවිධ පුහුණු වැඩසටහන්/දැනුවත් කිරීම් සංවිධානය කිරීමයි. ඒ අනුව දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන්ගේ ධනාත්මක ආකල්ප වර්ධනය කිරීමේ අරමුණින් පුහුණු වැඩසටහන් 02ක්ද, රජයේ නිලධාරීන් විසින් සිදුකරනු ලබන අයථා ක්‍රියා වැලැක්වීමේ අරමුණින් ඔවුන් දැනුවත් කිරීම උදෙසා අල්ලස් හා දූෂණ විමර්ශනය සම්බන්ධව වැඩසටහනක් ද, නිලධාරීන්ගේ මානසික සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අභිවෘද්ධියට හේතුවන බැවින් ඒ උදෙසා සියළු නිලධාරීන් සම්බන්ධ කරමින් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක්ද, කාලීන වශයෙන් වැදගත්වන "තොරතුරු දැන ගැනීමේ පනත" පිළිබඳ දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 02 ක් හා CAPI



අල්ලස් හා දූෂණ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ (විමර්ෂණ) ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ප්‍රියන්ත චන්ද්‍රසිරි මයා රාජ්‍ය සේවයේ අල්ලස් හා දූෂණ මැඩලීම සම්බන්ධ දේශනය පවත්වද්දී

තාක්ෂණය පිලිබඳ නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් දෙකක්ද, ජාතික ආහාර සංග්‍රාමය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් ද පවත්වන ලදි.

තවද, තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම නියාමනය කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් සකස් කළ යුතු දර්ශකාංග සකස් කිරීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර ප්‍රදායක ආයතනවල දායකත්වයෙන්ද Post Disaster Need Assessment සහ Sustainable Consumption Production යන පුහුණු වැඩසටහන් දෙකක් නිලධාරීන් 60 ක් සම්බන්ධ කර ගනිමින් 2018 වර්ෂය තුළ සාර්ථකව නිම කරන ලදි.

මූල්‍ය කාර්ය සාධනය -2018


අනු අංකය	කාර්යය	2018 වර්ෂය සඳහා ඇස්තමේන්තු මුදල(රු.මිලියන)	වැය කරන ලද මුදල (රු.මිලියන) 2018/12/31 දක්වා
1	දෙපාර්තමේන්තුවේ පශ්චාත් උපාධි, දර්ශන වේදී හා ආචාර්ය උපාධි හදාරන්නන් සඳහා ප්‍රතිපාදන ලබාදීම	0.20	0.06
2	දෙපාර්තමේන්තුවේ ආචාර්ය උපාධි හදාරන්නන් විසින් ඉදිරිපත් කරනු ලබන ද්වි වාර්ෂික ඉදිරිපත් කිරීම්	0.02	0.01
3	සංඛ්‍යාන කාර්ය මණ්ඩලයේ වෘත්තීය කුසලතා හා මෘදු කුසලතා සංවර්ධනය සඳහා දෙපාර්තමේන්තුව තුල හා පිටත කෙටි කාලීන පුහුණු වැඩසටහන් පැවැත්වීම	0.90	1.40
4	නිල සංඛ්‍යාති පිළිබඳ විවිධ විෂය ක්ෂේත්‍රයන් සඳහා පුහුණු සංචිතයක් සඳහා නිලධාරීන් පුහුණු කිරීම	0.10	0.12
5	විදේශීය පුහුණු වැඩසටහන් සම්බන්ධ දේශන මාලාව	0.08	0.02
6	රාජ්‍ය කළමනාකරණ සහකාර,මුද්‍රණ අංශ නිලධාරීන් ඇතුළු දෙපාර්තමේන්තුවේ සහයක නිලධාරීන් සඳහා වූ පුහුණු වැඩසටහන්	0.80	0.75
7	සියලුම සංඛ්‍යාලේඛන නිලධාරීන් හා සංඛ්‍යාලේඛනඥ වරුන් සඳහා වන අනිවාර්ය පුහුණු වැඩසටහන්	0.90	1.24
8	දෙපාර්තමේන්තුව තුල Toastmasters Club meetings පැවැත්වීම	0.30	0.23
9	දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ ඉංග්‍රීසි කථන කුසලතා හැකියා වර්ධනය සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම	0.50	–
10	දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතා මට්ටම ලබා ගත යුතු නිලධාරීන් සඳහා සිංහල/ දෙමළ භාෂා පුහුණු වැඩසටහන්	0.10	0.08
11	විෂය ධාරාවන් 22 යටතේ අත්පොත් පිළියෙළ කර පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	0.01	–
12	දෙපාර්තමේන්තු නිලධාරීන්/විශ්වවිද්‍යාල සිසුන්ගේ දැනුම ,ආකල්ප වර්ධනය කිරීම සඳහා වූ දැනුවත් කිරීමේ වැඩසටහන්	0.50	0.43
13	දිස්ත්‍රික් කාර්යාල වල පවත් වනු ලබන මූලික පරිගණක පුහුණු පාඨමාලා	0.07	0.123
14	කාර්යක්ෂමතා කඩ ඉම් විභාග	0.02	0.02

3.10 පර්යේෂණ හා විශේෂ අධ්‍යයන අංශය

I. රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංගණනය


රටේ ප්‍රතිපත්ති සම්පාදනයට සහ ශ්‍රමබල සැලසුම් කිරීමට අවශ්‍ය රාජ්‍ය අංශයේ (මධ්‍යම රජය සහ පළාත් රාජ්‍ය) සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳව සහ එම නිලධාරීන්ගේ ප්‍රජාවිද්‍යාත්මක හා සමාජ ආර්ථික තොරතුරු සම්බන්ධයෙන් නිවැරදි සංඛ්‍යාලේඛන රැස්කිරීම සඳහා රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිලිබඳව සංගණනය සිදු කරනු ලැබේ. 2016 නොවැම්බර් මස 17 දිනට අදාළව රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල සිදු කරන ලද මෙම සංගණනයේදී සම්පූර්ණ කරන ලද මිලියන 1.1 වන සංගණන ප්‍රශ්නාවලිවල දත්ත සැකසුම් කටයුතු සිදු කිරීම, දත්ත විශ්ලේෂණය, වගු ලබා ගැනීම හා සංගණන අවසන් වාර්තාව සකස් කිරීමද මෙම වර්ෂය තුළ සිදුකරන ලදී.

ප්‍රස්තාරය 1: සේවා නියුක්ත අංශය අනුව රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයින්ගේ ප්‍රතිශතක ව්‍යාප්තිය, 2016



රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ මුළු සේවා නියුක්තිකයින් අතරින් 55.1% ක් පිරිමින් වන අතර 44.9% ක් කාන්තාවන් වේ. රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ මුළු සේවා නියුක්තිකයින් ස්ත්‍රී/පුරුෂ භාවය හා වයස් කාණ්ඩ අනුව මධ්‍යම රජය හා පළාත් රාජ්‍ය අංශ යටතේ ඇති ආයතන අතර බෙදී ගොස් ඇති ආකාරය පහත ප්‍රස්තාරය මගින් ඉදිරිපත් කර ඇත.

ප්‍රස්තාරය 2: වයස් කාණ්ඩ හා ස්ත්‍රී/පුරුෂ භාවය අනුව රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයින් සංඛ්‍යාව, 2016



II. පර්යේෂණ ධාරිතාවය වැඩිදියුණු කිරීමේ වැඩසටහන

දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ පර්යේෂණ හැකියාව වර්ධනය කිරීමේ අරමුණින් මෙම වැඩසටහන ආරම්භ කරන ලදී. පර්යේෂණ කටයුතුවල නියැලීමට කැමති දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරීන් 30 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් තෝරාගෙන එම නිලධාරීන්ට පර්යේෂණ කටයුතුවල නිරතවීම සඳහා අවශ්‍ය වන මූලික පුහුණුවක් ලබා දී පර්යේෂණ කටයුතුවල නියැලීමට අවස්ථාව ලබා දීම මෙමගින් සිදු කරන ලදී. මෙම මූලික පුහුණුව යටතේ පර්යේෂණ යෝජනාවලියක් සකස් කිරීම, පර්යේෂණ ක්‍රමවේද හා දත්ත විශ්ලේෂණය සඳහා වන "R" පරිගණක මෘදුකාංගය පිළිබඳව වූ පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

III. නිල සංඛ්‍යාති පර්යේෂණ අධ්‍යයනයන්

නිල සංඛ්‍යාති ක්ෂේත්‍රයේ පවත්නා ගැටළු හඳුනාගෙන එම ගැටළු නිරාකරණය කරගැනීමේ අරමුණෙන් පර්යේෂණ කටයුතු සිදු කිරීම මෙම වැඩසටහනේ අරමුණ වේ. මේ අනුව දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන නිල සංඛ්‍යාති සම්බන්ධව, පර්යේෂණ සිදු කළ යුතු ක්ෂේත්‍ර 6ක් හඳුනාගෙන එම ක්ෂේත්‍ර සඳහා පර්යේෂණ කණ්ඩායම් පත්කිරීමත් ඒ අනුව එම පර්යේෂණ කණ්ඩායම් විසින් පර්යේෂණ කටයුතු සිදු කිරීම ආරම්භ කිරීමත් මෙම වර්ෂය තුළදී සිදු කරන ලදී. මෙම පර්යේෂණ කණ්ඩායම්, පර්යේෂණය සඳහා තෝරාගත් ක්ෂේත්‍රය තුළ දැනට රාජකාරී සිදු කරනු ලබන නිලධාරීන්ගෙන් සහ පර්යේෂණ හා විශේෂ අධ්‍යයන අංශයේ නිලධාරීන්ගෙන්ද සමන්විත වන පරිදි පත් කර ඇත.

IV. දැනුම බෙදාහැරීමේ වැඩසටහන

පර්යේෂණ සම්මන්ත්‍රණයක් පැවැත්වීම මගින් දෙපාර්තමේන්තුවේ පර්යේෂණ කටයුතුවල නිරත වන නිලධාරීන්ට තම පර්යේෂණ ලිපි ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාවක් ලබා දීමත් අනෙකුත් නිලධාරීන්ට පර්යේෂණ සම්මන්ත්‍රණය සඳහා සහභාගිවීමෙන් තම දැනුම වර්ධනය කරගැනීම සඳහා අවස්ථාවක් ලබාදීමත් මෙම වැඩසටහනේ අරමුණ වේ. මෙම වැඩසටහන පැවැත්වීම 2018 දෙසැම්බර් මසට යොදා තිබුන නමුත් නොවැලැක්විය හැකි හේතුවක් නිසා එය කල්දැමීමට සිදුවිය. එසේ වුව ද එය ජනවාරි සම මුල් සති දෙක තුළ පැවැත්වීමට අවශ්‍ය සියලු කටයුතු සංවිධානය කෙරිණි.

V. ස්ත්‍රී පුරුෂ භාවය අනුව සංඛ්‍යාති සකස් කිරීම (Preparing Gender Statistics)

ස්ත්‍රී/පුරුෂ භාවයට අදාළ සංඛ්‍යාති ප්‍රකාශයට පත්කිරීම සඳහා වන වෙබ් පිටුව යාවත්කාලීන කිරීම සඳහා සහ ස්ත්‍රී/පුරුෂ භාවයට අදාළ සංඛ්‍යාති ඇතුළත්ව සකස් කිරීමට නියමිත ප්‍රකාශනය සඳහා අවශ්‍ය වන දත්ත එක් රැස් කිරීම වෙනුවෙන් විවිධ ආයතන වෙත දත්ත ඉල්ලීම් ඉදිරිපත් කිරීම, ඒ අනුව විවිධ ආයතනවලින් ලැබෙන දත්ත පරීක්ෂා කිරීම හා දත්තවල කිසියම් නොගැලපීමක් ඇත්නම් අදාළ ආයතන සම්බන්ධීකරණය කරමින් එම නොගැලපීම් නිවැරදි කරවා ගැනීම සිදු කිරීමත් , එම දත්ත හා දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන සංගණන හා සමීක්ෂණ මගින් ලබා ගන්නා දත්ත ඇතුළත් කර දත්ත වගු සකස් කිරීම හා පරීක්ෂා කිරීමත්, අවශ්‍ය අවස්ථාවල වෙබ් පිටුව යාවත්කාලීන කිරීමත් මෙම වර්ෂය තුළ සිදු කරන ලදී.

VI. දත්ත මුද්‍රාහැරීමේ ඉදිරි දින සටහන

වර්ෂය ආරම්භයේදී 2018 වර්ෂය සඳහා දත්ත මුද්‍රාහැරීම සඳහා වන ඉදිරි දින සටහන සකස් කර දෙපාර්තමේන්තු ඩෙව් අඩවියට ඇතුළත් කරන ලද අතර එතැන් සිට එහි යාවත්කාලීන කිරීම් සිදු කිරීම අඛණ්ඩව සිදු කරන ලදී.

VII. නිල සංඛ්‍යාති වැඩසටහන

නිල සංඛ්‍යාති වැඩසටහන මගින් රටේ විවිධ ආයතන සතු දත්ත උපයෝගීකරගෙන සකස් කළ හැකි දර්ශකාංක හඳුනාගෙන, එම දර්ශකාංක දත්ත පරිහරණය කරන්නන් වෙත විධිමත්ව ලබාදීම සඳහා අවශ්‍ය වැඩපිළිවෙලක් සකස් කිරීම සිදු කරයි. මෙම වැඩසටහන ජාතික දත්ත කමිටුවට අනුබද්ධ අනුකමිටු 23ක් හරහා සිදු කරනු ලබන අතර මෙහිදී එක් එක් විෂයයන්ට අදාල ප්‍රධාන ආයතන හඳුනාගෙන එම ආතතන වල

නියෝජිතයන්ගෙන් සැදුම්ලත් අනුකමිටු පිහිටුවා එම අනුකමිටු මගින් ක්ෂේත්‍රයට අදාළ දර්ශකාංක හඳුනාගෙන එම දර්ශකාංක සකස් කිරීමේ ක්‍රමවේදය, නිකුත් කරනු ලබන කාල පරාසය යනාදිය ඇතුළත් සම්පූර්ණ වාර්තාවක් සකස් කළ යුතු වේ. සෑම අනුකමිටුවකම වැඩ සම්පූර්ණයෙන් නිම කර අවසන් වාර්තාව භාරදී ඇති අතර මෙම අනුකමිටු වාර්තා තව දුරටත් විමර්ශනය කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරන ලදී. එහිදී අධ්‍යක්ෂවරු විසින් ලබා දෙන ලද අදහස් හා යෝජනා අනුව අනුකමිටු වාර්තා සංශෝධනය කිරීම සිදු කරන ලදී. ඒඅනුව අනුකමිටු වාර්තා 23න් 13 ක වැඩ සම්පර්ණයෙන් අවසන් කිරීමට හැකි වූ අතර ඉතිරි අනුකමිටු වාර්තා 10ට අදාළ කටයුතු තවදුරටත් සිදු කරමින් පවතී.

VIII. නිල සංඛ්‍යාති විවරණිකාව

දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් සිදු කරන ලද පර්යේෂණවලට අදාළව සකස් කරන ලද පර්යේෂණ ලිපි ප්‍රකාශයට පත් කිරීම; දෙපාර්තමේන්තුව තුළ නව වැඩසටහන් ආරම්භ කිරීම, නව තාක්ෂණික ක්‍රම හඳුන්වදීම වැනි අවස්ථාවලදී ඒ පිළබඳව දත්ත පරිහරණය කරනන්නන් දැනුවත් කිරීම සඳහා වන ලිපි යනාදිය ප්‍රකාශයට පත්කිරීම නිල සංඛ්‍යාති විවිරණිකාව මගින් සිදු කරනු ලැබේ. මෙහි පළමු වෙළුම සකස් කිරීමේ කටයුතු අවසන් කරන ලද අතර එය ප්‍රකාශයට පත්කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කෙරිණි.

2018 වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධනය පහතින් දැක්වේ.

අනු. අංකය	ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යයන්	2018 වර්ෂය සඳහා ඇස්තමේන්තු මුදල(රු. මිලියන)	2018.12.31 දක්වා වැය කරන ලද මුදල (රු. මිලියන)
01	රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංගණනය - 2016	1.35	0.536
02	පර්යේෂණ ධාරිතාවය වැඩි දියුණු කිරීමේ වැඩසටහන	1.00	0.789
03	නිල සංඛ්‍යාති පර්වය්ෂණ අධ්‍යයන	0.41	-
04	දැනුම බෙදාහැරීමේ වැඩසටහන	0.15	-


3.11 මිල හා වේතන අංශය

I. ජාතික පාරිභෝගික මිල දර්ශකය (NCPI) : පදනම 2013 = 100

ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013=100) ශ්‍රී ලංකාවේ උද්ධමනය මැනීමේ නිල මිණුම ලෙස 2015 ඔක්තෝම්බර් මාසයේ සිට භාවිතා කරනු ලැබේ. 2018, නොවැම්බර් මාසය දක්වා මුළු දිවයිනම ආවරණය වන පරිදි ජාතික පාරිභෝගික මිල දර්ශකය දර්ශකය (NCPI) (පාද වර්ෂය 2013 = 100) ගණනය කර සෑම මසකම මිල දර්ශකය, ඊළඟ මස 21 දින ගැසට් නිවේදනය, මාධ්‍ය නිවේදනය, පුවත්පත් මගින් සහ දෙපාර්තමේන්තු වෙබ්අඩවිය මගින් ප්‍රකාශයට පත් කිරීමේ කටයුතු සිදු කර ඇත.

2018, නොවැම්බර් මාසය දක්වා මාස්පතා දර්ශකාංකය ගණනය කිරීම පිළිබඳ තොරතුරු ඇතුලත් ප්‍රධාන මිල වෙනස්වීම් පෙන්නුම් කරන "ජාතික පාරිභෝගික මිල දර්ශකය" පුවත් නිවේදනය දෙපාර්තමේන්තු වෙබ්අඩවියේ ප්‍රකාශයට පත් කොට ඇත. එමෙන්ම 2018, නොවැම්බර් මාසය දක්වා මාස්පතා දර්ශකාංකය ගණනය කිරීම පිළිබඳ තොරතුරු ඇතුලත් ප්‍රධාන මිල වෙනස්වීම් පෙන්නුම් කරන "ජාතික පාරිභෝගික මිල දර්ශකය" ප්‍රවෘත්ති නිවේදනය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් සකස් කර දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇත. අදාල ප්‍රවෘත්ති වාර්තා මාධ්‍ය ආයතන වෙත ලබා දීම සඳහා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තු වෙත ලබා දී ඇත. මිල දර්ශකාංකය ඇතුලත් නිවේදනය දිනමිණ, ඩේලිනිවුස් හා තිනකරන් යන පුවත්පත් වල සිංහල, ඉංග්‍රීසි හා දෙමළ මාධ්‍යයෙන් ප්‍රකාශයට පත් කර ඇත. 2018 නොවැම්බර් මස දක්වා ගණනය කරන ලද ජාතික පාරිභෝගික මිල දර්ශකාංකය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇත. මිල දර්ශකාංකය නිකුත් කිරීමත් සමඟ මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සඳහා අවශ්‍ය කටයුතු වලට අදාල තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා දී ඇත. 2018 වසරේ ජනවාරි මස සිට නොවැම්බර් මස දක්වා ජාතික පාරිභෝගික මිල දර්ශකයේ සහ ලක්ෂ්‍යමය උද්ධමනයේ විචලනය පහත දැක්වේ.

වගු අංක 01: ජාතික පාරිභෝගික මිල දර්ශකයේ සහ ලක්ෂ්‍යමය උද්ධමනයේ විචලනය (පදනම 2013=100)



කම්කරු කොමසාරිස් ජනරාල්ගේ ඉල්ලීම පරිදි පඩි පාලක සභා ආඥාපණත යටතේ කරදමුංගු, කොකෝවා හා ගම්මිරිස් වගා කරුවන්ගේ විශේෂ ජීවන වියදම් දීමනාව ගණනය කිරීම සඳහා ජාතික පාරිභෝගික මිල දර්ශකයේ D1-D6 කාණ්ඩයට අදාලව පාරිභෝගික මිල දර්ශකය 2018, ජනවාරි මස සිට නොවැම්බර් මස දක්වා ගණනය කර කම්කරු දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇත.


II. පරීක්ෂණාත්මක මිලදී ගැනීමේ සමීක්ෂණය

කොළඹ පාරිභෝගික මිල දර්ශකය ගණනය කිරීමට අවශ්‍ය මිල තොරතුරු ලබා ගැනීම සඳහා මිල හා වේතන අංශයේ නිලධාරීන් විසින් කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශ ආවරණය වන පරිදි පරීක්ෂණාත්මක මිලදී ගැනීමේ සමීක්ෂණය සිදු කරනු ලැබේ. කොළඹ පාරිභෝගික මිල දර්ශකය ගණනය කිරීම සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික සීමාව තුල මධ්‍යස්ථාන 14 කින් භාණ්ඩ පැස සඳහා 2018 වසරේ ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා මිල ගණන් රැස් කිරීම සිදු කර ඇත. මෙහිදී තෝරාගත් භාණ්ඩ හා සේවාවන්හි මිල තොරතුරු අඛණ්ඩව තෝරාගත් වෙළඳසැල් වලින් එක් එක් භාණ්ඩය සඳහා සකසා ඇති පිරිවිතර තත්වයන්ට අනුකූලව එක්රැස් කරනු ලැබේ. 2018 වසරේ ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා ලැබී ඇති මිල තොරතුරු පරීක්ෂා කර පරිගණක ගත කර ඇත.

කොළඹ පාරිභෝගික මිල දර්ශකය (CCPI) : පදනම 2013=100

කොළඹ පාරිභෝගික මිල දර්ශකය මිල දර්ශකය(පාද වර්ෂය 2006/07 = 100), පාද වර්ෂය 2013 = 100 ලෙස 2017 ජනවාරි මාසයේදී යාවත්කාලීන කරන ලදී. කොළඹ දිස්ත්‍රික් නාගරික ප්‍රදේශ ආවරණය වන පරිදි 2013 පදනම් වර්ෂය ලෙස සලකා කොළඹ පාරිභෝගික මිල දර්ශකය 2017 ජනවාරි මස සිට ප්‍රකාශයට පත් කරනු ලබේ. ඒ අනුව 2017, දෙසැම්බර් මාසය දක්වා දර්ශකාංක ගණනය සෑම මාසයකම රාජකාරී ඉටුකරන අවසාන දින දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය මගින් ප්‍රකාශයට පත් කිරීමේ කටයුතු සිදු කර ඇත. එමෙන්ම 2017, දෙසැම්බර් මාසය දක්වා දර්ශකාංකය ගණනය කිරීම පිළිබඳ තොරතුරු ඇතුලත් ප්‍රධාන මිල වෙනස්වීම් පෙන්නුම් කරන "කොළඹ පාරිභෝගික මිල දර්ශකාංකය" පුවත් නිවේදනය මාසිකව දෙපාර්තමේන්තු වෙබ් අඩවිය මගින් ප්‍රකාශයට පත් කොට ඇත. මිල දර්ශකාංකය නිකුත් කිරීමත් සමඟ මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සඳහා අවශ්‍ය කටයුතු වලට අදාල තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත ලබා දීම සිදුකර ඇත. 2017 වසරේ ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ සහ ලක්ෂ්‍යමය උද්ධමනයේ විචලනය පහත දැක්වේ.

රූප සටහන 02: කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ සහ ලක්ෂ්‍යමය උද්ධමනයේ විචලනය
(පදනම 2013=100)



III. දිස්ත්‍රික් නාගරික සිල්ලර මිල ගණන් සහ නිෂ්පාදකයාගේ මිල ගණන් රැස් කිරීම

මෙම අංශය මගින් ඉටු කරනු ලබන තවත් කාර්යයක් වන්නේ ජාතික පාරිභෝගික මිල දර්ශකය ගණනය කිරීම සඳහා දිස්ත්‍රික් නාගරික සිල්ලර මිල ගණන් හා නිෂ්පාදකයාගේ මිල දර්ශකය ගණනය කිරීම සඳහා නිෂ්පාදකයාගේ මිල ගණන් රැස් කිරීමයි. පළමු, දෙවන, තෙවන සහ හතරවන කාර්තු සඳහා සියළුම දිස්ත්‍රික්ක වල ප්‍රධාන නගරයන්හි ආහාර හා විවිධ පාරිභෝගික භාණ්ඩ පිළිබඳ සිල්ලර මිල ගණන් සතිපතා, සති දෙකකට වරක්, මාසිකව හා කාර්තුමය පදනමක් මත දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශයට අනුයුක්ත නිලධාරීන්

විසින් එක් රැස් කර මෙම අංශය වෙත එවා ඇත. ඊට අමතරව නිෂ්පාදකයාගේ මිල දර්ශකය ගණනය කිරීම සඳහා දේශීයව නිෂ්පාදනය කෙරෙන කෘෂිකාර්මික, සත්ව හා ධීවර නිෂ්පාදන ද්‍රව්‍ය සඳහා නිෂ්පාදකයාගේ මිල ගණන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රමවත්ව, මාසිකව දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර සංඛ්‍යාන කාර්ය මණ්ඩලය යොදා ගැනීමෙන් එක් රැස් කරවා මිල හා වේතන අංශය වෙත ගෙන්වා පරීක්ෂා කර පරිගණක කර ඇත.

මිල තොරතුරු ඇතුලත් කර 2017 ජනවාරි සිට 2017 දෙසැම්බර් දක්වා සතිපතා සිල්ලර මිල ගණන් (කොළඹ දිස්ත්‍රික්කය) හි මිල විවරණිකාවේ 26 වන නිකුතුව මුද්‍රණය කර ප්‍රකාශනයට පත් කරන ලදී.

2014-2017 දක්වා විස්තර ඇතුලත් සිල්ලර සහ නිෂ්පාදකයාගේ මිල ගණන් පිලිබඳ විවරණිකාවේ 35 වන නිකුතුව මුද්‍රණය කර ප්‍රකාශනයට පත් කරන ලදී.

තවද, මෙම සිල්ලර මිල තොරතුරු සහ නිෂ්පාදකයාගේ මිල තොරතුරු ජාතික ගිණුම් ගණනය කිරීම සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ජාතික ගිණුම් අංශයට කාර්තුමය වශයෙන් (පළමු, දෙවන, තෙවන සහ හතරවන කාර්තු සඳහා) ලබා දී ඇත. මෙයට අමතරව දත්ත භාවිතා කරන්නන්ගේ අවශ්‍යතාවයන් සඳහාද මිල තොරතුරු ලබා දී ඇත. ආහාර ද්‍රව්‍ය, විවෘත වෙළඳ පොළ සිල්ලර මිල තොරතුරු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අදාළ නිළධාරීන් වෙත සතිපතා ඉදිරිපත් කර ඇත. මෙම මිල ගණන් දෙපාර්තමේන්තු වෙබ් අඩවියේද ප්‍රකාශයට ප්‍රකාශයට පත් කොට ඇත.

IV. නිෂ්පාදකයාගේ මිල දර්ශකය (PPI) : පදනම 2013 Q4=100

නිෂ්පාදකයාගේ මිල දර්ශකයේ කෘෂිකර්ම අංශයේ ගණනය කිරීම සඳහා කෘෂිකාර්මික නිෂ්පාදන 36 ක මිල තොරතුරු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අනුයුන්ත ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය මගින්ද, කර්මාන්ත අංශය සඳහා ගණනය කිරීම් වලට අදාල මිල තොරතුරු තෝරාගත් ආයතන 376 කින්ද, උපකාරක සේවා සඳහා විදුලිබල මණ්ඩලය හා ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මගින්ද 2018 නොවැම්බර් මස දක්වා තොරතුරු ලබා ගෙන පරිගණක ගත කර ඇත. සෑම මසකම නිෂ්පාදකයාගේ මිල දර්ශකය (PPI) (පාද වර්ෂය 2013 q4=100) එම මස අවසන් වී දින 45 කට පසුව දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරනු ලබයි. 2018 වසරේ ජනවාරි මස සිට නොවැම්බර් මස දක්වා නිෂ්පාදකයාගේ මිල දර්ශකයේ විචලනය පහත වගුව මගින් දැක්වේ. එමෙන්ම 2018, නොවැම්බර් මාසය දක්වා දර්ශකාංකය ගණනය කිරීම පිළිබඳ තොරතුරු ඇතුලත් ප්‍රධාන මිල වෙනස්වීම් පෙන්නුම් කරන ‘‘නිෂ්පාදකයාගේ මිල දර්ශකාංකය‘‘ පුවත් නිවේදනය මාසිකව දෙපාර්තමේන්තු වෙබ් අඩවිය මගින් ප්‍රකාශයට පත් කොට ඇත.

වගු අංක 03: නිෂ්පාදකයාගේ මිල දර්ශකයේ විචලනය (පදනම 2013 Q4=100)

මාසය	දර්ශක අගය
	2017
ජනවාරි	129.3
පෙබරවාරි	129.8
මාර්තු	133.5
අප්‍රේල්	133.1
මැයි	135.2
ජුනි	136.8
ජුලි	135.0
අගෝස්තු	132.4
සැප්තැම්බර්*	129.1
ඔක්තෝම්බර්*	130.7
නොවැම්බර්*	135.7
දෙසැම්බර්**	137.6

*සටහන : * - සංශෝධිත * * - යාවකාලිකයි*

V. ආසියානු පැසිපික් කලාපයේ ජාත්‍යන්තර සංසන්දනාත්මක වැඩසටහන (International Comparision Programme)

ආසියානු සංවර්ධන බැංකුව මෙහෙයවීමෙන් කරනු ලබන ආසියානු පැසිපික් කලාපයේ ජාත්‍යන්තර මිල සංසන්දනාත්මක වැඩසටහන (ICP) යටතේ 2018, 1 වන කාර්තුවට අදාලව ගෘහ ඒකකයන් විසින් පරිභෝජනය කරනු ලබන ආහාර සහ ආහාර නොවන අයිතමයන්ගේ මිල තොරතුරු මුළු දිවයිනම ආවර්ණය වන පරිදිද, යන්ත්‍රෝපකරණ හා උපකරණ, ඉදිකිරීම් වල මිල තොරතුරු - කොළඹ දිස්ත්‍රික්කය ආවරණය වන පරිදිද එක් රැස් කොට ඇත.

ඉහත සියලු මිල තොරතුරු 2018, 2 වන කාර්තුව තුල පරීක්ෂා කර, පරිගණකගත කොට ආසියානු සංවර්ධන බැංකුව වෙත යවා ඇත.

2018, 3 වන කාර්තුව තුල මුළු දිවයිනම ආවරණය වන පරිදි නිවාස කුලිය පිළිබඳ තොරතුරු එක් රැස් කොට ඇත

2018, 4 වන කාර්තුව තුල ඉහත නිවාස කුලිය සම්බන්ධයෙන් එකතු කරන ලද මිල තොරතුරු පරීක්ෂා කර, පරිගණක ගතකොට ආසියානු සංවර්ධන බැංකුව වෙත යවා ඇත. එමෙන්ම මෙම කාර්තුව තුල රජය විසින් සිදු කරනු ලබන වේතන සඳහා අදාල මිල තොරතුරු එක්රැස් කොට, පරීක්ෂා කර, පරිගණකගත කොට ආසියානු සංවර්ධන බැංකුව වෙත යවා ඇත.

VI. ත්‍රිවිධ හමුදා සේවා පුද්ගලයන්ගේ සලාක දීමනාව ගණනය කිරීම

රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි, 2018 වර්ෂය සඳහා මාසිකව ගණනය කරන ලද ත්‍රිවිධ හමුදා සේවා පුද්ගලයන්ගේ සලාක වටිනාකම යුධ හමුදාපති වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සකස් කර ඇත.

VII. ජාතික පාර්භෝගික මිල දර්ශකයේ පාද වර්ෂය යාවත්කාලින කිරීම

ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය - 2016 ඇසුරින් සියලු පලාත් සඳහාද, කොළඹ දිස්ත්‍රික්කය, බස්නාහිර පලාත - (කොළඹ දිස්ත්‍රික්කය හැර) මූලික සියලු බර තැබීම් ව්‍යුහයන් සකස් කොට, විශ්ලේෂණය කර අවසන් කර ඇත.
ඒමෙන්ම ජාතික පාරිභෝගික මිල දර්ශකයේ පාද වර්ෂය යාවත්කාලින කිරීමට අදාල 'Work sheet' එක සකස් කර ඇත.

VIII. **නිෂ්පාදකයාගේ මිල දර්ශකයේ පාද වර්ෂය යාවත්කාලින කිරීම**

නිෂ්පාදකයාගේ මිල දර්ශකයේ පාද වර්ෂය යාවත්කාලින කිරීමක් සමඟ එහි ආවරණ පථය සේවා හා ඉදිකිරීම් අංශ ඇතුලත් වන පරිදි පුළුල් කර ඇත. සේවා සහ ඉදි කිරීම් අංශයේ බර තැබීම් ව්‍යුහය ආර්ථික සංගණනය 2013/14 ඇසුරින් සකස් කොට අවසන් කර ඇත. තවද එම බර තැබීම් ව්‍යුහය ඇසුරින් සේවා හා ඉදිකිරීම් අංශයට අයත් ආයතන ලැයිස්තුව සකස් කර ඇත. එමෙන්ම ඒ සම්බන්ධ නියමු සමීක්ෂණය සිදු කොට ඇත. එම ආයතනයන්හි අදාල තොරතුරු හා දත්ත රැස් කිරීමට අදාල පෝරම සකස් කර අවසන් කර ඇත.

මූල්‍ය කාර්ය සාධනය - 2018


අනු අංකය	ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යයන්	**2018** වර්ෂය සඳහා ඇස්තමේන්තු මුදල (රු.මිලි.)	වැය කරන ලද මුදල (රු.මිලි.) **2018/12/31** දක්වා
01	පරීක්ෂණාත්මක මිලදී ගැනීමේ සමීක්ෂණය	0.870	0.722
02	දිස්ත්‍රික් නාගරික සිල්ලර මිල ගණන් රැස් කිරීමේ වැඩ සටහන	0.404	0.404
03	නිෂ්පාදන හා උපයෝගිතා අංශ වල මිල ගණන් රැස් කිරීමේ වැඩ සටහන		
04	ජාතික පාරිභෝගික මිල දර්ශකය (NCPI) ගණනය කිරීම		
08	ජාත්‍යන්තර මිල සංසන්දනාත්මක වැඩසටහන (ICP)	3.814	2.555

3.12 සිතියම් විද්‍යා අංශය

ජන හා නිවාස සංගණනය - 2021



ජන හා නිවාස සංගණනයක ප්‍රථම අදියර වන සිතියම් සකස් කිරීම, සංගණනයෙහි තොරතුරු රැස් කිරීමට වර්ෂ කිහිපයකට පෙර ආරම්භ කරනු ලබයි. ඒ අනුව, 2021 වර්ෂයේ පැවැත්වීමට නියමිත ජන හා නිවාස සංගණනය සඳහා පියවර තුනකින් යුක්ත වූ සිතියම් සකස් කිරීමේ කාර්යය 2017-2020 කාල වකවානුව තුල සිදු කිරීමට සැලසුම් කරන ලදී. මෙහිදී, පසුගිය සංගණනය සඳහා සකස් කරන ලද ග්‍රාම නිලධාරී කොට්ඨාස සිතියම් පරිගණකගත කර නව අංකිත සිතියමක් සකස් කිරීමත්, ක්ෂේත්‍රයේ දී ඒවායෙහි නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම සහ සංගණන කාණ්ඩ වෙන් කිරීමත්, එලෙස හඳුනා ගන්නා ලද සංගණන කාණ්ඩ මායිම් පරිගණකගත කිරීමත් යන කාර්යයන් මෙම පියවර තුනේ දී සිදු කිරීමට සැලසුම් කර ඇත.



එම සැලසුම් අනුව, 2018 වර්ෂය සඳහා නියමිත දිස්ත්‍රික්ක 08හි ක්ෂේත්‍ර කටයුතු ආරම්භ කරන ලදී. මේ වන විට එම දිස්ත්‍රික්ක වල ක්ෂේත්‍ර කටයුතු අවසන් වෙමින් පවතින අතර සංගණන කාණ්ඩ පරිගණකගත කිරීම ද ආරම්භ කර ඇත. 2018 වර්ෂය අවසන් වන විට දිස්ත්‍රික්ක 18ක ක්ෂේත්‍ර කටයුතු ආරම්භ කර ඇති අතර ඉන් දිස්ත්‍රික්ක 11ක් ක්ෂේත්‍ර කටයුතු අවසන් කර ඇත. ඒ අතුරින් දිස්ත්‍රික්ක 03ක සංගණන කාණ්ඩ අංකිත කිරීමේ කටයුතු ද අවසන් කර ඇත.

මූල්‍ය කාර්ය සාධනය - 2018

අනු අංකය	ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යයන්	2018 වර්ෂය සඳහා ඇස්තමේන්තු මුදල (රු. මිලියන)	2018/12/31 දක්වා වැයකරන ලද මුදල (රු. මිලියන)
01	ක්ෂේත්‍ර කටයුතු සැලසුම් කිරීම, ග්‍රාම නිලධාරී කොට්ඨාස මායිම් පරීක්ෂා කිරීම හා ලකුණු කිරීම, සිතියම් මුද්‍රණය කිරීම හා උපදෙස් පොත් සකස් කිරීම ආදිය	8.31	7.10
02	දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන කාර්ය මණ්ඩලය සහ ග්‍රාම නිලධාරීන් සිතියම් පරීක්ෂා කිරීම සඳහා පුහුණු කිරීම. (කුරුණෑගල, මොනරාගල, බදුල්ල, රත්නපුර, කෑගල්ල, මහනුවර, මාතලේ හා නුවරඑළිය දිස්ත්‍රික්ක)	2.47	2.40
03	ග්‍රාම නිලධාරීන්ගේ උපකාර සහිතව ග්‍රාම නිලධාරී කොට්ඨාස සිතියම්වල නිරවද්‍යතාවය සලකුණු කිරීම, සංගණන කාණ්ඩ ලකුණු කිරීම (කුරුණෑගල, මොනරාගල, බදුල්ල, රත්නපුර, කෑගල්ල, මහනුවර, මාතලේ හා නුවරඑළිය දිස්ත්‍රික්ක.)	31.22	3.42

3.13 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය

දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන සංගණන හා සමීක්ෂණවල දත්ත සැකසුම් කටයුතු ද ඇතැම් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවලට අනුයුක්ත සංඛ්‍යාලේඛන අංශ වලට අයත් දත්ත සැකසුම් කටයුතුද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය මඟින් සිදු කරන ලදී.

I. **කෘෂිකාර්මික ගෘහ ඒකක සමීක්ෂණය**
දත්ත රැස් කිරීම අවසන් වී ඇත (සම්පූර්ණ වගා වර්ෂය සඳහා). දත්ත සකස් කිරීම හා වගු ලබා ගැනීමට නියමිතය.

II. **රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයින්ගේ සංගණනය**
අදාල කාර්යයන් සම්පූර්ණයි.

III. **රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයින්ගේ සංගණනය - වත්කම් කළමණාකරණය**
දත්ත පරිගණකගත කිරීම සිදුකරමින් පවතී.

IV. **කාල පරිහරණ සමීක්ෂණය**
- දත්ත ඇතුලත් කිරීමේ කාර්යයන් සම්පූර්ණයි.
- දත්ත සැකසීමේ කාර්යයන් සම්පූර්ණ කරමින් පවතී.

V. **සංචාරක ව්‍යදම් සමීක්ෂණය**
දත්ත ඇතුලත් කිරීමේ කාර්යයන් සම්පූර්ණයි.

VI. **මිල රැස් කිරීම සඳහා වූ CAPI පරිගණක වැඩසටහන**
දත්ත ඇතුලත් කිරීමේ කාර්යයන් සම්පූර්ණයි.

VII. **ශ්‍රම බල සමීක්ෂණය CAPI**
LFS-CAPI භාවිතයෙන් 2018 දත්ත එක්රැස් කිරීම සිදු කරමින් පවතී.

VIII. **ගෘහ ඒකක ආදායම් ව්‍යදම් සමීක්ෂණය-2019**
දත්ත ඇතුලත් කිරීමේ කාර්යයන් සහ දත්ත සැකසීමේ කාර්යයන් සම්පූර්ණ කරමින් පවතී.

IX. **සංඛ්‍යාන ව්‍යාපෘති නාමාවලිය (SBR) වැඩිදියුණු කිරීම (දෙවන අදියර)**
යාවත්කාලීන කාර්යයන් සම්පූර්ණයි.

X. **Survey Sampling with CAPI Listing (pilot)**
පරිගණක වැඩ සටහන ගැටළුවකින් තොරව ක්‍රියා කරමින් පවතී.

XI. **ජන හා නිවාස සංගණනය 2021 - තොරතුරු තාක්ෂණ කටයුතු**
* Q Design * Listing Form Design * CPH-2021 සංගණනයේ නව තාක්ෂණ හඳුන්වාදීම් සිදුකර ඇත.

XII. **ICT Usage survey (ICTA) data entry & systems development**
අදාල තොරතුරු ලබාදී නොමැත.

XIII. **කාර්මික නිෂ්පාදන සමීක්ෂණය (කාර්තුමය)**
Web Base Program සංවර්ධනය කර ඇත. ආරක්ෂණ විධාන යෙදීමට ඇත.

XIV. **වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය**
Web Base Program සංවර්ධනය කරමින් පවතී.

xv. **වෙළඳ හා සේවා සමීක්ෂණය**
දත්ත රැස් කිරීම සඳහා web based system සූදානම් කර ඇත.

xvi. **පාසල් සංගණනය -2018**
Data Entry & Verification කාර්යයන් සම්පූර්ණ කර ඇත.

xvii. **Big Onion Survey**
දත්ත ඇතුලත් කිරීමේ කාර්යයන් සහ දත්ත සැකසීමේ කාර්යයන් සම්පූර්ණ කරමින් පවතී.

xviii. **GATTS - Stage I (WHO)**
WHO මගින් අදාල ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇත.

xix. **CPH 2021 Developing Geographical Technologies for field enomerators (CAFÉ)**
වැඩසටහන් සකස් කර ඇත.

xx. **SBR data linkage and comparison system**
පරිගණක වැඩ සටහන ගැටළුවකින් තොරව ක්‍රියා කරමින් පවතී.

xxi. **LPAP Monitoring System**
මිල හා වේතන අංශය විසින් භාවිතා කරනු ලැබේ.

xxii. **සහශ්‍ර සංවර්ධන ඉලක්ක (SDG) වෙබ් පිටුව වැඩි දියුණු කිරීම හා පාලනය**
අවශ්‍ය යාවත්කාලීන කිරීම සිදුකරයි.

xxiii. **Web පිටුව යාවත්කාලීන කිරීම**
අවශ්‍ය යාවත්කාලීන කිරීම් එදිනෙදා සිදුකරයි

xxiv. **Server Room enhancement**
Precision AC සඳහා ප්‍රසම්පාදනය කර ඇත.

xxv. **DCS Server room power supply and Enhancement extending web & email services**
අදාල කාර්යයන් සිදුකරමින් පවතී.

xxvi. **Progress Monitoring System for Kaspersky virus guard**
අදාල කාර්යයන් සම්පූර්ණ කරන ලදි.

xxvii. **පරිගණක ජාල පද්ධතිය වැඩි දියුණු කිරීම**
Security scanning සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

xxviii. **පරිගණක නඩත්තු කිරීම හා අළුත්වැඩියා කිරීම**
දෙපාර්තමේන්තුවේ සමස්ථ පරිගණක හා උපාංග නඩත්තු කිරීම හා අළුත්වැඩියාවන් සිදුකරමින් පවතී.

xxix. **LMS enhancement**
LMS පද්ධතිය ස්ථාපනය කර තොරතුරු ඇතුලත් කිරීම (Training Materials) සඳහා පුහුණු අංශයට ලබාදී ඇත.

3.14 දත්ත නිකුත් කිරීමේ ඒකකය

I. ක්ෂුද්‍ර දත්ත නිකුත් කිරීම

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍ර දත්ත නිකුත් කිරීමේ ප්‍රතිපත්තිය (Dissemination Policy on MicroData) අනුව 2018 වර්ෂය තුළදී දත්ත ඉල්ලීම් 86 ක් සඳහා නොමිලයේ ද ඉල්ලීම් 4 කට මුදල අයකිරීම් මත ද දත්ත ලබා දී ඇත.

II. පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම

ශ්‍රී ලංකා ජනරජයේ පාර්ලිමේන්තුවෙහි ගරු මැති ඇමතිවරුන්ගේ වාචික ප්‍රශ්න එකක් සඳහා 2018 වර්ෂය තුළදී පිළිතුරු සපයා ඇත.

III. වෙනත් ආයතන වල දත්ත ඉල්ලීම් සඳහා තොරතුරු ලබාදීම

දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලබන විවිධ අමාත්‍යාංශ,දෙපාර්තමේන්තු අනෙකුත් රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන සහ පුද්ගලයින් විසින් කරනු ලබන දත්ත ඉල්ලීම් සඳහා අදාල තොරතුරු සැපයීමද දත්ත නිකුත් කිරීමේ ඒකකය මඟින් සිදුකරනු ලබයි. 2018 වර්ෂය තුළදී සාමාන්‍ය තැපෑල මඟින් හා විද්‍යුත් තැපෑල මඟින් ලද දත්ත ඉල්ලීම් 117 කට පමණ තොරතුරු සැපයීම සිදු කර ඇත. මීට අමතරව දුරකථනය මඟින් සහ ඒකකය වෙත පැමිණ කරනු ලබන විමසිම් සඳහා තොරතුරු ලබාගැනීමට මාර්ගෝපදේශකත්වය සපයා ඇත.

IV. තොරතුරු දැන ගැනීමේ පනත යටතේ තොරතුරු සැපැයීම

2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිලිබඳ පනත 2017 පෙබරවාරි 01 වැනි දින සිට බලාත්මක කරන ලදී. ඒ අනුව තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ලැබෙන ඉල්ලීම් පිළිබඳ සම්බන්ධීකරණය දත්ත නිකුත් කිරීමේ ඒකකය මඟින් සිදු කෙරේ.

2018 වර්ෂය තුල තොරතුරු දැන ගැනීමේ පනත යටතේ දත්ත ඉල්ලීම් 42 කට සහ අභියායවනා 12 කට අදාලව තොරතුරු සැපැයීමට අවශ්ය කටයුතු සිදු කර ඇත.

V. දෙපාර්තමේන්තු ප්‍රකාශන අලෙවි කවුළුව පවත්වාගෙන යාම

දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන මුද්‍රිත ප්‍රකාශන අළෙවිය මෙම ඒකකයෙහි පිහිටුවා ඇති අලෙවි කවුළුව මඟින් සිදු කෙරේ. 2018 වර්ෂය තුළදී ප්‍රකාශන පිටපත් 558 ක් අලෙවි කර ඇත.

VI. ක්ෂුද්‍ර දත්ත නිකුත් කිරීමේ ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම

සංශෝධිත ක්ෂුද්‍ර දත්ත නිකුත් කිරීමේ ප්‍රතිපත්තිය තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය පරිදි විශේෂ කමිටුවක් පිහිටුවන ලදී. කමිටුව විසින් පෙන්වා දෙන කරුණු ඇතුළත් කර සංශෝධිත කෙටුම්පත කමිටුවේ නිර්දේශයට යොමුකිරීමට නියමිතව ඇත.

3.15 මුද්‍රණ අංශය

දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලැබූ සංගණන හා සමීක්ෂණ වල පහත නම් සඳහන් වාර්තා මෙන්ම ඊට අදාල උපලේඛන, ප්‍රශ්නාවලීන් හා උපදෙස් අත්පොත් දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලය මගින් මුද්‍රණය කිරීම සිදු කරන ලදී.

- Labour force 2 nd Quarter Report
- සංචාරක ව්‍යදම් සමීක්ෂණ උපලේඛන - දෙමළ
- සංචාරක ව්‍යදම් සමීක්ෂණ උපලේඛන - සිංහල
- කාල පරිහරණය සංඛ්‍යාතීන් වර්ගීකරණ උපදෙස් පොත
- Labour Force Final Report
- Work Plan -2018
- ශ්‍රමබල සමීක්ෂණ උපලේඛන
- Paddy Statistics . 2016/17 Maha
- අර්තාපල් නිෂ්පාදන සමීක්ෂණ වාර්තාව
- Statistical Hand Book - Gampaha / Vavuniya/ Kandy/ Moneragala/ Nuwara Eliya/ Polonnaruwa/ Kegalle/ Puttlam/ Hambantota/ Kurunegala/ Baticaloa/ Badulla/Galle/Rathnapura/Matara
- HIES Final Report
- Labour Force - 2017 3rd Quarter
- Statistical News Letter – 2017 2nd Quarter
- Local Government Forms
- Atlas of Economic Activities 2013/14
- Labour Force Schedules - Tamil
- Labour Force Leaflet - Sinhala, Tamil
- සංඛ්‍යාන නිබන්ධනය-2018
- Atlas of Economic Activities 2013/14
- Index of Industrial Production 4 th Quarter
- Paddy Statistics 2017- yala
- ශ්‍රමබල සමීක්ෂණය සංශිප්ත වාර්තාව-2017
- Labour Force 4th Quarter - 2017
- අමාත්‍යාංශ කාර්යසාධන වාර්තාව-2017, CD කවර
- Weekly Retail Pricess-2018
- Index of Industrial Production
- දෙපාර්තමේන්තු කාර්යසාධන වාර්තාව-2017
- කෘෂිකාර්මික ගෘහ ඒකක සමීක්ෂණය 2017/18 ප්‍රශ්නාවලිය - සිංහල
- Annual Survey of Industrial Final Report-2016
- කෘෂිකාර්මික ගෘහ ඒකක සමීක්ෂණය 2017/18 ප්‍රශ්නාවලිය - දෙමළ
- Labour Demand Survey -2017
- රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංගණනය - 2016 අවසන් වාර්තාව
- කාර්මික නිෂ්පාදන දර්ශක වාර්තාව
- Estimated Extend & Production of Potatoes February 2018
- සංඛ්‍යාන දත්ත පත්‍රිකාව - සිංහල ,දෙමල,ඉංග්‍රීසි
- Economic Census 2013/14 Agriculture Activities
- Data Sheet V 2025 Enterprise Sri- Lanka
- School Census - 2017
- Index of Industrial Production 1 st Quarter -2018
- ආර්ථික සංගණනය - 2013/14 වතු සංගණනය අවසන් වාර්තාව
- Statistical News Letter 1වන වෙළුම - 2018

- Survey of Construction Industries - 2016
- Economic Statistics of Sri- Lanka
- Statistical Pocket Book English
- සංඛ්‍යාන අත්පොත 2018 (සිංහල /දෙමළ)
- Bulletin of Retail and Producer price
- Labour Force 1 st Quarter
- HIES උපදෙස් පොත් (සිංහල /දෙමළ)
- IIP Bulletin 3rd Quarter
- Computer Literacy - 2017 Annual
- Labour Force Leaflet
- HIES සමීක්ෂණ ප්‍රශ්නාවලි-2019
- P1 ෆෝරම, F1 ෆෝරම, ආරාධනා පත්‍ර, ලිපි ශීර්ෂ, සහතික පත්‍ර, දෙපාර්තමේන්තු සටහන් පොත් ආදී.

3.16 ආයතනික හා ගිණුම් අංශය

3.16.1 පරිපාලනය

I. අංශ හා ඒකක

පහත දැක්වෙන තාක්ෂණික හා සේවා අංශ 15 ක් සහ ඒකක 4 ක් මගින් 2018 වසර තුල කාර්යයන් මෙහෙයවන අතර අභ්‍යන්තර විගණන අංශයකින් ද සමන්විත වේ.

1 වන අංශය ජන සංගණන හා ප්‍රජා විද්‍යා
2 වන අංශය කර්මාන්ත, ඉදිකිරීම්, වෙළඳ හා සේවා
3 වන අංශය කෘෂිකර්ම හා පාරිසරික
4 වන අංශය ජාතික ගිණුම්
5 වන අංශය ප්‍රකාශන
6 වන අංශය පුස්තකාල හා ප්‍රලේඛන
7 වන අංශය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ
8 වන අංශය ආයතනික හා ගිණුම්
9 වන අංශය නියැදි සමීක්ෂණ
10 වන අංශය මුද්‍රණ
11 වන අංශය ක්ෂේත්‍ර කළමනාකරණ
12 වන අංශය පුහුණු
15 වන අංශය පර්යේෂණ හා විශේෂ අධ්‍යයන
16 වන අංශය මිල හා වේතන
18 වන අංශය සිතියම් විද්‍යා
දත්ත නිකුත් කිරීමේ ඒකකය
අන්තර්ජාතික සංඛ්‍යාලේඛන ඒකකය
තිරසාර සංවර්ධන අභිමතාර්ථ පිළිබඳ ඒකකය
ආපදා කළමනාකරණ සංඛ්‍යාලේඛන ඒකකය
අභ්‍යන්තර විගණන අංශය

II. අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල පිහිටි ශාඛා කාර්යාල

මෙම දෙපාර්තමේන්තුව විසින් විවිධ දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශ තුල ශාඛා කාර්යාල 36 ක් පමණ පවත්වාගෙන යයි. මෙම ශාඛා කාර්යාල නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු, ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥවරයෙකු, සංඛ්‍යාලේඛනඥවරයෙකු, සංඛ්‍යාලේඛන නිලධාරීවරයෙකු හෝ සංඛ්‍යාලේඛන සහකාර නිලධාරීවරයෙකු යටතේ පවතී.

III. දිස්ත්‍රික් කාර්යාල

දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුයුක්ත කොට ඇති දිස්ත්‍රික් කාර්යාල 25 ක් සහ මහවැලි සංවර්ධන බල ප්‍රදේශයට අයත් මහවැලි එච් කලාපයේ තඹුත්තේගම එක් කාර්යාලයක් ද වේ. මෙම කාර්යාල නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු, ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥවරයෙකු හෝ සංඛ්‍යාලේඛනඥවරයෙකු භාරයේ පවතින අතර ඔහුට සහාය වීමට සංඛ්‍යාලේඛන නිලධාරීන් සහ සංඛ්‍යාලේඛන සහකාරවරුන් ද අනුයුක්ත කොට ඇත. ඒ ඒ දිස්ත්‍රික්කය තුළ දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන සමීක්ෂණ, සංගණන වලට අදාලව දත්ත රැස් කිරීම මෙම කාර්යාල මඟින් සිදු කෙරේ. දිස්ත්‍රික්කය තුළ සංඛ්‍යාලේඛන කටයුතු පිළිබඳ සම්බන්ධීකරණය කරනු ලබන්නේද මෙම දිස්ත්‍රික් කාර්යාල මඟිනි.

IV. පළාත් සභාවල සංඛ්‍යාලේඛන කාර්ය මණ්ඩලය

වෘත්තීය දක්ෂතා පෙන්වන සංඛ්‍යාලේඛන කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කරමින් පළාත් සභාවල සංඛ්‍යාලේඛන සේවාව සැපයීම දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී. මේ අනුව කාර්ය මණ්ඩලය පළාත් සභාවලට අනුයුක්ත කර ඇත. වඩාත් සුදුසු සංඛ්‍යානමය සම්බන්ධීකරණය, සංඛ්‍යාලේඛන ප්‍රමිතීන් පවත්වාගෙන යාම හා කාර්ය මණ්ඩලයේ උපරිම ප්‍රයෝජන ලබා ගැනීම මෙමගින් තහවුරු කර ඇත.

v. කාර්ය මණ්ඩලය

	තනතුර	අනුමත සංඛ්‍යාව	2018.12.31 දිනට සංඛ්‍යාව	පුරප්පාඩු
1	අධ්‍යක්ෂ ජනරාල්	1	1	0
2	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංඛ්‍යාන)	3	1	2
3	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (තොරතුරු තාක්ෂණ)	1	0	1
4	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(පරිපාලන)	1	1	0
5	අධ්‍යක්ෂ (සංඛ්‍යාන)	16	8	8
6	අධ්‍යක්ෂ (පරිපාලන)	1	1	0
7	අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ)	2	0	2
8	ප්‍රධාන ගණකාධිකාරී	1	1	0
9	ප්‍රධාන අභ්‍යන්තර විගණක	1	1	0
10	නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංඛ්‍යාන)	36	0	36
11	නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ)	6	3 (තවත් නිලධාරීන් 3 දෙනෙකු තො.ස.තා. සේවයේ 1 පංතියේ II ශ්‍රේණියට උසස් වී ඇත.)	0
12	නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (පරිපාලන/ ආයතන)	2	0	2
13	සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ)	15	7	8
14	ගණකාධිකාරී	2	2	0
15	අභ්‍යන්තර විගණක	1	0	1
16	ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ	37	21	- ◊
17	සංඛ්‍යාලේඛනඥ	200	105	74 ®
18	මුද්‍රණ කළමණාකරු	1	0	1
19	නීති නිලධාරී	1	0	1
20	පරිපාලන නිලධාරී	1	1	0
21	සංඛ්‍යාලේඛන සැලසුම්කරු	1	0	1
22	පුස්තකාලයාධිපති (විශේෂ)	1	0	1
23	පුස්තකාලයාධිපති	3	3	0
24	භාෂා පරිවර්තක	3	2	1

25	සංස්කාරක (ඉංග්‍රීසි/ දෙමළ) (කොන්ත්‍රාත් පදනම මත)	2	0	2	
26	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී 2 පන්තිය II,I ශ්‍රේණි	30	9	21	
27	සංඛ්‍යාලේඛන නිලධාරී	494	364	130	
28	සංවර්ධන නිලධාරි	64	55	9	
29	සංඛ්‍යාලේඛන සහකාර	202	120	0	•
30	අයවැය සහකාර	1	1	0	•
31	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර 3 පන්තිය III,II,I ශ්‍රේණිය	262	212	50	
32	මුද්‍රණ නිමැවුම්කරු	5	0	5	
33	මුද්‍රණ කාර්මික	2	0	2	
34	කාර්මික නිලධාරී	1	0	1	
35	පෙර මුද්‍රණ සැලසුම්කරු	3	0	3	
36	ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු	1	0	1	
37	පද්ධති පාලක	6	2	0	◊
38	ජ්‍යෙෂ්ඨ පද්ධති ක්‍රියාකරු	3	2	0	◊
39	වැඩමූලික (මුද්‍රණ)	1	1	0	
40	රාජ්‍ය කළමණාකරණ සහකාර	170	149	21	
41	දත්ත සටහන් ක්‍රියාකරු	5	4	0	◊
42	දත්ත සටහන් ක්‍රියාකරු/ කේත ලිපිකරු	33	30	3	
43	ලිපිකරු (සිංහල මාධ්‍ය)	10	6	4	
44	ලිපිකරු (දෙමළ මාධ්‍ය)	20	16	4	
45	කැමරා ක්‍රියාකරු	1	1	0	◊
46	ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරු	1	0	0	
47	තහඩු සාදන්නා	1	1	0	
48	යන්ත්‍ර පරිචාරක	2	2	0	◊
49	ටයිප් සෙටර්	1	1	0	
50	රියදුරු	55	50	5	
51	වායු සමීකරණ යන්ත්‍ර ක්‍රියාකරු	1	1	0	◊
52	මුද්‍රණ යන්ත්‍ර සහයක	1	0	1	
53	කාර්යාල කාර්ය සහයක තනතුරු	107	77	30	
54	කාර්යාල කාර්ය සහයක තනතුරු (දෙපාර්තමේන්තුගත)	10	9	1	
55	ජල නල කාර්මික	1	0	1	
56	විදුලි කාර්මික	1	0	1	
57	සංචාරක බංගලා භාරකරු	1	0	1	
58	සංචාරක බංගලා මුරකරු	2	0	2	
	එකතුව	**1837**	**1274**	**437**	
59	උපාධිධාරී අභ්‍යාසලාභී	0	1	0	
60	රියදුරු (අනියම්)	3	0	3	
61	කාර්යාල කාර්ය සහයක (අනියම්)	3	1	2	
	එකතුව	**1843**	**1276**	**442**	

® - අනුමත සංඛ්‍යාලේඛනඥ තනතුරු 200 ක් තුළ ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ තනතුරු 37 ද ඇතුළත්ව ඇති බැවින් බඳවා ගැනීම් කිරීමේදී පුරප්පාඩු සංඛ්‍යාව සැලකිය යුත්තේ එම තනතුරු දෙක(02) ම සඳහා ඒකාබද්ධ සේවක සංඛ්‍යාව 200 ක් සේ සලකමිනි.

• - ශ්‍රී ලංකා සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය වීමට යටත්ව
◊ - තනතුර දරන්නාට පෞද්ගලික වන සේ හා පසුව අහෝසි වීමට යටත්ව

VI. විදේශ සම්මේලන, සම්මන්ත්‍රණ හා වැඩමුළුවලට සහභාගීවීම - 2018

අංකය	නම	තනතුර	වැඩසටහන	කාල සීමාව	රට
1	ආචාර්ය ඒ.ජේ.සතරසිංහ මයා අයි.ආර්.බණ්ඩාර මිය පී.එම්.ආර්. ප්‍රනාන්දු මයා	අධ්‍යක්ෂ ජනරාල් අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංඛ්‍යාන) අධ්‍යක්ෂ (තො.ස.තා.)	ජනගහන හා නිවාස සංගණනයේදී තාක්ෂණය භාවිතා කිරීම පිළිබඳ පැවැත්වූ ආසියා-පැසිපික් කලාපීය වැඩමුළුව	2018 ජනවාරි 24 - 26	තායිලන්තය
2	ඒ.එම්.යූ.කේ.අලහකෝන් මයා	අධ්‍යක්ෂ (සංඛ්‍යාන)	ආසියා - පැසිපික් තාක්ෂණික ඇගයුම් හා සමාලෝචනය සඳහා පැවැත්වූ ජාත්‍යන්තර සැසඳුම් වැඩසටහන (ICP) -2017	2018 ජනවාරි 29 - 2018 පෙබරවාරි 03	තායිලන්තය
3	එම්.ඩී.කේ.ඩබ්. වීරසිංහ මයා	තො.ස.තා.සහකාර	උසස් ජාලකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	2018 ජනවාරි 29 - 2018 අප්‍රේල් 20	ඉන්දියාව
4	ඩී.එම්.කේ.පී.කේ. දිසානායක මයා	නියෝජ්‍ය අධ්‍යක්ෂ	''2030 තිරසර සංවර්ධන අභිමතාර්ථ න්‍යාය පත්‍රයට අනුකූලව දකුණු ආසියාව කේන්ද්‍ර කරගනිමින් පවත්වන ලද ආහාර සුරක්ෂිතතාවය අධීක්ෂණය'' පිළිබඳ උප කලාපීය වැඩමුළුව	2018 මාර්තු 04 - 06	බංගලාදේශය
5	එල්.එන්. කුමුදුනී මිය	සංඛ්‍යාලේඛන සහකාර	මානව ජනාවාස දර්ශක පිළිබඳ පැවැත්වූ ආසියා පැසිපික් කලාපීය පුහුණු වැඩමුළුව	2018 මාර්තු 26 - 29	තායිලන්තය
6	ආචාර්ය ඒ.ජේ.සතරසිංහ මයා පී.එම්.පී. අනුර කුමාර මයා	අධ්‍යක්ෂ ජනරාල් අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංඛ්‍යාන III)	ආසියාවේ ජාතික සංඛ්‍යාලේඛන කාර්යාල ප්‍රධානීන් සඳහා දෙවන වරට පවත්වනු ලැබූ සංඛ්‍යාලේඛන නායකත්ව පුහුණු වැඩසටහන	2018 මාර්තු 27 - 28	ජපානය
7	කේ.එම්.ඩී.එස්.ඩී.කරුණාරත්න මිය කේ.කේ.සී.ශිරෝමලී මෙය අයි.සී.ප්‍රේමරත්න මිය	අධ්‍යක්ෂ (සංඛ්‍යාන) ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ සංඛ්‍යාලේඛනඥ	සාක් සංඛ්‍යාලේඛන සංවිධානයේ (SAARCSTAT) ප්‍රධානීන් සඳහා පවත්වන ලද 9 වෙනි රැස්වීම් වාරය	2018 අප්‍රේල් 11 - 13	බංගලාදේශය

8	ජේ.එස්.එන්.පී. ධර්මවර්ධන මයා එම්.ඩී.ඩී.ඩී. දීපවංශ මිය	ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ සංඛ්‍යාලේඛනඥ	මාලදිවයිනේ වෙසෙන ජාතික සංඛ්‍යාලේඛන පද්ධතියට අයත් නිලධාරීන් ඉලක්ක කරගනිමින් මූලික සංඛ්‍යානය පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්වීම සඳහා අනුමැතිය ලබාගැනීම	2018 අප්‍රේල් 14 - 20	මාලදිවයින
9	අයි.ආර්.බණ්ඩාර මිය	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංඛ්‍යාන I)	UNESCAP ස්ත්‍රී පුරුෂ සමාජභාව ප්‍රතිපත්තීන් - දත්ත ප්‍රාරම්භනය පිළිබඳ සමාරම්භක වැඩමුළුව	2018 අප්‍රේල් 21 - 23	තායිලන්තය
10	ඊ.එම්.සී. ද සේරම් මයා	සංඛ්‍යාලේඛනඥ	තිරසර සංවර්ධන අභිමතාර්ථ දර්ශක ආශ්‍රිත සංඛ්‍යාති වල ගුණාත්මකභාවය පිළිබඳ පවත්වනු ලැබූ වැඩමුළුව	2018 අප්‍රේල් 23 -25	ජපානය
11	ඩබ්.එස්.ඩී. ජයසුන්දර මිය	සංඛ්‍යාලේඛනඥ	වොෂින්ටන් කණ්ඩායම් ක්‍රියාත්මක කිරීම සහ අවශ්‍ය තාක්ෂණික සහය පිළිබඳ වැඩමුළුව	2018 අප්‍රේල් 14 - 20	තායිලන්තය
12	ආචාර්ය ඒ.ජේ.සතරසිංහ මයා පී.ඩී.ඩී.පීරිස් මයා එම්.එල්.කේ.පී. කුමාර මයා	අධ්‍යක්ෂ ජනරාල් නියෝජ්‍ය අධ්‍යක්ෂ (තො.ස.තා.) සංඛ්‍යාලේඛනඥ	ගෝලීය වැඩිහිටියන්ගේ දුම්කොළ භාවිතය පිළිබඳ සමීක්ෂණයේ (GATS) පෙළගැස්ම	2018 අප්‍රේල් 23 - 27	ඇමරිකා එක්සත් ජනපදය
13	පී. හෙට්ටියානි මයා එම්.ජී. පෙරේරා මයා	සංඛ්‍යාලේඛනඥ සංඛ්‍යාලේඛන නිලධාරී	සංක්‍රමික ශ්‍රමිකයන් විසින් බඳවාගැනීම් සඳහා දරන ලද වියදම් පිළිබඳ තාක්ෂණික උපදේශනය/ පුහුණු වැඩමුළුව	2018 අප්‍රේල් 25 - 27	ඉන්දියාව
14	ආර්.ඒ.ටී. එස්. රත්නායක මයා	සංඛ්‍යාලේඛනඥ	ලෝක බැංකු විශ්‍රාම වැටුප් පිළිබඳ මූලික පාඨමාලාව	2018 අප්‍රේල් 30 - 2018 මැයි 11	ඇමරිකා එක්සත් ජනපදය
15	ඒ.ජී.එස්.කාරියවසම් මයා	සංඛ්‍යාලේඛනඥ	ආසියා සහ පැසිපික් රටවල් සඳහා 2017 වර්ෂයේදී පැවැත්වූ අන්තර්ජාතික සැසඳුම් වැඩසටහන සඳහා තාක්ෂණික ඇගයුම් සහ සමාලෝචන කලාපීය වැඩමුළුව	2018 මැයි 03 - 09	තායිලන්තය
16	යූ.මහේෂ්වරන් මිය එස්.එස්. ඕපනායක මෙය	අධ්‍යක්ෂ(සංඛ්‍යාන) සංඛ්‍යාලේඛන සහකාර	2018 ආසියා - පැසිපික් ආර්ථික සංඛ්‍යාති සතිය	2018 මැයි 09 2018 මැයි 07 - 09	තායිලන්තය

17	එම්.ඩී.එස්.සේනානායක මයා	නියෝජ්‍ය අධ්‍යක්ෂ	2030 තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය සඳහා සංඛ්‍යාති පිළියෙල කිරීම සඳහා හවුල්කාරීත්වය, සහයෝගය, සහ හැකියා ප්‍රවර්ධනය සඳහා ඉහළ මට්ටමේ කණ්ඩායම් උදෙසා පැවැත්වූ 11 වෙනි රැස්වීම සහ සංඛ්‍යාති ආශ්‍රිත මූල්‍යකරණ යාන්ත්‍රණ පිළිබඳ රැස්වීම	2018 මැයි 08 -10	මොරොක්කෝව
18	ඩබ්.එම්.ඒ.යූ.බී.වීරතුංග මයා ජී.එම්.එස්.පුෂ්පකුමාර මයා ආර්.රන්ගොඩගේ මෙය	සංඛ්‍යාලේඛනඥ සංඛ්‍යාලේඛන නිලධාරී සංඛ්‍යාලේඛන සහකාර	භාණ්ඩ හා සේවා ආශ්‍රිත අන්තර්ජාතික වෙළඳාම	2018 මැයි 14 - 18	ඉන්දියාව
19	කේ.ඒ.එස්.පී.කොඩිකාර මිය එම්.එස්.වීරසිංහ මයා	සංඛ්‍යාලේඛනඥ සංඛ්‍යාලේඛනඥ	ව්‍යාපාර පිළිබඳ සංඛ්‍යාලේඛන නාමාවලිය සම්බන්ධ කලාපීය පාඨමාලා : දත්ත මූලාශ්‍ර ,පවත්වාගෙන යාම සහ තත්ව සහතිකය	2018 මැයි 21 - 25	මැලේසියාව
20	එච්.කේ.ඩබ්.කේ.කේ.හිටිබණ්ඩාර මයා	ජ්‍යේෂ්ඨ සංඛ්‍යාලේඛනඥ	KSTA සඳහා සමගාමීව පැවති තිරසාර සංවර්ධන අභිමතාර්ථ දත්ත නිකුත් කිරීම පිළිබඳ සමාරම්භක හමුව සහ තාක්ෂණික පුහුණු වැඩමුළුව	2018 මැයි 28 -29	පිලිපීනය
21	අයි.ජී.එස්.වීරකෝන් මයා බී.ඒ.යූ.අමරවංශ මයා ආර්.රාජසූරී මයා ඩබ්.කේ.ජී.ඒ.ධර්මවර්ධන මයා	සංඛ්‍යාලේඛන නිලධාරී සංඛ්‍යාලේඛන නිලධාරී සංඛ්‍යාලේඛන නිලධාරී සංඛ්‍යාලේඛන සහකාර	2018 වර්ෂයේ සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා Cloud පරිගණකකරණය හා සුපිරි පිළිබඳ සම්මන්ත්‍රණය	2018 ජූනි 11 - 2018 ජූලි 01	චීනය
22	ආර්.පී.එම්.සුභාෂිණි මෙය ඩී.වී.ජී.දෙල්ගොඩ මිය	සංඛ්‍යාලේඛනඥ සංඛ්‍යාලේඛන නිලධාරී	කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ප්‍රමාණනය කිරීම පිළිබඳ KNOWVAwdata පාඨමාලාවේ නියමු අධ්‍යයනය	2018 ජූනි 18 -29	තායිලන්තය
23	ආචාර්ය ඒ.ජේ.සතරසිංහ මයා	අධ්‍යක්ෂ ජනරාල්	කලාපීය මෙහෙයුම් කමිටුවේ 8 වෙනි රැස්වීම	2018 ජූනි 21 -22	තායිලන්තය
24	කේ.ඒ.එස්.ඒ.ආර්.පවිත්‍රා මෙය එස්.කේ.එස්.බස්නායක මයා	සහකාර අධ්‍යක්ෂ (තො.ස.තා.) සංඛ්‍යාලේඛන නිලධාරී	තිරසර සංවර්ධනය සඳහා උපයෝගී කරගන්නා විශාල දත්ත පිළිබඳ කලාපීය පුහුණු පාඨමාලාව	2018 ජූනි 25 -29	දකුණු කොරියාව
25	අයි.සී.ප්‍රේමරත්න මිය ඩබ්.එම්.ඒ.යූ.බී.වීරතුංග මයා එම්.පී.එම්.ප්‍රියදර්ශනී මෙය	සංඛ්‍යාලේඛනඥ සංඛ්‍යාලේඛනඥ සංඛ්‍යාලේඛන නිලධාරී	කලාපීය වාරික සැකසුම (SA 18.25,RSA)	2018 ජූනි 25 -29	ඉන්දියාව

26	ඩී.ඩී.ජී.ඒ.සෙනෙවිරත්න මිය	අධ්‍යක්ෂ (සංඛ්‍යාන)	29 වෙනි ජනගහන සංගණන සම්මන්ත්‍රණය	2018 ජූලි 11 -13	වියට්නාමය
27	ඒ.කේ.ඩී.සී.එන්.එස්.කරුණාරත්න මයා	සංඛ්‍යාලේඛනඥ	තිරසාර සංවර්ධන අභිමතාර්ථ දර්ශක පිළිබඳ පැවැත්වූ උපදේශනාත්මක වැඩමුළුව 10.7.1	2018 ජූලි 09 - 10	ඇමරිකා එක්සත් ජනපදය
28	පී.එම්.ආර්.ප්‍රනාන්දු මයා වී.එච්.පද්මතිලක මිය	අධ්‍යක්ෂ (තො.ස.තා.) තො.ස.තා.නිලධාරී	CSPro ඇන්ඩ්‍රොයිඩ් දුරකථන භාවිතයෙන් ජංගම සංගණන දත්ත රැස් කිරීම	2018 ජූලි 23 - 27	තායිලන්තය
29	ජේ.කේ.බී.එන්.ජයකොඩි මිය ඩබ්.එච්.මංජුලා මිය	සංඛ්‍යාලේඛනඥ සංඛ්‍යාලේඛන නිලධාරී	ආසියා සහ පැසිපික් රටවල් සඳහා 2017 වර්ෂය තුළ පැවැත්වූ අන්තර්ජාතික සැසඳුම් වැඩසටහන (RDTA 9238) සඳහා කලාපීය තාක්ෂණික ඇගයුම් සහ සමාලෝචන වැඩමුළුව	2018 ජූලි 23 -25 2018 ජූලි 23 -28	තායිලන්තය
30	එම්.ඩී.ඩී.ඩී.දීපවංශ මිය	සංඛ්‍යාලේඛනඥ	අනුවර්තිත සමාජ ආරක්ෂාව පිළිබඳ පිලිපින අධ්‍යාපන චාරිකාව	2018 අගෝස්තු 27 - 2018 සැප්තැම්බර් 01	පිලිපිනය
31	ජී.ඩී.එන්.සිරියලතා මිය	සංඛ්‍යාලේඛනඥ	සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා කෘෂි කාර්මික නිෂ්පාදන බෙදාහැරීමේ තාක්ෂණය පිළිබඳ පුහුණු පාඨමාලාව 2018	2018 අගෝස්තු 28 - 2018 ඔක්තෝම්බර් 11	චීනය
32	ජී.අජිතා චාන්දනී මිය	ප්‍රධාන අභ්‍යන්තර විගණක	රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණක නිලධාරීන් සඳහා පැවැත්වූ කළමණාකරණ විගණනය පිළිබඳ ජාත්‍යන්තර වැඩසටහන	2018 සැප්තැම්බර් 02 - 09	මැලේසියාව
33	ජේ.ලියනගේ මයා	ජ්‍යේෂ්ඨ සංඛ්‍යාලේඛනඥ	සැපයුම හා උපයෝගීතා චගුව පිළිබඳ අන්තර්ජාතික වැඩමුළුව	2018 සැප්තැම්බර් 11 - 13	චීනය
34	ආර්.පී.එම්.සුභාෂිණි මෙය ඩී.වී.ජී.දෙල්ගොඩ මිය	සංඛ්‍යාලේඛනඥ සංඛ්‍යාලේඛන නිලධාරී	කාන්තා ප්‍රචණ්ඩත්වය ප්‍රමාණනය කිරීම පිළිබඳ පැවැත්වූ KNOWVAwdata පාඨමාලාවේ දෙවෙනි කාණ්ඩය	2018 සැප්තැම්බර් 17- 27	ඕස්ට්‍රේලියාව
35	එම්.ඩී.ඩී.ඩී.දීපවංශ මිය	සංඛ්‍යාලේඛනඥ	‘‘වඩා හොඳ දිවියකට වඩා හොඳ සංඛ්‍යාති ‘‘ IAOS OECD සම්මේලනය -2018	2018 සැප්තැම්බර් 19 - 21	ප්‍රංශය

36	ඩබ්.එස්.ඩබ්.රුද්‍රිගු මිය	පරිපාලන නිලධාරී	කාර්යාල කළමණාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - 2015/2016- විදේශ අධ්‍යාපන චාරිකාව	2018 සැප්තැම්බර් 24 -29	ඉන්දියාව
37	කේ.එම්.ඩී.එස්.ඩී.කරුණාරත්න මිය වයි.ජී.ආර්.අයි.කුලනිලක මිය	අධ්‍යක්ෂ (සංඛ්‍යාන) ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ	සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් සහිත තෝරාගත් සාමාජික රටවල් (DMEs) කිහිපයක පැවැත්වූ සැපයුම සහ උපයෝගීතා වගුව යාවත්කාලීන කිරීම සහ ගොඩනැගීම - ජාතික ගිණුම් පද්ධතිය පිළිබඳ ව්‍යාපෘති නිමාකිරීමේ සංසදය	2018 සැප්තැම්බර් 26 -28	තායිලන්තය
38	ඩී.ඩී.ජී.ඒ.සෙනෙවිරත්න මිය	අධ්‍යක්ෂ (සංඛ්‍යාන)	තිරසාර සංවර්ධන අභිමතාර්ථ පිළිබඳ දකුණු ආසියාතික සංසදය	2018 ඔක්තෝම්බර් 04 - 05	ඉන්දියාව
39	වී.පී.ලලිත් මයා එස්.ජයගෞරි මිය	ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ සංඛ්‍යාලේඛනඥ	ආසියා සහ පැසිපික් රටවල් සඳහා 2017 වර්ෂයෙදී පැවැත්වූ අන්තර්ජාතික සැසඳුම් වැඩසටහන සඳහා නාක්ෂණික ඇගයුම් සහ සමාලෝචන කලාපීය වැඩමුළුව (RDTA 9238)	2018 ඔක්තෝම්බර් 10 - 13	තායිලන්තය
40	ඩබ්.ඒ.සී.විජේබණ්ඩාර මිය පී.ඩී.නානයක්කාර මිය	සංඛ්‍යාලේඛනඥ සංඛ්‍යාලේඛනඥ	කම්කරු සංඛ්‍යාලේඛනඥ නිලධාරීන් උදෙසා පැවැත්වූ 20 වෙනි ජාත්‍යන්තර සම්මන්ත්‍රණය	2018 ඔක්තෝම්බර් 10 - 19	ස්විට්සර්ලන්තය
41	ඒ.එන්.ද සිල්වා මිය	සංඛ්‍යාලේඛනඥ	‘‘ප්‍රතිපත්ති- දත්ත සම්බන්ධය තේමාව සහිත උසස් මට්ටමේ සම්මන්ත්‍රණය: යුරෝපීය එකමුතුව- ආසියා පැසිපික් අත්දැකීම් හුවමාරුව	2018 ඔක්තෝම්බර් 14 -15	තායිලන්තය
42	සී.එල්.නාකන්දල මිය	සංඛ්‍යාලේඛන නිලධාරී	අධ්‍යාපනය ආශ්‍රිත තිරසර සංවර්ධන අභිමතාර්ථ දර්ශක පිළිබඳ කලාපීය පුහුණු පාඨමාලාව	2018 ඔක්තෝම්බර් 15 - 19	කොරියාව
43	පී.එම්.පී.අනුර කුමාර මයා	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංඛ්‍යාන III)	‘‘කිසිවෙකු මග නොහැරීමේ සංකල්පය මත සංචාලනය කිරීමේ ප්‍රතිපත්තිය සහිත දත්ත‘‘ සංඛ්‍යානි පිළිබඳ කමිටුවේ 6 වෙනි සැසිවාරය	2018 ඔක්තෝම්බර් 16 -19	තායිලන්තය

44	අයි.ආර්.බණ්ඩාර මිය	අධ්‍යක්ෂ ජනරාල්	එක්සත් ජාතීන්ගේ ලෝක දත්ත සංසදය හා තිරසර සංවර්ධන 2030 න්‍යාය පත්‍රයට අනුකූලව සැකසෙන සංඛ්‍යාති සඳහා හවුල් ව්‍යාපාර, සම්බන්ධීකරණ හා හැකියා ප්‍රවර්ධනය පිළිබඳ උසස් මට්ටමේ කණ්ඩායමෙහි (HLG - PCCB) 12 වන රැස්වීම.	2018 ඔක්තෝම්බර් 21 - 25	එක්සත් අරාබි රාජ්‍යය
45	ජී.ඩබ්.සිරිවර්ධන මයා	සංඛ්‍යාලේඛන නිලධාරී	ආසියා- පැසිපික් ජාලය (APN) සම්බන්ධ රැස්වීමට සහභාගී වීම සඳහා ජාත්‍යන්තර විෂදීකරණ ජාලය - ලෝක සෞඛ්‍ය සංවිධාන පවුලේ වාර්ෂික රැස්වීම	2018 ඔක්තෝම්බර් 22 - 27	දකුණු කොරියාව
46	ඒ.එච්.එම්.එන්.ප්‍රේමතිලක මයා	සංඛ්‍යාලේඛන නිලධාරී	‘‘ආසියා- පැසිපික් රටවල ආබාධිත පුද්ගලයින්ගේ අයිතීන් තහවුරු කිරීමේ ඉන්චියන් ක්‍රමෝපාය හඳුන්වා දීමේ අරමුණින් ‘‘ පාර්ශවකරුවන් උදෙසා පැවැත්වූ වැඩමුළුව	2018 ඔක්තෝම්බර් 25 - 26	තායිලන්තය
47	පී.හෙට්ටියානි මයා	සංඛ්‍යාලේඛනඥ	ආසියා- පැසිපික් කලාපයේ අන්තර්ජාතික කම්කරු සංක්‍රමණ සංඛ්‍යාති පිළිබඳ දත්ත රැස් කිරීම සඳහා පැවැත්වූ 4 වෙනි වැඩමුළුව	2018 ඔක්තෝම්බර් 30 - 2018 නොවැම්බර් 01	දකුණු කොරියාව
48	ජේ.එම්.එස්.යූ.බී.ජයමහ මයා	සංඛ්‍යාලේඛනඥ	ආබාධිත පුද්ගලයින් සම්බන්ධ සංඛ්‍යාති පිළිබඳ වොෂින්ටන් කණ්ඩායමේ (WG)18 වෙනි රැස්වීම	2018 නොවැම්බර් 06 - 09	ඉතාලිය
49	යූ.වී. ජයකොඩි මිය	අධ්‍යක්ෂ (සංඛ්‍යාන)	සංඛ්‍යාති සංවර්ධනය සඳහා ජාතික ක්‍රමෝපායන්(NSDS) හා ආසියා කලාපීය රටවල් සඳහා පැවැත්වූ ඉහළ මට්ටමේ දත්ත සැළසුම් උපාංග (ADAPT) පිළිබඳ 5 වෙනි කලාපීය පුහුණු පාඨමාලාව	2018 නොවැම්බර් 06 - 09	ජපානය

50	සී.ඩී.ද සිල්වා මිය	නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංඛ්‍යාන)	ආසියා - පැසිපික් කලාපීය රටවල සංගණන හා තිරසර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා සංඛ්‍යාලේඛන ධාරිතාව පුළුල් කරගැනීම පිළිබඳ KOSTAT - UNFPA වැඩමුළුව	2018 නොවැම්බර් 12 -16	දකුණු කොරියාව
51	ඊ.සී.පී.රත්නවීර මිය	සංඛ්‍යාලේඛනඥ	තිරසර සංවර්ධන අභිමතාර්ථ දර්ශක සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය ආශ්‍රිත සංඛ්‍යාති පිළිබඳ වැඩමුළුව	2018 නොවැම්බර් 12 -16	ජපානය
52	පී.එම්.පී.අනුර කුමාර මයා	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංඛ්‍යාන)	කෘෂිකාර්මික සහ ග්‍රාමීය ප්‍රදේශ ආශ්‍රිත සංඛ්‍යාලේඛන වැඩිදියුණු කිරීම සඳහා ගෝලීය ක්‍රමෝපායන් පිළිබඳ පැවැත්වූ අවසන් සම්මේලනය	2018 නොවැම්බර් 14 -16	ඉතාලිය
53	ඩී.ඩී.බස්නායක මිය ඕ.ආර්.විජේගුණසිංහ මිය	සංඛ්‍යාලේඛනඥ සංඛ්‍යාලේඛන නිලධාරී	ළමා ප්‍රවණ්ඩත්වය ප්‍රමාණනය කිරීම සම්බන්ධයෙන් විශේෂඥයන් සඳහා පැවැත්වූ රැස්වීම	2018 නොවැම්බර් 19 - 21	ඇමෙරිකා එක්සත් ජනපදය
54	කේ.ටී.සුරේශ්කුමාර් මයා	සංඛ්‍යාලේඛනඥ	“තිරසර සංවර්ධන අභිමතාර්ථ සංකල්පය තුළ සිදු කෙරෙන සක්‍රීය වැඩ ප්‍රමාණය මැනීම“ සඳහා තිරසර සංවර්ධන අභිමතාර්ථ දර්ශක පිළිබඳ කලාපීය පාඨමාලාව	2018 නොවැම්බර් 19 - 22	ජපානය
55	එම්.එම්.දර්ශනී මිය සී.පී.වන්දසේකර මිය	ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ සංඛ්‍යාලේඛනඥ	කෘෂිකාර්මික සංඛ්‍යාලේඛන සඳහා ප්‍රධාන නියැදි රාමු පිළිබඳ සාක් රටවල් සඳහා පැවැත්වූ කලාපීය පුහුණු වැඩසටහන	2018 නොවැම්බර් 19 - 23	නේපාලය
56	ඩබ්.පී.එස්.සිසිලරත්න මයා	සංඛ්‍යාලේඛනඥ	ජනගහනය ආශ්‍රිත දත්ත රැස්කිරීම සහ ජනගහන ප්‍රක්ෂේපණය පිළිබඳ 2018 වර්ෂයේ පවත්වන ලද පුහුණු වැඩමුළුව	2018 දෙසැම්බර් 03 - 07	චීනය
57	එස්. තනබාලසිංහම් මයා	ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ	AQUASTAT ජාතික නියෝජිතයින් සඳහා පැවැත්වූ වැඩමුළුව	2018 දෙසැම්බර් 04 - 06	ඉතාලිය

58	ඒ.එම්.යූ.කේ.අලහකෝන් මයා ඒ.ජී.එස්.කාරියවසම් මයා එස්.ජයගෞරි මිය	අධ්‍යක්ෂ (සංඛ්‍යාන) සංඛ්‍යාලේඛනඥ සංඛ්‍යාලේඛනඥ	ආසියා- පැසිපික් රටවල් සඳහා අන්තර්ජාතික සැසඳුම් වැඩසටහන 2017 (RDTA 9238) සඳහා පැවැත්වූ කලාපීය තාක්ෂණික ඇගයුම් හා සමාලෝචන වැඩමුළුව	2018 දෙසැම්බර් 04 - 06 2018 දෙසැම්බර් 04 - 14 2018 දෙසැම්බර් 11 - 14	ඉන්දුනීසියාව
59	කේ.පී.එස්.පී.ඩී.එස්. අර්සකුලරත්න මයා	සංඛ්‍යාලේඛනඥ	කෘෂිකාර්මික සංඛ්‍යාලේඛන සඳහා භූගෝලීය තොරතුරු පද්ධති භාවිතය පිළිබඳ කලාපීය පුහුණු වැඩමුළුව	2018 දෙසැම්බර් 17 - 21	තායිලන්තය

විදේශ වැඩසටහන් 2018 - රාජකාරී ඉටුකරන ආයතන මගින් නම් කරන ලද වැඩසටහන්

අංකය	නම	තනතුර	වැඩසටහන	කාල සීමාව	රට
60	ජී.ඩබ්.සී.කේ.කේ.සුමනසිරි මිය	සංඛ්‍යාලේඛන නිලධාරී	නි.ස.අභිමතාර්ථ 4 අධීක්ෂණය :අධ්‍යාපනය ආශ්‍රිත සංඛ්‍යාලේඛන සහ මෙවලම් පිළිබඳ දකුණු ආසියාව සහ බටහිර ආසියාවේ පැවැත්වූ පුහුණු වැඩමුළුව	2018 අගෝස්තු 06 - 10	ඉන්දියාව
61	ආර්.ඩී.එන්.කරුණාසිරි මයා	සංඛ්‍යාලේඛනඥ	අධ්‍යාපන දර්ශක සංවර්ධනය සහ සංඛ්‍යාලේඛන හැකියා ප්‍රවර්ධනය පිළිබඳ ආසියාතික සහයෝගීතා කණ්ඩායම් වැඩමුළුව	2018 සැප්තැම්බර් 10 - 13	දකුණු කොරියාව
62	ඩී.පී.ඩබ්.ඩී.වර්ණසූරිය මිය	සංඛ්‍යාලේඛනඥ	එකතු කළ අගය ආශ්‍රිත සංඛ්‍යාති සහ ගෝලීය අගය සහිත දාමයන් පිළිබඳ පැවැත්වූ WTO තේමාත්මක පාඨමාලාව	2018 සැප්තැම්බර් 24-28	ස්විට්සර්ලන්තය
63	ඩබ්.බී.එම්.ආර්.වීරසේකර මයා	සංඛ්‍යාලේඛන නිලධාරී	ආපදා හානි පිළිබඳ දත්ත පද්ධති සහ සෙන්දයි දත්ත රාමු අධීක්ෂණය පිළිබඳ පුහුණු වැඩමුළුව	2018 නොවැම්බර් 13 -16	ඉන්දියාව
64	ජී.කේ.ඩී.එච්.මැණිකේ මිය	සංඛ්‍යාලේඛනඥ	කෘෂිකාර්මික සංඛ්‍යාලේඛන සඳහා භූගෝලීය තොරතුරු පද්ධතිය භාවිතා කිරීම පිළිබඳ කලාපීය පුහුණු වැඩමුළුව	2018 දෙසැම්බර් 17 -21	තායිලන්තය

VII. උසස්වීම්, පත්වීම්, මුදාහැරීම්, ඉල්ලා අස්වීම්, සේවය අතහැරයෑම් හා විශ්‍රාමයෑම්

පත් කිරීම්

අධ්‍යක්ෂ ජනරාල්	01
සංඛ්‍යාලේඛන නිලධාරී	64
වැඩමූලික (මුද්‍රණ)	01
රියදුරු	06

මුදාහැරීම්

සංඛ්‍යාලේඛන නිලධාරී	02
කේත ලිපිකරු (දෙමළ මාධ්‍ය)	01
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	01

රාජ්‍ය කළමණාකරණ සහකාර	01
කාර්යාල කාර්ය සහයක	03

සේවය අතහැරයෑම්

සංඛ්‍යාලේඛන නිලධාරී	01
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	01
රාජ්‍ය කළමණාකරණ සහකාර	01
කාර්යාල කාර්ය සහයක	01

විශ්‍රාමයෑම්

අධ්‍යක්ෂ ජනරාල්	01
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංඛ්‍යාන)	01
සංඛ්‍යාලේඛනඥ	02
සංඛ්‍යාලේඛන නිලධාරී	13
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	01
රාජ්‍ය කළමණාකරණ සහකාර	01
ජ්‍යෙෂ්ඨ පද්ධති ක්‍රියාකරු	01
දත්ත සටහන් ක්‍රියාකරු	01
කාර්යාල කාර්ය සහයක	01

ස්ථාන මාරු

අධ්‍යක්ෂ (පරිපාලන)	01
සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ)	01
සංවර්ධන නිලධාරී	08
රාජ්‍ය කළමණාකරණ සහකාර	29
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	20
රියදුරු	08
කාර්යාල කාර්ය සහයක	10

සේවයෙන් ඉල්ලා අස්වීම් -

මිය යාම්

සංඛ්‍යාලේඛන නිලධාරී	02





***2018.06.09** දින දෙපාර්තමේන්තු පරිශ්‍රය තුල පවත්වන ලද සර්ව රාත්‍රික පරිත්‍රාන ධර්ම දේශනාව*

3.16.2 ගිණුම් අංශය

I. මූල්‍ය වාර්තාව - 2018

2018 වර්ෂය සඳහා අදාල වන මූල්‍ය සීමාවන් යටතේ දෙපාර්තමේන්තුවේ සමස්ථ වියදම් ඇස්තමේන්තුව රු.997,627,000.00 (රු.මිලියන 997.63) ක් වන අතර මුළු සත්‍ය වියදම රු.911,257,428.00 (රු.මිලියන 911.26) කි. මෙය ඇස්තමේන්තු ප්‍රතිපාදනය හා සසඳන විට 91.34% ක උපයෝජනයක් පෙන්නුම් කරයි.

මෙම ඇස්තමේන්තු ගත මුළු වියදම පුනරාවර්තන වියදම් ඇස්තමේන්තුව වන රු.877,965,000.00 (රු.මිලියන 877.97) ක් සහ ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තුව වන රු.119,662,000.00 (රු.මිලියන 119.66) ක් සහ යන අගයන්හි එකතුවෙන් සමන්විත වන අතර 2018 වර්ෂයේදී සත්‍ය වශයෙන් දරණ ලද පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම පිලිවෙලින් රු.834,350,011.00 (රු.මිලියන 834.35) සහ රු.76,907,417.00 (රු.මිලියන 76.91) ක් වේ. තවද මෙම පුනරාවර්තන වියදම ඇස්තමේන්තු ප්‍රතිපාදනය හා සසඳන විට 95.03% උපයෝජනයක්ද, ප්‍රාග්ධන වියදම ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් 64.27% ක උපයෝජනයක්ද පෙන්නුම් කරයි.

මෙම පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් විවිධ වැය විෂයන් යටතේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් කල උපයෝජනය ප්‍රතිශත වශයෙන් පහත පරිදි වේ.

පුනරාවර්තන වියදම්

පුද්ගල පඩිනඩි (1001/1002/1003)	95.7%
වෙනත් පුනරාවර්තන වියදම්	
ගමන් වියදම් (1101/1102)	97.6%
සැපයීම් (1201/1202/1203/1205)	94.8%
නඩත්තු (1301/1302/1303)	84.7%
සේවා (1401/1402/1403/1404)	97.5%
වාර්ෂික සංගණන - වාර්ෂික සමීක්ෂණ පැවැත්වීම (1409(1))	84.3%
වෙනත්(1409(2))	89.9%
රජයේ සේවකයන් හා දේපල ණය පොලී(1506)	99.9%
පාඩු හා කපාහැරීම් (1701)	99.9%

ප්‍රාග්ධන වියදම්

මූලධන වත්කම් පුනරාවර්තනය සහ වැඩිදියුණු කිරීම	
ගොඩනැගිලි සහ ඉදිකිරීම් (2001)	97.5%
යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ (2002)	29.1%
වාහන (2003)	87.6%
මූලධන වත්කම් අත්පත් කරගැනීම්	
ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ (2102)	95.7%
යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ (2103)	29.5%
වෙනත් මූලධන වියදම්	

කාර්ය මණ්ඩල පුහුණු කිරීම් (2401)	95.4%
ජන හා නිවාස සංගණනය 2021 (8-2507)	34.2%
ව්‍යාපාර පිලිබඳ සංඛ්‍යාන නාමාවලිය (16 -2509)	10.6%
රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයන්හි සේවා නියුක්තිය පිලිබඳ සංගණනය (19 -2509)	99.8%
කාෂිකාර්මික ගෘහ ඒකක සමීක්ෂණය (21-2509)	99.1%
ආසියා පැසිෆික් කලාපයේ ජාත්‍යන්තර සංසන්දනාත්මක වැඩසටහන (5-2507)	67.6%
19 වන ජාත්‍යන්තර සංඛ්‍යාලේඛනඥවරුන්ගේ සම්මේලනයේදී ගත් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා වූ නියමු අධ්‍යයනය (23-2507)	23.7%

ඉහත වර්ග කිරීම් අනුව ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් 95.7% ක උපයොජනයක් පුද්ගල පඩිනඩි යටතේද, 92.5% ක උපයෝජනයක් වෙනත් පුනරාවර්තන වියදම් යටතේද පෙන්නුම් කෙරිණි.

ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තුව යටතේ වන මූලධන වත්කම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීමට අදාල වියදම් එම ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් 81.3 % ක උපයෝජනයක් ද මූලධන වත්කම් අත්පත් කර ගැනීම් එම ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනයෙන් 77.4% ක හා වෙනත් මූලධන වියදම් එම ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනයෙන් 52.47% ක උපයෝජනයක් ද පෙන්නුම් කෙරිණි.

ශීර්ෂය **: 252 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**
වැඩසටහන **: 01 මෙහෙයුම් වැඩසටහන**
ව්‍යාපෘතිය **: පරිපාලන සහ ජාතික සංඛ්‍යාලේඛන**

පුනරාවර්තන වියදම් 2018

ව්‍යාපෘතිය	වැය විෂයය	2018 ඇස්තමේන්තුගත මුළු ශුද්ධ වෙන් කිරීම් (රු.)	2018 සත්‍ය වියදම (රු.)
1	1.පුද්ගල පඩිනඩි	688,205,000.00	658,798,284.00
	2.වෙනත් පුනරාවර්තන වියදම්	189,760,000.00	175,551,727.00
	එකතුව	**877,965,000.00**	**834,350,011.00**

ප්‍රාග්ධන වියදම් 2018

ව්‍යාපෘතිය	වැය විෂයය	2018 ඇස්තමේන්තුගත මුළු ශුද්ධ වෙන් කිරීම් (රු.)	2018 සත්‍ය වියදම (රු.)
1	1. මූලධන වත්කම්වල පුනරාවර්තනය හා වැඩිදියුණු කිරීම	25,200,000.00	20,507,479.00
	2. මූලධන වත්කම්වල අත්පත් කර ගැනීම්	27,300,000.00	21,156,433.00
	3.වෙනත් මූලධන වියදම් - දේශීය අරමුදල්	55,950,000.00	27,696,000.00
	විදේශීය අරමුදල්	11,212,000.00	7,547,505.00
	එකතුව	**119,662,000.00**	**76,907,417.00**

ර.නි.අ.බී.ගිණුම 2520011-2018

	අනුමත සීමාව (රු.)	සත්‍ය සීමාව (රු.)
උපරිම හර සීමාව	51,000,000.00	24,363,679.00
උපරිම බැර සීමාව	34,000,000.00	38,736,030.84
හර සීමාවේ උපරිම සීමාව	250,000,000.00	117,571,630.00

II. ප්‍රසම්පාදන අංශය

අනු අංකය	ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යයන්	2018 වර්ෂය සඳහා ඇස්තමේන්තු මුදල (රු. මිලියන)	වැය කරන ලද මුදල (රු. මිලියන) 2018.12.31 දක්වා
01	ලිපි ද්‍රව්‍ය - පළමු මාස 06 සහ දෙවන මාස 06	07	4.69
02	ටෝනර් - පළමු මාස 06 සහ දෙවන මාස 06	08	17.11 (සංගණන හා සමීක්ෂණ සඳහා වූ ඉල්ලීම්ද ඇතුලත්ව)
03	ටයර් - පළමු මාස 06 සහ දෙවන මාස 06	1.88	1.88
04	උද්‍යාන හා සනීපාරක්ෂක සේවාව	8.8	5.6 (2019 වර්ෂය සඳහා බිල ගණන් කැඳවා ඇත.)
05	පරිගණක හා ආශ්‍රිත උපාංග මිලදී ගැනීම.	15	14.56 (මුද්‍රණ යන්ත්‍ර සඳහා ගෙවීම් කර නොමැත.)
06	Precision cooling පද්ධතියක් සවි කිරීම.	2.2	කොන්ත්‍රාත්තුව පිරිනමා ඇති අතර මෙතෙක් සැපයීම් කර නොමැත.
07	Power management of access switches, Dual standby supply for core switches on firewall, access controlling system for server room, server room monitoring enhancement	2.1	1.12 (සමහර අයිතම සඳහා 2018.12.31 දිනට ගෙවීම් කිරීමට නොහැකි වී ඇත.)
08	Virus Guard	0.8	0.92
09	සුළු ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගැනීම.	01	0.64 (ඇණවුම් කිහිපයක් සඳහා අදාල ආයතන මගින් සැපයීම් සිදු කර නොමැත.)

3.17 අභ්‍යන්තර විගණන අංශය

2018 වර්ෂයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් ඉටු කළ කාර්යයන්ගේ කාර්ය සාධනය පහත පරිදි වේ.

i. 2018 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත හා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.

ii. 2018 වර්ෂය සඳහා මූලික වාර්තාව ඉදිරිපත් කිරීම.

iii. 2017 වර්ෂයේ කාර්ය සාධන වාර්තාවට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම.

iv. ජනවාරි මස මුදල් පොත් හා වැය ලෙජර පරීක්ෂාව

2017 පොදු තැන්පත් ගිණුම නියදි පරීක්ෂා කිරීම.

2017 දෙසැම්බර් මස බැංකු සැසඳුම් වාර්තාව පරීක්ෂා කිරීම.

v. සිතියම් විද්‍යා අංශයේ නිවාඩු පරීක්ෂා කිරීම.

vi. ජන සංගණන හා ප්‍රජා විද්‍යා අංශයේ හා කර්මාන්ත ඉදිකිරීම් වෙළඳ හා සේවා අංශයේ නිලධාරීන්ගේ පැමිණීම පරීක්ෂා කිරීම.

vii. නිලධාරීන්ගේ වැටුප් රහිත නිවාඩු අය කිරීම් නියදි පරීක්ෂාව.

viii. දෙපාර්තමේන්තු වාහන පිරිවැය වාර්තාව පරීක්ෂා කිරීම.

වාහන ලොග් සටහන් පොත් නියදි පරීක්ෂාව.

වාහන වල ඉන්ධන භාවිතය නියදි පරීක්ෂාව.

වාහන ස්ථාවර වත්කම් ලේඛනය නියදි පරීක්ෂාව.

වාහන වලින් ඉවත් කරන ලද ටයර් පිළිබඳ පරීක්ෂාව.

වාහන අලාභ හානි ලේඛනය පරීක්ෂාව

ix. 2017 වර්ෂයේ හා ඊට පෙර මිලදී ගත් Tablet පරිගණක යන්ත්‍ර ඉන්වෙන්ට්‍රි ගත කිරීම පරීක්ෂා කිරීම.

2017 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීමේ ප්‍රගතිය පරීක්ෂා කිරීම.

2018 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රගතිය පරීක්ෂා කිරීම.

පුවත්පත් මිලදී ගැනීම හා අපහරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම.

x. පුත්තලම දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශයේ සාමාන්‍ය පරිපාලනයේ විගණන පරීක්ෂාව.

xi. වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය 2017

වාර්ෂික ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය 2016 හා 2017

වාර්ෂික වෙළඳ හා සේවා සමීක්ෂණය 2016 හා 2017

ව්‍යාපාර සංඛ්‍යාන නාමාවලිය

ජාතික ගිණුම් අවසන් වාර්තාව 2015 හා 2016 යන සමීක්ෂණ වල ප්‍රගතිය පරීක්ෂා කිරීම හා වාර්තාව ඉදිරිපත් කිරීම.

xii. මාසික විගණන රැස්වීම් 4ක් පැවැත්වීම.

xiii. අභ්‍යන්තර විගණන පරීක්ෂාව - ගිණුම් අංශය

2017 වර්ෂයේ දෙසැම්බර් මස හා 2018 වර්ෂයේ ජනවාරි, පෙබරවාරි මස වවුචර පත් පරීක්ෂාව හා මාසික ගිණුම් සාරාංශ පරීක්ෂාව.

xiv. 2017 වර්ෂයේ නියැදි සමීක්ෂණ අංශයේ නිවාඩු පරීක්ෂාව.

xv. 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය පරීක්ෂාව.

ජන සංගණන හා ප්‍රජා විද්‍යා අංශය

කෘෂිකාර්මික හා පාරිසරික අංශය

පුස්තකාල අංශය

නියදි සමීක්ෂණ අංශය

ක්ෂේත්‍ර කළමනාකරණ අංශය

ඉදිකිරීම්, කර්මාන්ත, වෙළඳ හා සේවා අංශය

xvi. 2017 වර්ෂයේ මුද්‍රණ අංශයේ නිවාඩු පරීක්ෂාව.

xvii. මාතර දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශයේ සාමාන්‍ය පරිපාලනයේ විගණන පරීක්ෂාව

xviii. 2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේ ප්‍රගතිය පරීක්ෂාව.

xix. 2017 වර්ෂයේ ක්ෂේත්‍ර කළමනාකරණ අංශයේ නිවාඩු පරීක්ෂාව.

xx. දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලේ නඩත්තු කටයුතු පිළිබඳ සිදු කරන ලද නියදි පරීක්ෂාව.

xxi. අත්තිකාරම් B ගිණුමේ 2017 අවසාන ගිණුම් වාර්තා හා C10 ලේඛන පරීක්ෂා කිරීම.

xxii. 2017 වර්ෂයේ විසර්ජන ගිණුම පරීක්ෂා කිරීම හා අදාල විගණන වාර්තාව ඉදිරිපත් කිරීම.

xxiii. මැයි මස බැංකු සැසඳුම් වාර්තාව පරීක්ෂා කර වාර්තා කිරීම.

xxiv. 2017 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව පරීක්ෂාව.

xxv. 2017 වර්ෂයේ ජාතික ගිණුම් අංශයේ හා 2018 වර්ෂයේ පළමු මාස 6 සඳහා පුහුණු අංශයේ නිවාඩු පරීක්ෂාව.

xxvi. කුරුණෑගල දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශයේ සාමාන්‍ය පරිපාලනය පිළිබඳ විගණන පරීක්ෂාව.

xxvii. 2018 වර්ෂයේ පළමු මාස 07 සඳහා කෘෂිකර්ම හා පාරිසරික අංශයේ නිවාඩු පරීක්ෂාව.

xxviii. ගම්පහ දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශයේ සාමාන්‍ය පරිපාලනය පිළිබඳ විගණන පරීක්ෂාව.

xxix. ගම්පහ දිස්ත්‍රික්කය තුල සිතියම් එකතු කිරීමේ හා කෘෂිකාර්මික ගෘහ ඒකක සමීක්ෂණයේ ක්ෂේත්‍ර කටයුතු වල ප්‍රගතිය පරීක්ෂාව.

xxx. 2018 වර්ෂයේ පළමු මාස 07 සඳහා කර්මාන්ත ඉදිකිරීම් වෙළඳ හා සේවා අංශයේ නිවාඩු පරීක්ෂාව.

xxxi. විශ්‍රාම හා මිය ගිය නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු නියැදි පරීක්ෂාව හා අදාල විගණන වාර්තාව ඉදිරිපත් කිරීම.

xxxii. 2018 ජුනි මාසය සඳහා උද්‍යාන හා සනීපාරක්ෂක සේවාවේ සේවකයන්ගේ පැමිණීම හා ගෙවීම් කිරීම පරීක්ෂාව හා අදාල විගණන වාර්තාව ඉදිරිපත් කිරීම.

xxxiii. 2018 වර්ෂයේ පුහුණු අංශයේ පුහුණු වැඩසටහන් පැවැත්වීමේ ප්‍රගතිය පරීක්ෂා කිරීම හා ඊට අදාල විගණන වාර්තාව ඉදිරිපත් කිරීම.

xxxiv. 2018 වර්ෂයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන මුදල්පොත් හා වැය ලෙජර නියැදි පරීක්ෂාව.

XXXV. අත්තිකාරම් B ගිණුමේ ණයගැති හා ණයහිමි ශේෂ අය කිරීමේ ප්‍රගතිය පරීක්ෂාව.

XXXVI. 16 වන අංශයේ නිවාඩු ලේඛන, බඩු වට්ටෝරු ලේඛන, භාණ්ඩ සමීක්ෂණ වාර්තාව, රාජකාරී ලයිස්තු, කාර්ය සාධන වාර්තා ඉදිරිපත් කිරීම පරීක්ෂා කිරීම.

XXXVII. 2018 සැප්තැම්බර් මසට අදාල බැංකු සැසඳුම් වාර්තාව හා මුදල් පොත් පරීක්ෂා කිරීම හා විගණන වාර්තාව ඉදිරිපත් කිරීම.

XXXVIII. ක්ෂේත්‍ර කළමනාකරණ අංශයේ බඩු වට්ටෝරු ලේඛන පරීක්ෂාව හා ඊට අදාල විගණන වාර්තාව ඉදිරිපත් කිරීම.

XXXIX. Lap Top පරිගණක වල ගබඩා ඉන්වෙන්ට්‍රි ලේඛන නියැදි පරීක්ෂාව.

XL. සමාජ සුභසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය හා කාන්තා හා ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය සඳහා අනියුක්ත කර ඇති නිලධාරීන්ගේ නිවාඩු, රාජකාරී ලැයිස්තු, වැටුප් වර්ධක හා සාමාන්‍ය රාජකාරී පිළිබඳ පරීක්ෂාව.

XLI. පුස්තකාල අංශයේ පොත් මිලදී ගැනීම, රාජකාරී ලැයිස්තු, නිවාඩු, පොත් සමීක්ෂණයේ ප්‍රගතිය පරීක්ෂා කර වාර්තා ඉදිරිපත් කිරීම.

XLII. වැටුප් ලෙජර, වැටුප් පාලන ගිණුම, වැටුප් වර්ධක ගෙවීම් හා පෞද්ගලික ලිපි ගොනු නියදි පරීක්ෂාව හා දිස්ත්‍රික් කාර්යාල වල නිලධාරීන්ගේ වැටුප් වර්ධක ගෙවීම් නියැදි පරීක්ෂාව.

XLIII. ජූලි, අගෝස්තු මාස වල ගෙවීම් වවුචර පරීක්ෂාව.

XLIV. 2018 වර්ෂය සඳහා කළමනාකරණ විගණන කමිටු රැස්වීම් 4ක් පැවැත්වීම හා රැස්වීම් 3ක් සඳහා වාර්තාවන් ඉදිරිපත් කිරීම.

XLV. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය පරීක්ෂා කර කළමනාකරණ විගණන කමිටු රැස්වීමේදී සාකච්ඡා කිරීම.

4.0 අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ස්ථාපිත කර ඇති සංඛ්‍යාලේඛන අංශයන්හි කාර්ය සාධනය

4.1 කම්කරු දෙපාර්තමේන්තුව - සංඛ්‍යාලේඛන අංශය

කම්කරු සංඛ්‍යාති

I. වාර්ෂික රැකීරක්ෂා සමීක්ෂණය

මෙමගින් දිවයිනේ පිහිටි පෞද්ගලික හා අර්ධ රාජ්‍ය යන දෙඅංශයෙහි සේවක අර්ථසාධක අරමුදලට දායකවන ව්‍යාපාර සහ සේවා ආයතන සම්බන්ධව වසරේ ජුනි මස අවසන් වැඩ කරන දිනය පදනම්ව තොරතුරු , ස්ථර අනුව ප්‍රමාණයට සමානුපාතිකව තෝරාගත් නියැදියක් ඇසුරින් තැපැල් මගින් වාර්ෂිකව තොරතුරු රැස් කිරීම සිදු කරනු ලැබේ. මෙම වාර්තාව මගින් දිවයිනෙහි සංවිධානය වූ සේවා නියුක්තිය, කර්මාන්ත හා ව්‍යාප්තීය වර්ගීකරණ තොරතුරු ඇතුළුව කම්කරු ක්ෂේත්‍රට අදාළ තවත් තොරතුරු රැසක් වාර්ෂිකව පවත්වනු ලබන " Annual Employment Survey " ප්‍රකාශනය මගින් වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලැබේ. 2017 වාර්ෂික වාර්තාව මුද්‍රණයට සහ ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

II. සාමාන්ය ඉපැයීම් සහ වැඩ කල පැය ගණන පිළිබඳ සමීක්ෂණය

මෙම සමීක්ෂණය මගින් පඩි පාලක සහා ආඥා පනත යටතේ චේතන ගෙවනු ලබන ආයතනවල පවතින සේවා තත්ත්ව අනුව සේවකයින්ගේ ඉපැයීම් වල වෙනස්වීමේ ආකාරය අධ්‍යයනය කරනු ලබයි. මෙහිදී පඩිපාලක සහා අනුව තෝරාගත් ආයතන වලින් සෑම වසරකම මාර්තු සහ සැප්තැම්බර් මාස වලදී වර්ෂයකට දෙවරක් තැපැල් මාර්ගිකව තොරතුරු රැස්කරනු ලබයි. එක් එක් සේවා තත්ත්ව අනුව ඉපැයීම් පිලිබඳ තොරතුරු රැස් කර වාර්ෂිකව ප්‍රකාශයට පත්කරනු ලබන " The Survey on Hours of Actually Worked and Average Earnings " ප්‍රකාශණය මගින් ප්‍රකාශයට පත් කරනු ලබන අතර එමගින් සේවා තත්ත්ව අනුව ඉපැයීම් රටාව විග්‍රහ කරනු ලැබේ. 2017 වාර්ෂික වාර්තාව ප්‍රකාශයට පත්කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කරමින් පවතී.

III. පඩිපාලක සහා අවම වැටුප් දර්ශකාංකය ගණනය කිරීම

පඩි පාලක සහා ආඥා පනත යටතේ කම්කරු දෙපාර්තමේන්තුව මගින් පඩි පාලක සහා අනුව නියම කරනු ලබන අවම වැටුප් පදනම් කොට මාසිකව අවම වැටුප් අනුපාත දර්ශකාංකය ගණනය කරනු ලැබේ. මෙම දර්ශකාංකය කෘෂි (වැවිලි අංශය) කර්මාන්ත, වාණිජ, සේවා යන ප්‍රධාන අංශ සඳහා වෙන් වෙන්ව හා ඒකාබද්ධව ගණනය කරනු ලබන අතර එමගින් ආර්ථිකයේ ප්‍රධාන අංශ වල අවම වැටුප් මට්ටම්වල වෙනස්වීම් නිරීක්ෂණය කරනු ලැබේ. ඉහත දර්ශකය, ශ්‍රී ලංකා මහ බැංකුව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානය ඇතුළු විවිධ ආයතන වලට මාසිකව, කාර්තුමය සහ වාර්ෂික මට්ටම් වලින් ලබාදෙනු ලැබේ. 2018 නොවැම්බර් මස දක්වා ලබා දී ඇත.

IV. කම්කරු සංඛ්‍යාති ප්‍රකාශනය ප්‍රකාශයට පත් කිරීම

දේශීය දත්ත ප්‍රයෝජනයට ගන්නන් සඳහා ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳ පොල ආශ්‍රිත කම්කරු සංඛ්‍යාතීන් හා ඒ සමග සහ සම්බන්ධ වූ ජනගහනය හා ප්‍රජා විද්‍යාත්මක තොරතුරු සහ ශ්‍රම බලකාය, මිල, වැටුප් හා ආදායම් වියදම් සම්බන්ධව සාමාන්‍ය සමාජ ආර්ථික සහ කම්කරු සම්බන්ධතා, කම්කරු ආඥා පනත් ක්‍රියාත්මක කිරීම පිළිබඳව තොරතුරු අඩංගු " කම්කරු සංඛ්‍යාති" ප්‍රකාශනය වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලබන අතර, මේ සඳහා කම්කරු දෙපාර්තමේන්තුවට අමතරව ශ්‍රී ලංකාවේ විවිධ දෙපාර්තමේන්තු සහ ආයතන වලින් අවශ්‍ය තොරතුරු ලබා ගනු ලැබේ. 2017 වාර්ෂික වාර්තාව මුද්‍රණය සඳහා සකස්කරන ලදී.

V. සේවක අර්ථසාධක අරමුදලට දායක වන නව ආයතන ලියාපදිංචි කිරීම

සේවක අර්ථසාධක අරමුදලට දායක වන නව ආයතන ශ්‍රී ලංකා සම්මත කර්මාන්ත වර්ගීකරණය (Sri Lanka Standard Industry Classification) මත CSpro දත්ත පද්ධතියක් වෙත ඇතුලත් කර තොරතුරු යාවත්කාලීන කිරීම සිදු කරනු ලැබේ.

4.2 අධ්‍යාපන අමාත්‍යාංශය - සංඛ්‍යාලේඛන අංශය

අධ්‍යාපන සංඛ්‍යාති

I. පාසල් සංගණන පැවැත්වීම

අධ්‍යාපන අමාත්‍යාංශයේ සංඛ්‍යාලේඛන ශාඛාව මගින් නොකඩවා පවත්වන වාර්ෂික පාසල් සංගණන මාලාවේ 2018 වර්ෂයට අදාළ සංගණනය 2018 ජූනි මස 01 දින පදනම් කරගනිමින් මෙවරත් දීපව්‍යාප්තව සිදුකරන ලදි.

එම සංගණනයේදී සියළුම රජයේ පාසල්ද (ජාතික හා පළාත් පාසල්), රජයේ අනුමත පෞද්ගලික පාසල්ද, උපකෘත විශේෂ පාසල්ද, පිරිවෙන් පාඨශාලා ද, ජාත්‍යන්තර පාසල්ද ඇතුලත් විය.

එකිනෙකට වෙනස් පරිපාලන ව්‍යුහ සහිත ඉහත සඳහන් පාසල් ඒකක සඳහා එකිනෙකට වෙනස් උපලේඛන 08ක් යොදා ගනිමින් එකිනෙකට සමගාමී සංගණන වැඩසටහන් 04 ක් පවත්වා අදාළ තොරතුරු එම ආයතන ප්‍රධානීන් මඟින් රැස්කරන ලදි. එලෙස පාසල් වලින් සම්පූර්ණ කරන ලද අදාළ උපලේඛන වලින් රජයේ පාසල්වලට අදාළ උපලේඛන කලාප කාර්යාල තුලදී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශය විසින් සකස් කල පරිගණක දත්ත පද්ධතියට පරිගණක ගත කරන ලද අතර එම පරිගණක දත්ත ගොනු අධ්‍යාපන අමාත්‍යාංශයේ අප ශාඛාව වෙත ලැබීමත් සමඟ එම දත්ත පද්ධතියේ පිරිසිදු කිරීමේ අතිශය සංකීර්ණ වූ ක්‍රියාවලිය මේ වනවිටත් අප ශාඛාවේ කාර්ය මණ්ඩලය විසින් සිදුකරමින් පවතී.

II. අධ්‍යාපන ක්ෂේත්‍රයේ ව්‍යුහය පිළිබඳ තොරතුරු

විෂය	ගණන
පළාත් අධ්‍යාපන කාර්යාල	9
කලාප අධ්‍යාපන කාර්යාල	98
කොට්ඨාස අධ්‍යාපන කාර්යාල	312
ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ	20
ගුරු විද්‍යාල	8

III. පාසල් අධ්‍යාපන සංඛ්‍යාලේඛන සාරාංශය -2017

විෂය	ඒකක ගණන*	සිසුන් ගණන*			ගුරුවරු ගණන*		
		පිරිමි	කාන්තා	එකතුව	පිරිමි	කාන්තා	එකතුව
ජාතික පාසල්	353	419,234	391,930	811,164	10,758	27,390	38,148
පළාත් පාසල් - ප්‍රාථමික	4,058	351,122	329,584	680,706	8,247	29,032	37,279
පළාත් පාසල් - ද්විතීයික	5,783	1,289,440	1,384,645	2,674,085	45,483	120,108	165,591
රජයේ අනුමත පෞද්ගලික පාසල්	80	70,732	65,730	136,462	1345	5210	6,555
උපකෘත විශේෂ පාසල්	26	1458	1038	2,496	102	386	488
පිරිවෙන් පාඨශාලා	754	62,872	-	62,872	6,782	-	6,782
ජාත්‍යන්තර පාසල්	265	*29,951*	*26,968*	56,919	*674*	*4,253*	4,927

මූලාශ්‍රය- පාසල් සංගණනය 2017

IV. අනෙකුත් සංගණන/ දත්ත රැස්කිරීම් පැවැත්වීම

පාසල් සංගණන ක්‍රියාවලියට සමාන්තරව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලද, ගුරු විද්‍යාලවලද, නොවිධිමත් අංශය පිළිබඳව තොරතුරු රැස්කිරීමත් සිදුකෙරේ.

V. දත්ත/ සංඛ්‍යාති නිකුත්කිරීම්

අධ්‍යාපන අමාත්‍යාංශයේ විවිධ අංශ සහ ශාඛා වෙත මෙන්ම පළාත්, කලාප හා කොට්ඨාස අධ්‍යාපන කාර්යාලවල දත්ත අවශ්‍යතාද, අධ්‍යාපන සංඛ්‍යාති ප්‍රකාශයට පත් කරන ශ්‍රී ලංකා මහ බැංකුව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වැනි ප්‍රතිපත්ති සම්පාදන කටයුතු සඳහා නිල සංඛ්‍යාති නිකුත්කරන ආයතනවල මෙන්ම විවිධ ජාත්‍යන්තර ආයතනවල අධ්‍යාපන ක්ෂේත්‍රයේ දත්ත පිලිබඳ ඉල්ලීම් සඳහාද, පර්යේෂකයින්ගේද හා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය නියෝජනය කරන විශ්ව විද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලවල හා ශිෂ්‍යයින්ගේද අධ්‍යයන කටයුතු සඳහාද වෙනත් බාහිර පෞද්ගලික ආයතනවලින් ඉදිරිපත් වන දත්ත ඉල්ලීම් සඳහා දත්ත නිකුත් කිරීම මෙම ශාඛාව මඟින් වර්ෂය පුරාම නොකඩවා කරගෙන යනු ලබන ක්‍රියාවලියකි.

4.3 ශ්‍රී ලංකා රේගුව - සංඛ්‍යාලේඛන අංශය

රේගු සංඛ්‍යාති

ශ්‍රී ලංකා රේගුවේ ස්වයංක්‍රීය දත්ත සැකසුම් අංශයෙන් පරිගණක ගත කරන ලද ආනයන/අපනයන සම්බන්ධ දත්ත දිනපතාම ලබා ගැනීමත් බාහිර වෙළඳ සංඛ්‍යාති වලට අදාල තොරතුරු සකස් කිරීමත් ආනයන/අපනයන හා ප්‍රති අපනයන ලෙස දත්ත වෙන්කර ගොනු සකස් කිරීමත් දෝෂ සහිත දත්ත නිවැරදි කරමින් මාසික දෝෂ රහිත පරිගණක දත්ත ගොනු සකස් කිරීම හා සංඛ්‍යාන දත්ත අලෙවි අංශය කාර්යක්ෂමව පවත්වාගෙන යාමත් වගකීම් දරන ප්‍රධාන ක්ෂේත්‍ර වේ. බාහිර වෙළඳ සංඛ්‍යාති අදාල මාසය අවසන්ව දින 15 ක කාලය තුලදී මාසිකව සකස් කර ශ්‍රී ලංකා මහ බැංකුවට,මහ භාණ්ඩාගාරයට, ජාතික ගිණුම් සකස් කිරීම සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට,විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලට ,දේශීය හා විදේශීය ආයතන වලට, තානාපති කාර්යාල වලට හා පර්යේෂකයන්ට නිකුත් කර ඇත.

4.4 සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය - සංඛ්‍යාලේඛන අංශය

වෛද්‍ය සංඛ්‍යාති

I. ආයතන රාමුව යාවත්කාලීන කිරීම

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල 26 ට හා අමාත්‍යාංශය වෙත පසුගිය වසරෙහි ආයතන ලැයිස්තුව ලබා දී 2018 වර්ෂය සඳහා අදාල ආයතන ලැයිස්තුව යාවත්කාලීන කරන ලදි.

II. දත්ත රැස් කිරීම, පරිසනකගත කිරීම, විශ්ලේෂණය කිරීම හා ප්‍රකාශයට පත් කිරීම

- දත්ත රැස් කිරීම

- වෛද්‍ය සංඛ්‍යාලේඛන අංශය මඟින් රට පුරා විසිරී ඇති රජයේ රෝහල් පද්ධතියේ, අභ්‍යන්තර රෝගී හා මරණ, රෝගී ඇඳන්, සායන, බාහිර රෝගීන්, මාතෘ හා ළමා, මානව සම්පත්, විශේෂඥ වෛද්‍යවරුන් හා දන්ත වෛද්‍ය සේවා යන ක්ෂේත්‍රයන් පිළිබඳව දත්ත රැස් කරන අතර අදාල ආකෘති පත්‍ර එම ආයතන වෙත නිකුත් කර, සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍ර නියමිත කාලයේදී ලබා ගනී. 2018 හි අවසාන කාර්තුවට අදාලව අභ්‍යන්තර රෝගීන් පිළිබඳ දත්ත, සායන හා බාහිර රෝගීන් පිළිබඳ දත්ත 2019 ජනවාරි මාසය ඇතුලත ලැබීමට නියමිත අතර, මුළු රෝහල් සංඛ්‍යාවෙන් 75% ක පමණ මාසිකව ලැබෙන මාතෘ හා ළමා සංඛ්‍යාති දත්ත වාර්තා 2018 ඔක්තෝම්බර් මාසය දක්වා අංශය වෙත ලබා දී ඇත. 2018.12.31 ට අදාලව රැස් කරන මානව සම්පත්, විශේෂඥ වෛද්‍ය හා රෝගී ඇඳන් සංඛ්‍යාලේඛන 2019 ජනවාරි මාසය ඇතුලත ලැබීමට නියමිතය. දන්ත වෛද්‍ය සේවා සංඛ්‍යාලේඛන වලට අදාල මාසික වාර්තා මහරගම, මුඛ සෞඛ්‍ය ආයතනය හරහා අංශයට ලැබෙන අතර ඉන් 70% ක් පමණ මේ වන විට ලැබී ඇත.

- දත්ත පරිසනකගත කිරීම හා විශ්ලේෂණය කිරීම

- 2016 හා 2017 වර්ෂයන්ට අදාලව දත්ත පරිසනකගත කිරීම හා දත්ත විශ්ලේෂණය කිරීම අවසන් කර ඇත. 2018 වර්ෂයේ දත්ත වලින්ද 45% ක් පමණ පරිසනකගත කර අවසන් කර ඇත. 2017 වර්ෂයේ දත්ත වෛද්‍ය සේවය පිළිබඳ දත්ත පරිසනකගත කර අවසන් කරන ලද අතර 2018 වර්ෂයේ දත්ත ඇතුලත් කරමින් පවතී.

➢ දත්ත ප්‍රකාශයට පත් කිරීම

- 2018 වර්ෂයේදී 2016 හා 2017 වාර්ෂික සෞඛ්‍ය සංග්‍රහයන් සකස් කිරීම අංශයේ ඉලක්කය විය.

- 2016 වර්ෂයට අදාල වාර්ෂික සෞඛ්‍ය සංඛ්‍යාලේඛන වාර්තාවේ වැඩ කටයුතු අවසන් කර සෞඛ්‍ය අමාත්‍යාංශ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදි.


- 2017 වාර්ෂික සෞඛ්‍ය සංග්‍රහය සඳහා අවශ්‍ය ලිපි අදාල අංශවලින් එකතු කර ප්‍රකාශයට සුදුසු පරිදි සකස් කරමින් පවතී.

III. 2016 වාර්ෂික සෞඛ්‍ය සංග්‍රහය ප්‍රතිසංවිධානය කිරීමට සහය වීම

සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් 2016 වාර්ෂික සෞඛ්‍ය සංග්‍රහය ප්‍රතිසංවිධානය කිරීම සඳහා වැඩ පිළිවෙලක් ආරම්භ කරන ලද අතර ඒ සඳහා වෛද්‍ය සංඛ්‍යාලේඛන අංශයේ සක්‍රීය දායකත්වය ලබා දෙන ලදි. මේ වන විට එහි වැඩ කටයුතු අවසන් කර ඇති අතර එය සෞඛ්‍ය අමාත්‍යාංශ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇත.

IV. eIMMR අභ්‍යන්තර රෝගීන් පිළිබඳ වාර්තා මෘදු පිටපතක් ලෙස ලබා ගැනීම, පද්ධතිය වැඩි දියුණු කිරීම හා තව දුරටත් ව්‍යාප්ත කිරීම

- 2010 වර්ෂයේදී හඳුන්වා දුන් eIMMR ව්‍යාපෘතිය 2012 වර්ෂයේදී රෝහල්වල ස්ථාපනය කිරීම ආරම්භ කළ අතර 2013 වර්ෂයේදී රෝහල් 98 ක සාර්ථකව ස්ථාපනය කිරීමට හැකි විය. එමෙන්ම 2014 වර්ෂයේදී අළුතින් රෝහල් 75 ක්ද, 2015 වර්ෂයේදී අළුතින් රෝහල් 127 ක්ද, 2016 වර්ෂයේදී අළුතින් රෝහල් 124 ක්ද, 2017 වර්ෂයේදී අළුතින් රෝහල් 65 ක්ද , 2018 වර්ෂයේදී අළුතින් රෝහල් 24 ක්ද ඇතුලත් වූ අතර දැනට මෙම ව්‍යාපෘතිය රට පුරා රෝහල් 513 ක ක්‍රියාත්මක වේ.



V. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයන්ට අයත් ග්‍රා.නි. කොට්ඨාශ ලැයිස්තුව යාවත්කාලීන කිරීම සහ සෞ. වෛ. නි. කාර්යාල මට්ටමින් ජනගහන ඇස්තමේන්තු සකස් කිරීම.

2018 වර්ෂය සඳහා සෞ. වෛ. නි. කාර්යාල මට්ටමින් ජනගහන ඇස්තමේන්තු සකස් කර ප්‍රකාශයට පත් කරන ලදි. මේ සඳහා ජන හා නිවාස සංගණනය - 2012 හි අවසාන වාර්තාවෙහි ග්‍රා. නි. කොට්ඨාශ ජනගහනය පාදක කර ගනු ලැබීය. 2019 ජනගහන ඇස්තමේන්තුව පිළියෙළ කිරීමට අවශ්‍ය සෞ.වෛ.නි. කාර්යාල ලැයිස්තුව යාවත්කාලීන කිරීමේ කටයුතු මේ වන විට කර ගෙන යනු ලැබේ.

VI. වෛද්‍ය සංඛ්‍යාලේඛන අංශය මඟින් ඉටු කරන ලද අමතර රාජකාරී කටයුතු

- 2018 වර්ෂයේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල 26 හිම eIMMR පද්ධතිය සම්බන්ධ පුහුණු වැඩසටහන් පවත්වන ලදි.
- කැළණිය හා පේරාදෙණිය විශ්ව විද්‍යාල වල වෛද්‍ය පීඨ සිසුන්, වෛද්‍ය සංඛ්‍යාලේඛන පිළිබඳව දැනුවත් කිරීම සඳහා දේශන පවත්වන ලදි.
- එමෙන්ම සෞඛ්‍ය දත්ත භාවිත කරන්නන්ගේ දත්ත ඉල්ලීම් සඳහා ඉතා ඉක්මණින් දත්ත නිකුත් කරන ලදි.
- දේශීය වෛද්‍ය අංශයේ රෝහල් වල රෝග විනිශ්චයන් දැනට භාවිත කරන ICD – 10 (International Classification of Diseases) රෝග වර්ගීකරණය සමග ගැළපීමට ක්‍රමවේදයක් සැකසීම සඳහා සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ, දේශීය වෛද්‍ය අංශය සමග සාකච්ඡා ආරම්භ කරන ලදි.
- කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටි යුධ හමුදා රෝහලේ හා පොලිස් රෝහලේ අභ්‍යන්තර රෝගී හා මරණ දත්ත ඇතුළු අනෙකුත් දත්ත වෛද්‍ය සංඛ්‍යාලේඛන අංශය වෙත ලැබෙන අතර දිවයිනේ අනෙකුත් ප්‍රදේශවල පිහිටා ඇති යුධ, ගුවන්, නාවික හමුදා රෝහල් වලින් මේ දක්වා අප අංශය වෙත දත්ත නොලැබුනි. 2018 වර්ෂය තුළදී එම රෝහල් වල අදාල නිලධාරීන් හට ICD - 10 පුහුණුව ලබා දීමට කටයුතු කළ අතර මේ වන විට එම රෝහල් වල දත්ත වෛද්‍ය සංඛ්‍යාලේඛන අංශය වෙත ලැබේ.
- රජයේ රෝහල් වල දත්ත වලට අමතරව, පෞද්ගලික අංශයේ රෝහල් වල අභ්‍යන්තර රෝගී හා මරණ දත්ත eIMMR දත්ත පද්ධතියට ඇතුළත් කිරීම සඳහා වැඩපිළිවෙලක් ආරම්භ කරන ලදි.

4.5 රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව - ජීව සංඛ්‍යාලේඛන අංශය

ජීව සංඛ්‍යාති


I. උපත් විවාහ හා මරණ සංඛ්‍යාති

ශ්‍රී ලංකාවේ වාර්ෂිකව ලියාපදිංචි කරනු ලබන උපත්,විවාහ හා මරණ සංඛ්‍යාව සහ ඊට අදාළ ප්‍රජා විද්‍යාත්මක තොරතුරු සහ මරණයට හේතු රැස් කිරීම,කේත කිරීම,පරිගණක ගත කිරීම,සංස්කරණය කිරීම,වගුගත කිරීම හා ප්‍රකාශයට පත් කිරීම වසර පුරාම සිදු කෙරේ

- 2017 සහ 2018 වසර වලට අදාළ දත්ත මේ වන විට ලැබෙමින් පවතී.
- 2014, 2015 වසර සඳහා උපත් හා මරණ වලට අදාළ අවසන් දත්ත වගු සකස් කර ඇත.
- 2016 වසර සඳහා උපත්, මරණ වලට අදාළ දත්ත ගොනු සකස් කර නිම කර ඇත.
- 2012,2014 වසර සඳහා මරණයට හේතු අවසන් දත්ත ප්‍රකාශයට පත් කර ඇත.
- 2015 වසර සඳහා මරණයට හේතු කේත කිරීම හා පරිගණක ගත කිරීම සිදු කරමින් පවති.

II. **මධ්‍ය වාර්ෂික ජනගහනය 2018**

2018 සඳහා වයස් කාණ්ඩ හා දිස්ත්‍රික් අනුව මධ්‍ය වාර්ෂික ජනගහන ඇස්තමේන්තු සකස් කොට දත්ත භාවිත කරන්නන් හට ලබාදී ඇත.


Statistics of Vital Statistics
Registrar General's Department

III. ජීව සංඛ්‍යාති සංක්ෂිප්ත වාර්තාව සකස් කිරීම

2017 වසරට අදාල ජීව දත්ත ඇතුලත් කර ජීව සංඛ්‍යාති සංක්ෂිප්ත වාර්තාව සකස් කර එය සංඛ්‍යාලේඛන වෙබ් අඩවියේ පල කරන ලදී.

IV. දත්ත හා තොරතුරු ලබා දීම

සෞඛ්‍යය අමාත්‍යාංශය,ශ්‍රී ලංකා මහ බැංකුව,ලෝක සෞඛ්‍යය සංවිධානය ඇතුළු දේශීය මෙන්ම ජාත්‍යන්තර ආයතන හා පුද්ගලයන් විසින් කරනු ලබන දත්ත ඉල්ලීම් සඳහා දත්ත හා තොරතුරු ලබා දී ඇත.

V. දෙවන සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ නිම කරන ලද කාර්යයන්

- **මරණයට හේතු දත්ත කේත කිරීම පිළිබඳ වෛද්‍යවරුන් සඳහා උපදෙස් ග්‍රන්ථයක් මුද්‍රණය කිරීම**



සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහයෝගය සහ උපදේශනය යටතේ මරණයට හේතු දත්ත කේත කිරීම පිළිබඳ වෛද්‍යවරුන් සඳහා උපදෙස් ග්‍රන්ථයක් සකස් කර එම ග්‍රන්ථ 20,000 ක් මුද්‍රණය කරන ලදී.

- **රෙජිස්ට්‍රාර්/අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් සඳහා දිස්ත්‍රික්ක 25 හි පුහුණු පංති පැවැත්වීම**

රෙජිස්ට්‍රාර්/අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් සඳහා සිවිල් ලියාපදිංචිය හා ජීව සංඛ්‍යාලේඛන එක් රැස් කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් දිස්ත්‍රික්ක 18ක නිම කරන ලදී.

- **රෙජිස්ට්‍රාර්/අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් සඳහා උපදෙස් ග්‍රන්ථයක් සකස් කිරීම**



මෙම පුහුණු පංති වලදී රෙජිස්ට්‍රාර්/අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් සඳහා සිවිල් ලියාපදිංචිය හා ජීව සංඛ්‍යාලේඛන එක් රැස් කිරීම පිළිබඳ උපදෙස් ග්‍රන්ථයක් සකස් කර ලබා දෙන ලදී.

- **ජීව සංඛ්‍යාති ඇතුලත් වාර්තාව 2008-2017**

ජීව සංඛ්‍යාති ඇතුලත් Vital statistics Report- 2008-2017 පිටපත් 1000ක් මුද්‍රණය කර ප්‍රකාශයට පත් කරන ලදී.

- **පරිගණක හා අනෙකුත් ඉලෙක්ට්‍රොනික උපාංග ලබා ගැනීම**

මිලියන 2.2 කට ආසන්න වටිනාකමකින් යුත් පරිගණක හා ඉලෙක්ට්‍රොනික උපාංග රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවට ලබා දුන් අතර ඉන් කිහිපයක් ජීව සංඛ්‍යාලේඛන අංශයට ද ලැබුණි.

4.6 කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය - සංඛ්‍යාලේඛන අංශය

ධීවර සංඛ්‍යාති

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ සංඛ්‍යාලේඛන අංශයේ වාර් ෂික වැඩ සැලැස්ම අනුව එහි ප්‍රධාන කාර් ය ලෙස ධීවර නිලධාරීන් හරහා ක්ෂේත්‍රයෙන් ලබා ගන්නා දත්ත පාදක කර ගනිමින් කරදිය හා මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඇස්තමේන්තු කර මාසික මත්ස්‍ය නිෂ්පාදන වාර්තා පිළියෙළ කර ඇත.

රේගු දෙපාර්තමේන්තුව හරහා ලබා ගන්නා මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන ආනයන හා අපනයන දත්ත පාදක කරගනිමින් මාසික මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන ආනයන හා අපනයන වාර්තා සාර්ථකව පිළියෙළ කර ඇත. මෙම දත්ත යුරෝපා හවුල විසින් මත්ස්‍ය අපනයන තහනම ඉවත් කිරීමෙන් පසුව මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන අපනයනයේ

ඇතිවූ වර්ධනය මැන බැලීම සඳහා මෙන්ම විශේෂ වෙළඳ බදු මුදල් වල ඇති වූ වෙනස් වීම මත්ස්‍ය ආනයනය කෙරෙහි බලපා ඇති ආකාරය මැන බැලීම සඳහා උපයෝගී කර ගන්නා ලදී.

සතිපතා මසුන් සහ කරවල මිල ගණන් රැස් කිරීමේ වැඩ සටහන මෙම වසර පුරාද සාර්ථකව පවත්වන ලද අතර සතිපතා මසුන් මිල ගණන් වාර්තා සකස් කර ඇත. එසේම මෙම මිල ගණන් ජීවන වියදම් කමිටුවේ නිවැරදි තීරණ සඳහා පාදක කරගෙන ඇත.

2018 වාර්ෂික ධීවර සංඛ්‍යාලේඛන වාර්තාව සකස්කර අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළකර ඇත.

ජාතික අවශ්‍යතාවයන් සඳහා ධීවර සංඛ්‍යාලේඛන සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (කෘෂිකර්ම දත්ත, ආහාර ශේෂ පත්‍රය, වාර්ෂික සංඛ්‍යාලේඛන නිබන්ධනය, සංඛ්‍යාලේඛන අත්පොත, ජාතික ගිණුම්), ශ්‍රී ලංකා මහ බැංකුව වැනි ආයතන වෙත ලබා දී ඇත. වාර්ෂික ධීවර දත්ත FAO සහ කලාපීය ධීවර කළමනාකරණ සංවිධානය වන ඉන්දියානු සාගර ටූනා කොමිසම(IOTC) වෙත වාර්තා කර ඇත.

ධීවර දෙපාර්තමේන්තුව සහ නාරා ආයතනයේ සහයෝගය සහ නෝර්වේ උපදේශකත්වය යටතේ විශාල සමුද්‍රික මත්ස්‍ය නිෂ්පාදන සමීක්ෂණය ඒ යටතේ සමස්ත සමුද්‍රික අංශයම ආවරණය වන පරිදි වැඩි දියුණු කිරීමේ කටයුතු සිදුවෙමින් පවති. මූලික කටයුතු යටතේ ධීවර නිලධාරින් ගේ සහය ඇතිව සමීක්ෂණ රාමුව සකස් කර සාමූහික ප්‍රයත්නයක් ලෙස නියැදිය තෝරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවති.

අයිස් යන්ත්‍රාගාර සහ ශීතාගාර 2017/2018 සමීක්ෂණ රාමුව යාවත්කාලීන කර මූලික තොරතුරු රැස්කර ඇත.

කොළඹ තදාසන්න ප්‍රදේශ වල වෙළඳපළවල් ආවරණය වන පරිදි මිල ගණන් රැස් කරමින් ටින් මාලු වෙළඳපළ සමීක්ෂණය සමීක්ෂණය පවත්වන ලද අතර දේශීය ටින් මාලු නිෂ්පාදන තොර්තුරු නිෂ්පාදන සමාගම් හරහා රැස්කර ඇත.

අනුමත සංඛ්‍යාලේඛන නිලධාරින් සිව් දෙනා අතුරින් දෙදෙනෙකුගේ තනතුරු පුරප්පාඩු වී පැවතීම හේතුවෙන් 2018 වසර සඳහා අනුමත මෙම අංශයේ වැඩ සැලැස්ම ක්‍රියාත්මක කිරීමට ඇතැම් අවස්ථාවල බාධා ඇතිවිය.